2023

# වාර්ෂික කාර්යසාධන වාර්තාව

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය

# කාර්යසාධන වාර්තාව-2023

## රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

අමාත්‍යාංශයේ වැය ශීර්ෂය වන 130 ට අදාළ සමස්ත මූල්‍ය වාර්තාව රාජ්‍ය පරිපාලන අංශයෙහි පිටු අංක **22-29** යටතේ ඇතුළත් කර ඇති අතර විගණන වාර්තාව අවසානයෙහි අමුණා ඇත.

| | රාජ්‍ය පරිපාලන අංශය | ස්වදේශ කටයුතු අංශය | පළාත් සභා හා පළාත් පාලන අංශය |
|---|---|---|---|
| | නිදහස් චතුරස්‍රය<br>කොළඹ 07<br>ශ්‍රී ලංකාව | “නිල මැදුර”<br>ඇල්විටිගල මාවත<br>නාරාහේන්පිට<br>කොළඹ 05<br>ශ්‍රී ලංකාව | අංක 330<br>ආචාර්ය ද කොල්වින් ආර්.ද සිල්වා මාවත<br>(යූනියන් පෙදෙස)<br>කොළඹ 02<br>ශ්‍රී ලංකාව |
| | 011-2696211/13,<br>011- 2166000 | 011 - 2050450 | 011 – 2 305326 / 327,<br>2303280 |
| | 011–2695279 | 011 - 2551071 | 011 - 2 699 720 |
| | information@pubad.gov.lk | info@moha.gov.lk | info@pclg.gov.lk |
| | www.pubad.gov.lk | www.moha.gov.lk | www.mpclg.gov.lk |

## රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ගරු අමාත්‍යතුමාගේ සුභාශිංසනය



රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය දැවැන්ත වපසරියකට විහිදී ගිය අමාත්‍යාංශයකි. මහජන මෙහෙවර පහසුව උදෙසා රේඛීය අමාත්‍යාංශය යටතේ, ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය, පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශය ලෙසින් රාජ්‍ය අමාත්‍යාංශ දෙක ද ඒ තුළ ගාමකව කටයුතු කරයි. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය, රාජ්‍ය භාෂා කොමිෂම, භාෂා අධ්‍යාපන හා පුහුණුව පිළිබඳ ජාතික ආයතනය, මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව, දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානය සහ රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථසාධක සංගමය යන ආයතන පසුගිය වසර පුරා සිය සේවා වගකීම් උපරිම මට්ටමෙන් ඉටුකිරීමෙහිලා දැක්වූ දායකත්වය ඉතා වැදගත්ය.

ග්‍රාමීය පුනර්ජීවන හා ආහාර සුරක්ෂිතාවය සඳහා වන ඒකාබද්ධ බහු ආංශික වැඩසටහන සාර්ථක ව ක්‍රියාත්මක කිරීමට දායකවෙමින් මේ අභියෝගාත්මක මොහොතේ අමාත්‍යාංශය ස්වකීය වගකීම් රාමුවෙන් එහා ගොස් මෙහෙවරක් ඉටුකල බව සඳහන් කරනු වටී. ග්‍රාමීය වැඩපිළිවෙළයන් ක්‍රියාත්මක කිරීමේදී මතු වූ පරිපාලන ගැටළු තුළ පුරප්පාඩු ග්‍රාම නිලධාරී තනතුරු පිරවීම සඳහා මේ වන විටත් විභාග හරහා වන මූලික කටයුතු අවසන් කර ඇත.

බහුකාර්ය සාධන බලකාය ස්ථිර සේවකයින් බවට පත් කිරීමටත්, විශ්‍රාම වැටුප් ගෙවීම් ප්‍රගතිය ඉහළට ගෙන එමින් විශ්‍රාමිකයින් 55091කට පාරිතෝෂික ලෙස රුපියල් බිලියන 65ක් ගෙවීමටත් නව විශ්‍රමිකයින් 39539ක් සක්‍රීය කිරීමටත් හැකිවිය.

කුමන අභියෝග පැවතියද අඛණ්ඩ හා ගුණාත්මක රාජ්‍ය සේවාවක් පවත්වාගෙන යාම වෙනුවෙන් වන උසස්වීම් ක්‍රමවේදය ගෙවුණු 2023 වසර තුළදී ද අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ අතර ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් ක්‍රියාත්මක ධාරිතා සංවර්ධන වැඩසටහන් හි කැපී පෙනෙන වර්ධනයක්ද පෙන්නුම් කරන ලදී. රාජ්‍ය සේවකයන් සඳහා දේශීය මෙන්ම විදේශීය රැකියා අවස්ථා වලට යාමේ අවස්ථාව සලසා දීම ද විශේෂ ය. එසේම ප්‍රාදේශීය පාලනය ශක්තිමත් කිරීම සඳහා වන්නාවූ විවිධ වැඩසටහන් මෙන්ම පළාත් පාලන ක්ෂේත්‍රයේ උන්නතිය සඳහා වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමද අඛණ්ඩව සිදුකරන ලද වසරක් ලෙස ගෙවුණු වසර හඳුන්වා දිය හැක.

ආර්ථික අර්බුදයට මුහුණ දී සිටින අවස්ථාවක, පියවරෙන් පියවර ජන ජීවිතය යථාවත් කිරීමට දැරූ මූලික ප්‍රයත්නයන් සාර්ථක කරගත් වසරක් ලෙස 2023 වර්ෂය හඳුන්වා දිය හැකිය. රජයක් ලෙස අතිශය තීරණාත්මක තීන්දු ගනු ලැබූ අතර එකී තීරණයන්හී යහපත් ප්‍රතිඵල අද වන විට රටක් ලෙස අපි අත් විඳිමින් සිටිමු.

මෙම කාර්යයෙහි කැපවී ක්‍රියාත්මක රාජ්‍ය අමාත්‍යවරුන්, ලේකම්වරයා ප්‍රධාන නිලධාරීන් හා සමස්ථ ආයතනික කාර්ය මණ්ඩලය අගයමි.

දිනේෂ් ගුණවර්ධන(පා.ම),
අග්‍රාමාත්‍ය,
රාජ්‍ය පරිපාලන , ස්වදේශ කටයුතු , පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය

## ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමාගේ පණිවුඩය



ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය ලෙස 2021.02.16 දින සිට ක්‍රියාත්මක වූ මෙම අමාත්‍යාංශය 2022 මැයි මස 27 දින සිට රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ස්වදේශ කටයුතු අංශය වශයෙන් කාර්යභාරය ඉටුකරනු ලබයි.

රජයේ නව ව්‍යවස්ථා සංශෝධනය අනුව දිස්ත්‍රික් හා ප්‍රාදේශිය පාලනය වඩාත් කාර්යක්ෂම හා ඵලදායිව ක්‍රියාත්මක කිරිමේ ප්‍රායෝගික සැලසුම් සකස් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට අදාල ප්‍රධානතම වගකීම මෙම අමාත්‍යාංශය වෙත පැවරී ඇත. ඒ අනුව මෙම අමාත්‍යාංශය ජාතික මට්ටමේ සිට ග්‍රාමීය මට්ටම දක්වා යටිතල පහසුකම් සංවර්ධනය, මානව සම්පත් ධාරිතාවය ශක්තිමත් කිරීම, තාක්ෂණික මෙවලම් ලබාදීම වැනි කාර්යයන් මනාව කළමනාකරණය කරමින් කාර්යක්ෂමව සහ ඵලදායීව මහජන සේවාවන් ලබාදීමේදී 2023 වර්ෂය තුළ ලඟාකර ගත් කාර්යසාධනය පිළිබඳ මෙම වාර්තාව තුලින් ඉදිරිපත් කරනු ලබයි.

අප රජය බලයට පැමිණීමට පෙර සිටම ජනතාවගේ ඉල්ලීම මෙන්ම අභිලාශය වූයේ ද මනා විනිවිදභාවයකින් යුතු රාජ්‍ය පාලනයකි. ඒ සඳහා රාජ්‍ය සේවකයාගේ වගකීම ඉතා වැදගත් වේ. ඒ අනුව, වගකීමෙන් හා වගවීමෙන් යුතුව සක්‍රීය පාලනයකින් යුත් රටක් නිර්මාණය කිරීමට මෙම අංශය මඟින් නියාමනය කරන ලද රාජ්‍ය සේවක යාන්ත්‍රණය තුළ ළඟාකරගත් කාර්යසාධනය ඉතාමත් වැදගත් තැනක් උසුලයි. ජාත්‍යන්තර වශයෙන් පවතින ආර්ථීක අර්බුදයට මුහුණ දෙමින්, රටක් ලෙස එයට අනුගත වෙමින් එවකට පැවති රාජ්‍ය අමාත්‍යාංශය විසින් වෙන් කරන ලද මූල්‍ය සීමාවන් තුළ ආර්ථීක ස්ථාවරභාවයක් සමඟ ඉහළ සංවර්ධන ප්‍රගතියක් සහ කාර්යසාධනයක් සාක්ෂාත් කරගැනීමට සමත් වීම සතුටට කරුණකි.

ජාතික හා දිස්ත්‍රික් මට්ටමෙන් ඉටුකරනු ලබන ඒකාබද්ධ කාර්යභාරයට අදාලව සාමූහිකව රාජකාරි ඉටුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස මෙම වාර්තාව ඉදිරිපත් කිරීමට කැමැත්තෙමි. එසේම මේ පිළිබඳව විශ්ලේෂණාත්මකව බැලීමේදී අදාල කාලය තුල ලබාගෙන ඇති කාර්යසාධනය ජනතා ජයග්‍රහණයක් ලෙස පෙන්වාදෙන්නේ සතුටිනි. පසුගිය වසර තුලදී මෙන්ම ඉදිරි වර්ෂවලදී ද විශිෂ්ට ප්‍රගතියක් ලබා ගනිමින් අනාගතය තුළ ශ්‍රී ලාංකික ජනතාවට තම ජීවිකාව සරිකර ගැනිමේදි මුහුණ දී තිබෙන අභියෝගයන් ජයගනිමින් සෞභාග්‍යමත් දේශයක් ගොඩනංවා ගැනීමට සැමගේ අවධානය යොමු කළයුතු බව ද මේ අවස්ථාවේ සිහිපත් කරන්නට කැමැත්තෙමි.

**අශෝක ප්‍රියන්ත (පා.ම.)**
**ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍ය**

# පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමන්ගේ පණිවුඩය



පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යවරයා වශයෙන්, මෙම ප්‍රකාශනය සඳහා පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම අගයකොට සලකමි.

පළාත් සභා සඳහා මහජන නියෝජිත සම්බන්ධතාවයක් නොමැති වකවානුවක, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් විෂයභාර රාජ්‍ය අමාත්‍යවරයා ලෙස යම් මැදිහත්වීමක් සිදුකිරීමට හැකිවීම හිටපු පළාත් සභා මන්ත්‍රීවරයෙකු, අමාත්‍යවරයෙකු වූ , මා ලැබූ විශේෂ අවස්ථාවක් ලෙස දකිමි.

ඒ අනුව, ගරු අග්‍රාමාත්‍යතුමාගේ අනුදැනුම මත පළාත් සභා ආණ්ඩුකාරවරුන් හා ප්‍රධාන ලේකම්වරුන් සමග ඍජු ලෙසම සම්බන්ධ වෙමින්, ඔවුන් මුහුණ දෙන ගැටළු හඳුනාගනිමින්, ඒවාට විසඳුම් සොයමින්, ඉදිරි ක්‍රියාමාර්ග සඳහා යොමු වීමට මාහට අවස්ථාව උදා වී තිබේ. මෙහිදී, පළාත් සභාව නියෝජනය කොට, මා ලැබූ අත්දැකීම බෙහෙවින් ඉවහල්වන බව කිවයුතුව ඇත.

එමෙන්ම, පළාත් පාලන මහජන නියෝජිතයෙකු වශයෙන්, රත්නපුර දිස්ත්‍රික්කයේ නිවිතිගල ප්‍රාදේශීය සභාවේ උප සභාපති වශයෙන් විවිධ අභියෝග ජයගනිමින් ජනතා මෙහෙවර ඉටු කළ පරිදි, පළාත් පාලන විෂයය අතැඹුලක්සේ දැන හැඳිනගෙන, ගතවූ වසර තුළ පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශය මනා ලෙස මෙහෙයවීමට හැකිවීම සතුටට කරුණකි.

ගතවූ වසර තුළ නව ව්‍යාපෘති ක්‍රියාත්මක කළ නොහැකි වුවද , ගරු ජනාධිපතිතුමා හා අගමැතිතුමා ලබා දුන් සහයෝගය මත හිඟව තිබූ සියලු බිල්පත් ගෙවා දැමීමට හැකිවීමද එක් අතකින් ජයග්‍රහණයකි. මන්දයත්, මෙම වසර අග වන විට මිලියන 55ක පමණ සුළු මුදලකින් හෝ පළාත් පාලන ආයතන බල ප්‍රදේශ රැසක අත්හිටුවා තිබූ පුස්තකාල ගොඩනැගිලි, ප්‍රජා ශාලාවන්හි ඉතිරි වැඩ නිමකිරීමට හැකි වන්නේ එකී හිඟ බිල්පත් ගෙවා දැමීමෙන් ලද අස්වැසිල්ල නිසාය.

පළාත් පාලන ආයතන කිහිපයක සුසානාගාර හා පොදු වැසිකිළි පද්ධති ඉදිකිරීම සඳහා මූල්‍යමය ප්‍රතිපාදන ලබා දීමට හැකි වී ඇති අතර “ ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය“ නව ජවයකින් යුතුව ක්‍රියාත්මක කිරීමට හැකි වී තිබීම යම් ආශ්වාදයක් ගෙන දෙන්නකි. නිවැරදි විද්වත් උපදෙස්, මෙහෙයකාරී ඉංජිනේරු ක්‍රියා මාර්ග හා සුදුසු පරිපාලනමය තත්වය මත අලුතින් යකඩ පාලම් 160ක් ඉදිකිරීමට විදේශාධාර ලැබෙන අතර, එමගින් පාලම් 47ක වැඩ ආරම්භ කර තිබේ. එයින් පාලම් 26ක දෙපස බැම් ඉදිකිරීම් කටයුතු අවසන් කොට “යකඩ පාලම්” සවිකිරීමට සියලු කටයුතු සූදානමින් සිටින නමුත් මේ වන විට පවතින අධික වර්ෂාව එයට බාධාවක් වී තිබේ. එහෙත් අධික වර්ෂාව පහව ගිය විගස එම කටයුතුද අවසන් කෙරෙනු ඇත.

අපහට පාලනය කළ නොහැකි හේතූන් රාශියක් මත අයහපත්වූ මෙරට ආර්ථික තත්වය යහපත් වෙමින් පවතින අවස්ථාවක, මෙවර අයවැයෙන්, ලබන වසර සඳහා අපගේ අමාත්‍යාංශය වෙනුවෙන් සැලකිය යුතු මුදලක් ලැබෙනු ඇතැයි යන විශ්වාසය මත 2024 වර්ෂය තුළ පළාත් පාලන ආයතන මගින් සැලකිය යුතු වැඩ කොටසක් සිදුකළ හැකි වෙතැයි යන්න අපගේ අපේක්ෂාවයි.

මේවන විට පළාත් පාලන ආයතනද මහජන නියෝජිතයින්ගෙන් තොරව පවත්වා ගෙන යනු ලැබුවද, ඒ වෙත පැවරෙන දෛනික සේවා කටයුතු නිසිලෙස පවත්වාගත හැකිව තිබීමද අගය කළ යුතුය. මෙම ආයතන දැනට පාලනය කරනු ලබන නිලධාරීන් පිරිසකට පළාත් පාලනය පිළිබඳව ශ්‍රී ලංකා ආයතනය මගින් නිසි අධ්‍යාපනයක් ලබා දීමට හැකිවීමද තවත් සතුටුවිය හැකි අවස්ථාවකි.

පළාත් පාලන ආයතන තව තවත් කාර්යක්ෂම කිරීම පිණිස ගනු ලබන තාක්ෂණික පියවර කිහිපයක් වෙනුවෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර, ඒ අනුව ඉදිරි පියවර ගැනීමට අප සූදානමින් සිටින්නෙමු.

**ජානක වක්කුඹුර**
***පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍ය***

**රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්තුමාගේ පණිවුඩය**



දැයට විශිෂ්ඨ රාජ්‍ය සේවයක් සැපයීම පිණිස මානව සම්පත නිසි පරිදි පරිපාලනය,කළමණාකරණය හා ප්‍රතිසංස්කරණය තුළින් විශිෂ්ඨ රාජ්‍ය සේවයකයෙකු බිහි කිරීම මෙම අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යභාරය වේ.ජනතා හිතෛෂී හා තෘප්තිමත් රාජ්‍ය සේවාවක් වෙනුවෙන් කාර්යක්ෂමව පරිපාලන විධිවිධාන හා රෙගුලාසි සැකසීම, මාර්ගෝපදේශ සැපයීම මෙන්ම රාජ්‍ය අංශයේ මූල්‍ය කළමණාකරණය උදෙසා අමාත්‍යාංශය නිරන්තරයෙන් ඇපකැපවෙමින් සියලු රාජ්‍ය සේවාවන්හි පූර්ණ ධාරිතා සංවර්ධනයක් සිදුකරමින් , ජනතාව වෙත උසස් සේවාවක් සහතික කරයි. ගෝලීය ආර්ථික අර්බුද හමුවේ පෙර නොවූ විරූ අභියෝග රැසකට ශ්‍රී ලංකාවට මුහුණ දීමට සිදුවුවත්, 2023 වසරේ දී ඒ සියලු අභියෝග සඳහා සාර්ථකව මුහුණ දෙමින් තිරසර ආර්ථිකයක් කරා යන ගමනේදී රාජ්‍ය ප්‍රතිපත්ති හා සමගාමීව රාජ්‍ය මූල්‍ය ස්ථායිතාව නැවත ප්‍රතිස්ථාපනය සඳහා වන ආර්ථික ප්‍රතිසංස්කරණ හා වියදම් කළමණාකරණ ක්‍රියාවලියේදී මෙම අමාත්‍යාංශය සුවිශාල මෙහෙවරක් සිදු කරනු ලබයි.

ඒ අනුව රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩසටහන් යටතේ පළාත් පාලන ආයතන වල සංවර්ධන ව්‍යාපෘති, ග්‍රාමීය භෞතික යටිතල පහසුකම් හා සමාජ යටිතල පහසුකම් සංවර්ධනයට අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ විශ්‍රාම වැටුප් අඛණ්ඩව ගෙවීම, ඔවුන්ගේ ආර්ථික හා සුබසාධනය වැඩිදියුණු කිරීම, පාර්ලිමේන්තුව සම්බන්ධව හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ කටයුතු වලට අදාළව රජය විසින් ඉටුකළ යුතු කාර්යයන් ඉටුකිරීම, දිස්ත්‍රික් ලේකම් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ජනතා සුබසාධනයට අදාළ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම, නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, කරන ලද ප්‍රමුඛතම කාර්යභාරයන්ගෙන් කොටසක් ලෙස සඳහන් කල හැකිය. එසේම 2023 වර්ෂය සඳහා මහා භාණ්ඩාගාරය විසින් වෙන් කරන ලද ප්‍රතිපාදන හා අරමුදල් ඵලදායීව හා කාර්යක්‍ෂම වර්ෂයේ අපේක්ෂිත ඉලක්කයන් සාක්ෂාත් කරගැනීම පිණිස යොදවා ඇති බවද මෙහිදී සඳහන් කිරීමට කැමැත්තෙමි.

මෙම අමාත්‍යාංශයේ ඉහත කාර්යයභාරය සාර්ථකව ඉටු කිරීමට උපදෙස් හා මඟපෙන්වීමක් කරන ලද ගරු අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමාටත්, රාජ්‍ය අමාත්‍යතුමන්ලා දෙපළටත් මාගේ ස්තූතිය මෙහිදී පළකර සිටිමි. එසේම පැවරී ඇති කාර්යභාරය සාර්ථකව හා කාර්යක්‍ෂම ඉටුකිරීමට ඇපකැප වූ අතිරේක ලේකම්වරු, අධ්‍යක්‍ෂ ජනරාල්වරු, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරු, අධ්‍යක්‍ෂවරු, ප්‍රධාන මූල්‍ය නිලධාරීන් ඇතුලු සමස්ත කාර්යමණ්ඩලයටත්, මෙම අමාත්‍යාංශය යටතේ පවත්නා, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා ප්‍රධානීන් ඇතුලු කාර්ය මණ්ඩලවලටත් මාගේ ස්තූතිය පුදකරන අතර ඉදිරි කටයුතු සාර්ථකව ඉටුකරගෙන යාමට ඔබගේ කැපවීම හා දායකත්වය තවදුරටත් අපේක්‍ෂා කරමින් 2023 වර්ෂයේ වාර්ෂික කාර්යය සාධන වාර්තාව හා ගිණුම් වාර්තාවට මාගේ සුභපැතුම් එක් කරමි.

ප්‍රදීප් යසරත්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

# රාජ්‍ය
# පරිපාලන
# අංශය

**පටුන**

පරිච්ඡේද


**1. ආයතන පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය ........ 1**

1.1. හැඳින්වීම ........ 1
1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණ ........ 2
1.3. ප්‍රධාන කාර්යයන් ........ 4
1.4. අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු / ආයතන ........ 4
1.5. සංවිධාන සටහන ........ 5

**2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම ........ 6**

2.1. ඒකාබද්ධ සේවයේ හා දීප ව්‍යාප්ත සේවාවන්හි බඳවාගැනීම් ........ 6
2.1.1 2023 දෙසැම්බර් 31 වන දිනට දීප ව්‍යාප්ත සේවයේ නිලධාරීන් ........ 7
2.1.2 2023 දෙසැම්බර් 31 වන දිනට ඒකාබද්ධ සේවයේ නිලධාරීන් ........ 8
2.2.අමාත්‍යාංශය මඟින් නිකුත් කරන ලද රාජ්‍ය ප පරිපාලන චක්‍රලේඛ ........ 8
2.3.අමාත්‍යාංශය මඟින් නිකුත් කරන ලද සංශෝධිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ........ 9
2.4 අමාත්‍යාංශය මඟින් නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි ........ 9
2.5. 2023 වර්ෂයේ දී රාජ්‍ය පරිපාලන අංශයේ විවිධ අංශයන් විසින් සිදු කළ සුවිශේෂී කාර්යය භාරයන් ........ 10

**3. වර්ෂය සඳහා සමස්ථ මූල්‍ය කාර්යසාධනය** ........ 22
3.1. මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය ........ 23
3.2. අක්මුදල් ගැලපුම් ගිණුම ........ 24
3.3. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය ........ 24
3.4. මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය ........ 25
3.5. මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් ........ 26
3.6 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය ........ 27
3.7. ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය ........ 28
3.8.මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය ........ 29

**4. කාර්යසාධන දර්ශක ........ 30**

**5. තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය ........ 31**

**6. මානව සම්පත් පැතිකඩ ........ 33**

6.1. මානව සම්පත් සංවර්ධනය ........ 33
6.3. සේවක සංඛ්‍යා කළමනාකරණය ........ 42

**7. අනුකූලතා වාර්තාව ........ 49**

## 01 පරිච්ඡේදය- ආයතනික පැතිකඩ

### 1.1.හැඳින්වීම

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ආරම්භයේ පටන් වර්තමානය දක්වා සියළු රාජ්‍ය ආයතන හා රාජ්‍ය සේවකයන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් සුපසන් සේවා සම්පාදනයක් උදෙසා ඉමහත් කැපවීමෙන් සහ වගවීමෙන් කටයුතු කරනු ලබන ආයතනයක් වශයෙන් ඉතිහාසයේ වසර 84 ක තරම් දුරාතීතයකට විහිද පවතී. මුදල් අමාත්‍යාංශය යටතේ දෙපාර්තමේන්තුවක් ලෙස වර්ෂ 1931 ට පෙර පැවති මෙම අමාත්‍යාංශය වර්ෂ 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ වලින් පසු තේරීපත් වන ආණ්ඩු යටතේ විවිධ වෙනස්කම් වලට ලක්වෙමින් පැමිණ අද වන විට රාජ්‍ය පරිපාලනයේ විශිෂ්ඨ මෙහෙවරක නියැලෙමින් සිටී.

වර්ෂ 2022 ක් වූ ජූලි මස 22 වන දින සිට රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය නමින් ගරු අග්‍රාමාත්‍ය හා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමන්ගේ නායකත්වයෙන් නව අමාත්‍යාංශය ගොඩනැගිණ.

'රාජ්‍ය සේවක මහගෙදර' වන මෙම අමාත්‍යාංශය සියළු රාජ්‍ය සේවකයන් සඳහා අවශ්‍ය මහපෙන්වීම මෙන්ම රාජ්‍ය සේවය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති හා සැලසුම් ගොඩනගමින් මහත් කැපවීමෙන් කටයුතු කරන අතර ඒ සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය වෙත නායකත්වය ලබාදීමේ වගකීම අමාත්‍යාංශ ලේකම් ප්‍රදීප් යසරත්න මැතිඳුන් විසින් නොපිරිහෙලා ඉටු කරනු ලබයි.

මහජනතාවට තෘප්තිමත් රාජ්‍ය සේවාවක් සහතික කිරීම සඳහා සාධාරණත්වය, සමරූපිතාවය හා කාර්යක්ෂමතාවය කෙරෙහි විශේෂයෙන් සැලකිලිමත් වෙමින්, පරිපාලන විධිවිධාන හා රෙගුලාසි සකස් කිරීම මේ අමාත්‍යාංශය සතු මූලික වගකීමකි. ඒ අනුව ආයතන සංග්‍රහය හා අදාළ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ සකස් කිරීම, අවශ්‍ය සංශෝධන සිදු කිරීම මෙන්ම අවශ්‍ය අවස්ථාවලදී ඒ සම්බන්ධ නිරීක්ෂණ ලබා දීම ද අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලබයි. රාජ්‍ය පරිපාලන කටයුතු සම්බන්ධයෙන් ජාතික මට්ටමේ ප්‍රතිපත්ති සම්පාදනය, අර්ථකථනය හා ඒ සම්බන්ධ මාර්ගෝපදේශ සැපයීම මේ අමාත්‍යාංශය වෙතින් ඉටුවන තවත් සුවිශේෂී කාර්යයකි. එමඟින් වඩා ඵලදායී සේවාවක් ලබා දීමට හැකිවන පරිදි සමස්ත රාජ්‍ය සේවයෙහි ම ක්‍රියාකාරීත්වය ගොඩනැගීම හා පාලනය සිදු කරනු ලබයි.

ජාතික සංවර්ධන ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා දීප ව්‍යාප්ත සේවාවන් හා සමස්ත ඒකාබද්ධ සේවාවන්හි පරිපාලන කටයුතු සිදු කරමින් රාජ්‍ය සේවය තුළ මානව සම්පත වඩාත් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම ද මෙම අමාත්‍යාංශයේ මූලික කාර්යභාරයකි.

ඒ අනුව රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 යටතේ සකස් කරන ලද රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ 2023 වාර්ෂික කාර්යසාධන වාර්තාව හා ගිණුම් මෙමගින් ඉදිරිපත් කෙරේ.

## 1.2 දැක්ම, මෙහෙවර, අරමුණු, උපායමාර්ග

**දැක්ම**

දැයට **විශිෂ්ඨ** රාජ්‍ය සේවයක්

**මෙහෙවර**

මානව සම්පත නිසි පරිපාලනය, කළමනාකරණය හා ප්‍රතිසංස්කරණය තුළින් විශිෂ්ඨ රාජ්‍ය සේවයක් තහවුරු කිරීම

**විෂය පථය**

සියළු රාජ්‍ය සේවාවන්හි පූර්ණ ධාරිතා සංවර්ධනයක් සිදු කරමින් නව තොරතුරු තාක්ෂණික ක්‍රමෝපායන් ඔස්සේ කාර්යයන් ද්විකරණය වළක්වාලමින් සේවා දායකයින් වෙත ප්‍රශස්ථ සේවාවන් ලබා දීම හා පළාත් හා ප්‍රාදේශීය මට්ටමින් පවතින අසමානතා අවම කරමින් ජනතාව වෙත උසස් සේවාවක් සහතික කිරීම

**අරමුණු**

- රාජ්‍ය සේවයේ මානව සම්පත් කළමනාකරණ පිළිවෙතට අනුගත වෙමින් බඳවා ගැනීම්, පාරිශ්‍රමික සහ අනෙකුත් සේවා කොන්දේසි පිළිබඳ ඵලදායි රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීම.
- මහජන අවශ්‍යතා සඳහා ප්‍රතිචාර දැක්වීමේදී දැනට රාජ්‍ය සේවයේ සිටින සේවකයින්ගේ සිතුම් පැතුම් සහ ආකල්ප නව මානයක් කරා මෙහෙයවීම.
- රාජ්‍ය සේවයේ ඵලදායිතාව සහ ගුණාත්මක බව ඉහළ නැංවීම සඳහා නව කළමනාකරණ ව්‍යුහ පද්ධතියක් සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- හර පද්ධතියක් ස්ථාපිතකොට බෙදාහදා ගැනීම (ප්‍රතිඵල දිශානත ආකල්ප, වගවීම, සම්පත් ප්‍රඥාවන්ත ලෙස යොදාගැනීම, අපක්ෂපාතිත්වය, පාරදෘශ්‍යබව, ආදී)
- රාජ්‍ය අංශයේ පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම සහ පුහුණු වැඩසටහන් පැවැත්වීමට ඇවැසි පහසුකම් සැපයීම.
- විශ්‍රාම වැටුප්වලට අදාළ ගැටළුවලට පිළියම් යෙදීම සඳහා විශ්‍රාම වැටුප් වැඩසටහන් සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
- රජයේ සංවර්ධන ඉලක්ක සහ ප්‍රමුඛතා සපුරාලීමේ හැකියාව සහිත රාජ්‍ය අංශයේ ආයතනික සංවර්ධනය සඳහා රාමුවක් සකස් කරගැනීම.
- සේවා සැපයුමේ ඵලදායිතාව සහ ගුණාත්මකබව ඉහළ නැංවීම සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය යොදාගැනීම ප්‍රවර්ධනය කිරීම.
- රාජ්‍ය සේවයේ කාර්ය මණ්ඩලයේ නිපුණතාව වැඩි දියුණු කිරීම.
- වෙනස්වෙමින් පවතින තත්ත්වයන්ට අනුව කටයුතු කිරීම පිණිස පද්ධති සරල කිරීම සහ ක්‍රියාදාම යළි සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ වැඩි දියුණු කිරීම, වර්ධනය කිරීම සහ ක්‍රියාවට නැංවීම.

**උපාය මාර්ග**

- රාජ්‍ය සේවයේ කාර්යක්ෂම මනාව සම්පත් කළමනාකරණය සඳහා විචක්ෂණ ප්‍රතිපත්තියක් සහ නියාමන රාමුවක්

- රාජ්‍ය සේවා සැපයුමේදී ඵලදායිතාව ඉහළ නැංවීම පිණිස ක්‍රියාදාම යළි සකස් කිරීම සහ පද්ධති සංවර්ධනය සඳහා වන පරිපාලන ප්‍රතිසංස්කරණය

- රාජ්‍ය සේවය සඳහා තරඟකාරී බඳවාගැනීමේ හා තෝරාගැනීමේ ක්‍රියාදාමයන්

- ඉල්ලුම් දිශානත ධාරිතා සංවර්ධනය සහ නිපුණතා ගැලපුම

- සේවා සැපයුම පුරවැසියන්ට සමීප කිරීම සඳහා විමධ්‍යගත කරනු ලැබූ ආයතනික ජාල
- රාජ්‍ය සේවයේ ගුණාත්මකබව ඉහළ නැංවීම සහ සේවා සැපයුමේ පාරදෘශ්‍යභාවය සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම

- පුරවැසියා කේන්ද්‍ර කරගත් රාජ්‍ය සේවයක් වෙත නැඹුරු වූ සේවා සැපයුමක් ප්‍රමිතිගත කිරීම සඳහා පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් නිර්මාණය කිරීම



## 1.3 රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන්

1. රජය මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "රට වෙනුවෙන් වැඩ සංස්කෘතියක් " ඇති කිරීම පිණිස අදාළ රාජ්‍ය අමාත්‍යාංශ සඳහා ප්‍රතිපත්තිමය මඟපෙන්වීම සිදු කිරීම සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ නටයුතු, පළාත් සභා හා පළාත් පාලන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
2. ශ්‍රී ලංකා පරිපාලන සේවය, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය, ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය, ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය, ශ්‍රී ලංකා තාක්ෂණ සේවය හා ඒකාබද්ධ සේවාවන්හි ආයතනික, පරිපාලන හා පිරිස් කළමනාකරණය.
3. පාර්ලිමේන්තුව සම්බන්ධ හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ කටයුතු වලට අදාළව රජය විසින් ඉටුකළ යුතු කාර්යයන්.

### 1.4 රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු සහ ආයතන

| දෙපාර්තමේන්තු | ආයතන |
|---|---|
| බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව | මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව |
| රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව | රාජ්‍ය භාෂා කොමිසම |
| විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | දුරස්ථ අධ්‍යයන මධ්‍යස්ථානය |
| | ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය |
| | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය |

## රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
## සංවිධාන සැලැස්ම



## 02 ප්‍රගතිය හා ඉදිරි දැක්ම

### 2.1 ඒකාබද්ධ සේවයේ හා දීප ව්‍යාප්ත සේවාවන්හි බඳවාගැනීම්

ඒකාබද්ධ සේවයේ හා දීප ව්‍යාප්ත සේවාවන්හි පැවති පුරප්පාඩු පිරවීම සඳහා 2023 වසරේදී නිලධාරීන් 1745 දෙනෙක් රාජ්‍ය සේවයට බඳවාගන්නා ලදී.

| බඳවා ගන්නා ලද සේවය | බඳවා ගන්නා ලද සේවක සංඛ්‍යාව |
|---|---:|
| ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය III ශ්‍රේණිය | **05** |
| කළමනාකරණ සේවා නිලධාරී සේවය - සීමිත | **1,385** |
| රජයේ පුස්තකාලයාධිපති සේවය III ශ්‍රේණිය -සීමිත | **22** |
| කළමනාකරණ සේවා නිලධාරී අධිශ්‍රේණිය සේවය - කුසලතා පදනම | **171** |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය II ශ්‍රේණිය 2 පන්තිය - සීමිත | **26** |
| භාෂා පරිවර්තක සේවය 1 පන්තිය -විවෘත | **95** |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය I ශ්‍රේණිය 3 -සීමිත | **41** |
| **එකතුව** | **1,745** |

## 2.1.1 2023 දෙසැම්බර් 31 වන දිනට දීප ව්‍යාප්ත සේවයේ නිලධාරීන්

### ශ්‍රී ලංකා පරිපාලන සේවය

| ශ්‍රේණිය | අනුමත තනතුරු | තත්‍ය නිලධාරීන් සංඛ්‍යාව | පුරප්පාඩු | අතිරික්තය |
|---|---|---|---|---|
| විශේෂ | 383 | 368 | 43 | - |
| I | 992 | 705 | 287 | - |
| III/II | 1845 | 1427 | 418 | - |
| එකතුව | 3220 | 2500 | 748 | - |

### ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය

| ශ්‍රේණිය | අනුමත තනතුරු | තත්‍ය නිලධාරීන් සංඛ්‍යාව | පුරප්පාඩු | අතිරික්තය |
|---|---|---|---|---|
| විශේෂ | 87 | 52 | 35 | - |
| I | 478 | 638 | - | 160 |
| II/III | 1492 | 901 | 591 | - |
| එකතුව | 2057 | 1591 | 626 | 160 |

### ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය

| ශ්‍රේණිය | අනුමත තනතුරු | තත්‍ය නිලධාරීන් සංඛ්‍යාව | පුරප්පාඩු | අතිරික්තය |
|---|---|---|---|---|
| විශේෂ | 01 | 01 | - | - |
| I | 06 | 06 | - | - |
| II/III | 62 | 43 | 19 | - |
| එකතුව | 69 | 50 | 19 | - |

### ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය

| ශ්‍රේණිය | අනුමත තනතුරු | තත්‍ය නිලධාරීන් සංඛ්‍යාව | පුරප්පාඩු | අතිරික්තය |
|---|---|---|---|---|
| විශේෂ | 46 | 38 | 08 | - |
| I | 232 | 325 | - | 93 |
| II | 114 | 312 | - | 198 |
| III | 1150 | 508 | 351 | - |
| එකතුව | 1542 | 1183 | 359 | 291 |

### ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය

| ශ්‍රේණිය | අනුමත තනතුරු | තත්‍ය නිලධාරීන් සංඛ්‍යාව | පුරප්පාඩු | අතිරික්තය |
|---|---|---|---|---|
| විශේෂ | 73 | 70 | 3 | - |
| I | 191 | 87 | 104 | - |
| II/III | 800 | 650 | 150 | - |
| අධි ) (සේවක | 234 | 245 | - | 11 |
| එකතුව | 1298 | 1052 | 257 | 11 |

### ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය

| ශ්‍රේණිය | අනුමත තනතුරු | තත්‍ය නිලධාරීන් සංඛ්‍යාව | පුරප්පාඩු | අතිරික්තය |
|---|---|---|---|---|
| විශේෂ | 20 | 14 | 06 | - |
| I | 55 | 26 | 29 | - |
| II | 17 | 06 | 11 | - |
| III | 557 | 339 | 218 | |
| එකතුව | 649 | 385 | 264 | - |

## 2.1.2 - 2023 දෙසැම්බර් 31 වන දිනට ඒකාබද්ධ සේවයේ නිලධාරීන්

| සේවය | අනුමත | තත්‍ය | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|
| කළමනාකරණ නිලධාරි සේවය | 29785 | 24629 | 5156 | - |
| භාෂා පරිවර්තක සේවය | 636 | 243 | 393 | - |
| පුස්තකාලයාධිපති සේවය | 625 | 121 | 504 | - |
| කාර්යාල සේවක සේවය | 17218 | 17208 | 10 | - |
| රියදුරු සේවය | 7002 | 8296 | - | 1294 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය | 3431 | 1748 | 1683 | - |
| සංවර්ධන නිලධාරී සේවය | - | * 80815 | - | - |
| එකතුව | 144139 | 133963 | 13764 | 1294 |

***කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත කරමින් පවතී.**

## 2.2 අමාත්‍යාංශය මඟින් නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

| | චක්‍රලේඛ අංකය | නිකුත් කළ දිනය | කාරණය |
|---|---|---|---|
| 01 | 01/2023 | 2023.01.12 | ආයතන සංග්‍රහයේ විධිවිධාන සංශෝධනය කරමින් නිකුත් කරන ලද රා.ප.ච - 2022 |
| 02 | 02/2023 | 2023.01.12 | 2022 වර්ෂයේ නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ නාමාවලිය |
| 03 | 04/2023 | 2023.03.02 | 2023 රාමලාන් (රාමසාන්) සමයේදී විශේෂ නිවාඩු ලබාදීම |
| 04 | 06/2023 | 2023.04.06 | 2023 පළාත් පාලන ඡන්ද විමසීමට නාමයෝජනා භාරදුන් දේශපාලන අයිතිවාසිකම් හිමි රාජ්‍ය නිලධරයන් වෙත වැටුප් |
| 05 | 07/2023 | 2023.05.08 | 2023 පළාත් පාලන ඡන්ද විමසීමට නාම යෝජනා භාරදුන් දේශපාලන අයිතිවාසිකම් හිමි රාජ්‍ය නිලධරයන් සඳහා සහන ලබා දීම |
| 06 | 16/2023 | 2023.09.06 | කුලවද්දාගත් දරුවෙකු හදාවඩා ගැනීම වෙනුවෙන් රාජ්‍ය නිලධරයෙකුට නිවාඩු ලබා දීම |
| 07 | 17/2023 | 2023.10.17 | ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙත වැටුප් සම්බන්ධ ගැටලු ඉදිරිපත් කිරීමේදී අනුගමනය කළ යුතු නව ක්‍රියාපිළිවෙල |
| 08 | 21/2023 | 2023.10.19 | මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ රැස්වීම් පැවැත්වීම |
| 09 | 22/2023 | 2023.12.07 | රජයේ නිලධරයන්ට විශේෂ අත්තිකාරම් - 2024 වසර |
| 10 | 23/2023 | 2023.12.21 | ජල ගැලීම්/ ගංවතුර, නායයෑම් හා මාර්ග අවහිරතා හේතු කොට ගෙන සේවයට නොපැමිණි රාජ්‍ය නිලධරයන් සඳහා |

| | | | |
|---|---|---|---|
| | | | නිවාඩු ලබා දීම 2023 සැප්තැම්බර්, ඔක්තෝබර්, නොවැම්බර් හා දෙසැම්බර් |
| 11 | 25/2023 | 2023.12.15 | 2024 වසර - රාජකාරි කටයුතු ඇරඹීම |
| 12 | 26/2023 | 2023.12.22 | පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා ඉදිරිපත් වූ දේශපාලන අයිතිවාසිකම් හිමි රාජ්‍ය නිලධරයන් සඳහා සහන ලබා දීම. |
| 13 | 27/2023 | 2023.12.27 | "විවෘත හා වගකිව යුතු රජයක්" සඳහා රජයේ නිලධාරීන්ගේ වගකීම |

## 2.3. අමාත්‍යාංශය මඟින් නිකුත් කරන ලද සංශෝධිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

| | චක්‍රලේඛ අංකය | නිකුත් කළ දිනය | කාරණය |
|---|---|---|---|
| 1 | 12/2012(I) | 2023.06.12 | ආයතන අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කළ යුතු කරුණු හා ඒවා ඉදිරිපත් කළ යුතු ආකාරය |
| 2 | 31/2022(I) | 2023.03.03 | රජයේ නිලධරයන්ට විශේෂ අත්තිකාරම් - 2023 වසර |
| 3 | 14/2022(III) | 2023.07.13 | ජ්‍යෙෂ්ඨතාවට හා විශ්‍රාම වැටුපට හානියක් නොවන පරිදි රාජ්‍ය නිලධරයන්ට දේශීය/විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා දීම |
| 4 | 02/2021(VIII) | 2023.05.12 | රාජ්‍ය සේවය සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාම |

## 2.4 අමාත්‍යාංශය මඟින් නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි

| | චක්‍රලේඛ ලිපි අංකය | නිකුත් කළ දිනය | කාරණය |
|---|---|---|---|
| 1 | 01/2023 | 2023.02.09 | වෘත්තීය සමිති/ සම්මේලන සඳහා රාජ්‍ය සේවකයින් පූර්ණ කාලීනව මුදා හැරීම |
| 2 | 03/2023 | 2023.06.30 | ආයතන සංග්‍රහයේ 15 පරිශිෂ්ටයේ බැඳුම්කර ආකෘතිය සංශෝධනය කිරීම |
| 3 | 02/2023 | 2023.12.21 | දේපළ ණය ලබාගැනීමට අදාළ තොරතුරු පෞද්ගලික ලිපි ගොනුවට ඇතුළත් කිරීම |
| 4 | 04/2023 | 2023.12.28 | ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ 24:3:9 උප වගන්තියට අදාල වන දඬුවමක් ඇතුලත් විනය නියෝගයකදී වැටුප් වර්ධක අඩු කිරීම ක්‍රියාත්මක කල යුතු ආකාරය |

## 2.5. 2023 වර්ෂයේ දී රාජ්‍ය පරිපාලන අංශයේ විවිධ අංශයන් විසින් සිදු කළ සුවිශේෂී කාර්යය භාරයන්

### ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය

ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධාරීන් හට පර්යේෂණ සංස්කෘතියක් ඇති කිරීමේ අරමුණින් පර්යේෂණ ක්‍රමවේද පිළිබඳ පුහුණු පාඨමාලා විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සම්පත් දායකත්වයෙන් ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ II ශ්‍රේණියේ නිලධරයන් සඳහා පවත්වන ලද අතර, එය මෙරට විද්‍යාත්මක පර්යේෂණයන් දිරි ගැන්වීමේ අරමුණින් 2023 වසරේ දී අප අංශය මඟින් සංවිධානය කරන ලද වැඩසටහන් මාලාවකි. පහත දැක්වෙන්නේ එම වැඩමුළුවේ සමාරම්භක දිනයේ දී ලබා ගත් ඡායාරූප වේ.

.






### ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය

ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ I ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ වාස්තු විද්‍යාඥ තනතුරට හා බස්නාහිර පළාත් සභාවේ කොළඹ මහ නගර සභාවේ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ I ශ්‍රේණියේ ප්‍රධාන වාස්තු විද්‍යාඥ තනතුරට ශ්‍රී ලංකා වාස්තු විද්‍යාත්මක සේවයේ I ශ්‍රේණියේ නිලධරයන් පත්කිරීමේ සම්මුඛ පරීක්ෂණය 2023.10.07 දින පවත්වා සුදුසු නිලධරයන් පත් කර ඇත.

### ශ්‍රී ලංකා තාක්ෂණ සේවය

ශ්‍රී ලංකා තාක්ෂණ සේවා අංශය මඟින් එම සේවයේ ඒකීය ස්වරූපය පවත්වා ගෙන යාමේ අරමුණින් තාක්ෂණ සේවා ව්‍යවස්ථාව හා එම සේවයේ ප්‍රතිපත්තිමය තීරණයන්ට අදාළව කටයුතු ද කාර්යක්ෂමතා කඩයිම් විභාග පැවැත්වීමේ කටයුතු ද සිදු කරනු ලබයි.

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියට උසස් කිරීමේ විධිවිධාන නැවත ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ලබා දී ඇති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සකස් කරනු ලැබූ ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 4 වන සංශෝධන කෙටුම්පත සඳහා මෙම අමාත්‍යාංශ ලේකම්ගේ නිරීක්ෂණ හා නිර්දේශ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා යොමු කර ඇත.

**2023 වසරට අදාළව ශ්‍රී ලංකා තාක්ෂණ සේවය කාර්යක්ෂමතා කඩයිම් විභාග පැවැත්වීම පිළිබඳ තොරතුරු**

| **ශ්‍රී.ලං තා.සේ. කාර්යක්ෂමතා කඩඉම් විභාග** | **ගැසට් පත්‍රයේ පල කළ දිනය** | **අයදුම්පත් භාරගැනීම අවසන් වූ දිනය** | **විභාගය පැවැත් වූ දිනය** | **විභාග දෙපාර්ත.විසින් ප්‍රතිඵල නිකුත් කළ දිනය** |
|---|---|---|---|---|
| ශ්‍රී.ලං තා.සේ. III ශ්‍රේණිය - 2018 (II) | **2022.10.21** | **2022.11.21** | **2023.07.15** | විභාග දෙපාර්තමේන් තුව විසින් ප්‍රතිඵල නිකුත් කර ඇත |
| ශ්‍රී.ලං තා.සේ. II ශ්‍රේණිය - 2018 (II) | | | | විභාග දෙපාර්තමේන් තුව විසින් ප්‍රතිඵල නිකුත් කිරීමට නියමිතව ඇත |
| ශ්‍රී.ලං තා.සේ. I ශ්‍රේණියේ නිලධරයින් විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරඟ විභාගය -2020 | **2022.05.06** | **2022.06.03** | **2023.07.15** | විභාග දෙපාර්තමේන් තුව විසින් ප්‍රතිඵල නිකුත් කිරීමට නියමිතව ඇත |

**ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, අංක 1670/33 හා 2010 සැප්තැම්බර් 10 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය දීප ව්‍යාප්ත සේවාවන්ගෙන් එකක් වන අතර රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදුකර ඇති බලතල පැවරීමට අදාළව එම සේවාවේ නිලධාරීන්ගේ පරිපාලන කටයුතු රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ගණකාධිකාරී සේවා අංශය මගින් සිදු කරනු ලබයි.

මූල්‍ය කළමනාකරණයේ විනිවිදභාවය උපරිමව පවත්වා ගනිමින් වගකීම හා වගවීම සුරක්ෂිත කිරීම පිණිස නෛසර්ගික පෙළඹවීමක් සහිතව කටයුතු කරන පරිපූර්ණ වෘත්තීයවේදියෙකු බිහි කිරීම සඳහා ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයට අදාළ ව අමාත්‍ය

මණ්ඩලය හා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් පනවනු ලබන සියලුම ප්‍රතිපත්ති රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය ඇතිව ගණකාධිකාරී සේවා අංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබයි.

**ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවා අංශයේ 2023 වර්ෂයේ සුවිශේෂී කාර්යය සාධනයන්**

දීප ව්‍යාප්ත සේවා සඳහා බඳවා ගැනීමේ පොදු තරඟ විභාගය 2021 යටතේ ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයට සීමිත හා විවෘත පදනමින් පහත පරිදි නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු සැළසුම් කරන ලද අතර ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 මගින් සිදුකරන ලද සීමාකිරීම් වලට යටත්ව මෙම පොදු තරඟ විභාගයේ පළමු කොටස 2023.07.29 දින පවත්වන ලදී.

| | |
|---|---|
| විවෘත පදනමින් | - 144 |
| සීමිත පදනමින් | - 101 |

2023.12.31 දින වන විට සුදුසුකම් සම්පූර්ණ කරන ලද III ශ්‍රේණියේ නිලධාරීන් 55 ක ගේ සේවය ස්ථිර කරන ලදී.

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ සුදුසුකම් සම්පූර්ණ කරන ලද III ශ්‍රේණියේ නිලධාරීන් 121 දෙනෙකු II ශ්‍රේණියට උසස් කරන ලදී.

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ සේවා ව්‍යවස්ථාවේ 6 වන සංශෝධනය යටතේ සුදුසුකම් සම්පූර්ණ කරන ලද II ශ්‍රේණියේ නිලධාරීන් 20 දෙනෙකු I ශ්‍රේණියට උසස් කරන ලදී.

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ කටයුතු වලට අදාලව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතියෙන් ප්‍රසිද්ධ කරන ලද පහත නිවේදන වලට අදාළව සියලු කටයුතු 2023 වර්ෂයේ නිම කිරීමට හැකිවිය.

2021.09.30 දිනට පුරප්පාඩු 93 ක් සඳහා පත්කිරීම

2015.01.01 සිට 2021.09.29 දක්වා පැවති පුරප්පාඩු සඳහා පත්කිරීම.

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ විශේෂ ශ්‍රේණියේ 2021.10.01 දින සිට 2023.03.15 දින දක්වා පැවති පුරප්පාඩු 25 ක් සඳහා උසස් කිරීම් සිදු කරන ලදී.

ගණකාධිකාරී සේවයේ නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය හා ඒ සඳහා I ශ්‍රෙණියේ නිලධාරීන් 44 දෙනෙකු සහ III ශ්රේණියේ නිලධාරීන් 200 දෙනෙකු වශයෙන් වර්ෂය තුළ නිලධාරීන් 244 දෙනෙකු සහභාගී කරවා ඇත. මෙම වසර තුළදී විශ්‍රාම ගැනීමට නියමිත නිලධාරීන් 34 ක් සඳහා අදාළ සියලුම ආයතන කටයුතු නිමකර ඇත.වාර්ෂික ස්ථානමාරු යටතේ නිලධාරීන් 95ක් ද වාර්ෂික නොවන ස්ථානමාරු යටතේ නිලධාරීන් 110 ක්ද මෙම වර්ෂය තුළ ස්ථානමාරු ලබා ඇත.

මෙම සේවයේ නිලධාරීන් 16 දෙනෙකු සඳහා විනය ක්‍රියාමාර්ග ආරම්භ කිරීමට කටයුතු කර ඇති අතර වර්ෂය තුළ නිලධාරීන් 09 දෙනෙකු සඳහා විනය නියෝග නිකුත් කර ඇත. තවද වැඩි නිලධාරීන් ප්‍රමාණයකට අවස්ථාව ලබාදීමේ අරමුණින් ගණකාධිකාරී සේවාව ඇතුලු දීපව්‍යාප්ත සේවාවන් සඳහා අනුමතව ඇති ප්‍රියමනාප සේවා ස්ථාන නැවත සමාලෝචනය කිරීම 2023 වර්ෂයේ නොවැම්බර් මස ආරම්භ කරන ලදී.

## ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා අංශය

### විශේෂ ශ්‍රේණියට උසස් කිරීම

ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ I ශ්‍රේණියේ සුදුසුකම්ලත් නිලධාරීන්, එම සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා වූ විධිමත් සම්මුඛ පරීක්ෂණය 2023.04.30 පැවැත්වූ අතර, පැවැති පුරප්පාඩු සංඛ්‍යාව අනුව නිලධාරීන් 02 දෙනෙකුද 2022.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ද, නිලධාරීන් 16 දෙනෙකු 2023.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ද, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කරන ලදී.

මීට අමතරව උසස්වීම් අවුරා තිබූ එක් නිලධාරියකු සඳහාද 2021.06.30 දින සිට ක්‍රියාත්මක වන පරිදි විශේෂ ශ්‍රේණියට උසස් කර ඇත.





### අභ්‍යන්තර විගණන අංශය

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ, රාජ්‍ය පරිපාලන අංශයට අයත් අභ්‍යන්තර විගණන අංශය, මු.රෙ. 133 ප්‍රකාර, අමාත්‍යාංශ ලේකම්වරයාට සෘජුවම වගකීමට බැඳී සිටින ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයකු යටතේ ක්‍රියාත්මක වේ. එය ශාඛා ප්‍රධානී ඇතුළු අභ්‍යන්තර විගණන නිලධාරීන් 08 දෙනකු, කාර්යාල කාර්ය සහායකය නිලධාරියෙකු සහ රියදුරකුගෙන් යුත් අනුමත කාර්ය මණ්ඩලයකින් සමන්විත වේ.

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ, රාජ්‍ය පරිපාලන අංශය හා ඒ යටතේ පවතින පහත සඳහන් දෙපාර්තමේන්තු හා ආයතනයන්ට අදාළව අනුමත වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්මකට අනුව විගණන කටයුතු සිදුකරනු ලබයි. මීට අමතරව අවශ්‍යතාවය අනුව විශේෂ විගණන පරීක්ෂණ හා විමර්ශන සිදුකිරීම ද අභ්‍යන්තර විගණන අංශයේ විෂය පථයට අදාළ වේ.

| දෙපාර්තමේන්තු හා අංශ | ආයතන |
|---|---|
| 01. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 01.ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA), |
| 02. බහුකාර්යය සංවර්ධන කාර්යය සාධක බලකා දෙපාර්තමේන්තුව | 02.දුරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථානය (DLC), |
| 03. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව | 03.රාජ්‍ය භාෂා කොමිෂන් සභාව (OLC) |
| 04. පාර්ලිමේන්තු කටයුතු අංශය | 04.මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව (NHRDC) |
| 05. ජාතික භාෂා අංශය | 05.භාෂා අධ්‍යාපන හා පුහුණුව පිළිබඳ ජාතික ආයතනය(NILET), |

**2023 වර්ෂයේදී අභ්‍යන්තර විගණන අංශය විසින් සිදුකරන ලද කාර්යයන්**

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම.

පළමු කාර්තුව - 2023.04.10

දෙවන කාර්තුව 2023.07.26 සහ 2023.08.16

තෙවන කාර්තුව - 2023.10.06

සිව්වන කාර්තුව - 2023.12.14



විගණන හා කළමණාකරණ කමිටු රැස්විම් පැවැත්වීම

**පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා ( COPE ) සම්බන්ධ කටයුතු**

භාෂා අධ්‍යාපන හා පුහුණුව පිළිබඳ ජාතික ආයතනයට ( NILET ) අදාලව 2023.08.24 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීම ( COPE ) සඳහා අවශ්‍ය කරුණු හා වාර්තා සකස් කිරීම.

**2023.08.31 දින දක්වා සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවන් සම්බන්ධ විස්තර**

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට අයත් නුවරඑළිය, දියතලාව, බණ්ඩාරවෙල, මිහින්තලය, පොළොන්නරුව, මුලතිව්, යාපනය, මහියංගණය, මොණරාගල හා කතරගම යන නිවාඩු නිකේතන 13ක ලිපිගොනු පරීක්ෂාව හා භෞතික පරීක්ෂාව සිදුකරන ලදී.

මීට අමතරව, සෑම මාසයකම හයලක්ෂ අසූඅටදහසකට ආසන්න විශ්‍රාමිකයින් සඳහා මාසිකව ගෙවනු ලබන විශ්‍රාම වැටුප් ගෙවීම් දත්ත පද්ධතිය විගණනය කිරීම මඟින් හඳුනාගනු ලබන වැරදි හා අඩුපාඩු නිවැරදි කරගැනීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත විගණන වාර්තා යොමු කර ඇත.

**ජාතික භාෂා අංශය**

**.ජාතික භාෂා අංශයෙහි අරමුණු**

1. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම.
2. රාජ්‍ය ආයතනවල ද්විභාෂා පරිසරයක් නිර්මාණය කිරීමට සුදුසු වටපිටාවක් ගොඩනැගීම.
3. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිබඳව මහජනතාව බලාත්මක කිරීම.
4. භාෂා ප්‍රචාරණයට සහ ප්‍රවර්ධනයට අදාලව ශ්‍රී ලංකාවේ ජනයා අතර ධනාත්මක මානසිකත්වයක් උත්පාදනය කිරීම.

**ජාතික භාෂා අංශයෙහි ක්‍රියාකාරකම්**

- ❖ රාජ්‍ය ආයතන තුල ද්විභාෂා පරිසරය ශක්තිමත් කිරීම.
- ❖ ද්විභාෂා සේවා සැපයීම සඳහා රාජ්‍ය නිලධාරින් බල ගැන්වීම.
- ❖ ජනතාව අතර, රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම ප්‍රවර්ධනය කිරීම.
- ❖ රාජ්‍ය ආයතන තුළ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ පිළිගැනීමක් ඇති කිරීම.
- ❖ රාජ්‍ය ආයතන තුළ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාලව අධීක්ෂණය හා නියාමනය

2023.01.01 **සිට 2023.12.31 දක්වා ජාතික භාෂා අංශය ලඟා කරගත් ඉලක්ක**

| **අනු අංකය** | **ප්‍රධාන ක්‍රියාකාරකම්** | ප්‍රතිපාදන (මිලි.රු) | **සත්‍ය වියදම (2023.12.31ට ප්‍රගතිය)** |
|---|---|---|---|
| **01** | ජාතික භාෂා සංවර්ධන ව්‍යාපෘතිය (2509) | 10,000,000.00 | 9,996,597.50 |
| **02** | රාජ්‍ය භාෂා ප්‍රතිඵත්තිය ක්‍රියාත්මක කිරීම (1703) | 940,000.00 | 938,615.00 |
| | **මුළු එකතුව** | **10,940,000.00** | **2,634,000.00** |

**රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම (1703)**

| **අනු අංකය** | **ක්‍රියාකාරකම** | **ප්‍රතිපාදන මුදල** | **සත්‍ය වියදම** |
|---|---|---|---|
| 1 | ශ්‍රී ලාංකේය භාෂා ප්‍රතිපත්තිය සම්පාදනය කිරීම | 15,155.00 | 15,155.00 |
| 2 | භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා විවෘත සංවාද 05ක් පැවත්වීම | 210,845.00 | 210,750.00 |
| 3 | ත්‍රෛභාෂා හැකියාව ඇති රාජ්‍ය නිළධාරීන් පරිවර්තන කටයුතු සඳහා පුහුණු කිරීම | 222,00.00 | 220,710.00 |
| 4 | ආයතන සංග්‍රහය දෙමළ බසට පරිවර්තනය කිරීම | 492,000.00 | 492,000.00 |
| | | **940,000.00** | **938,615.00** |

**ජාතික භාෂා සංවර්ධන වැඩසටහන (2509)**

| අනු අංකය | ක්‍රියාකාරකම | ප්‍රතිපාදන මුදල | සත්‍ය වියදම |
|---|---|---|---|
| 1 | භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා මාධ්‍ය සම්මන්ත්‍රණ 06 ක් පැවත්වීම | 205,000.00 | 204,447.50 |
| 2 | භාෂා සැලසුම් සකස් කිරීම, | 1,255,943.96 | 1,255,943.96 |
| 3 | දිස්ත්‍රික්ක 25 ක් සඳහා පුස්තකාල සඳහා ත්‍රෛභාෂා පොත් ලබා දීම | 3,672,000.00 | 3,672,000.00 |
| 4 | ඒකාංගික ටෙලි නාට්‍ය තරඟයක් පැවත්වීම | 84,000.00 | 81,170.00 |
| 5 | ඉංග්‍රීසි කෙටි චිත්‍රපට තරඟයක් පැවත්වීම | 65,000.00 | 65,000.00 |
| 6 | භාෂා සංස්කෘතික හුවමාරු වැඩසටහන් පැවත්වීම | 924,419.00 | 924,419.00 |
| 7 | රාජ්‍ය භාෂා දිනය | 1,209,000.00 | 1,209,000.00 |
| 8 | රාජ්‍ය භාෂා සතිය සැමරීම | 545,600.00 | 545,600.00 |
| 9 | කෙටි කතා පොත් 2ක් සිංහල හා ඉංග්‍රීසි මාධ්‍යයට පරිවර්තනය කිරීම | 390,000.00 | 389,980.00 |
| 10 | තාක්ෂණික හුවමාරු වැඩසටහන | 1,254,037.04 | 1,254,037.04 |
| 11 | වාර්තාමය චිත්‍රපටයක් සකස් කිරීම | 395,000.00 | 395,000.00 |
| | | **10,000,000.00** | **9,996,597.50** |

**මානව සම්පත් සංවර්ධන අංශය**

ශ්‍රී ලංකාවේ පරිපාලන ක්ෂේත්‍රය තුළ වගකිව යුතු කාර්යභාරයක් ඉටුකරනු ලබන රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ මානව සම්පත් සංවර්ධන අංශයේ මෙහෙවර වන්නේ අමාත්‍යාංශය තුළ හා අවශ්‍ය අවස්ථාවන්හි දී අමාත්‍යාංශයෙන් පිටත රජයේ නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය කිරීමට අවශ්‍යවන පුහුණු අවස්ථා කිසිඳු භේදයකින් තොරව අඛණ්ඩව ලබාදීම, ගෝලීය වශයෙන් තරඟකාරී මෙන්ම බහු නිපුණතා සහිත ඵලදායී, ගෞරවණීය හා තෘප්තිමත් සේවා බලකායක් නිර්මාණය කිරීම හා මහජනතාවගේ අවශ්‍යතා තෘප්තිමත් අයුරින් ඉටු කරලීම සඳහා නිලධාරීන් තුළ තිබිය යුතු නිපුණතාවයන් වර්ධනය කිරීම සහතික කිරීමයි.

ඒ අනුව රජයේ අරමුදල් භාවිතා කරමින් කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් ලබා දීමට මානව සම්පත් සංවර්ධන අංශය ක්‍රියා කරනු ලබයි.

මහජන හිතෛශී රාජ්‍ය සේවයක් උදෙසා කළමනාකරණ ව්‍යුහයේ නව ප්‍රතිසංස්කරණ ඇති කිරීම.

සේවාලාභීන් වෙත සපයනු ලබන සේවාව වඩාත් කාර්යක්ෂම හා ගුණාත්මක සේවාවක් බවට පත්කිරීමට තොරතුරු තාක්ෂණ හා

සන්නිවේදන මෙවලම් හා නවීන ක්‍රමෝපායන් යොදා ගැනීම.

**2023 වර්ෂයේ මානව සම්පත් සංවර්ධන අංශය මගින් ඉටු කළ සුවිශේෂී කාර්යභාරය**

ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා පවත්වනු ලැබූ සේවාරම්භක පුහුණුව

2017 වර්ෂයේ පැවති ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ III වැනි ශ්‍රේණියට නිලධාරීන් බඳවාගැනීමේ විභාගයෙන් අදියර තුනක් යටතේ 2018 හා 2019 වර්ෂයන්හි දී බඳවාගත් නිලධාරීන් ද, 2019 වර්ෂයේ පැවති සීමිත තරඟ විභාගයේ පළමු අදියරේ නිලධාරීන් ද, හා 2023 වර්ෂයේ බඳවාගත් නිලධාරීන් ඇතුලත්ව සමස්ත නිලධාරීන් 51 දෙනෙක් සඳහා පුස්තකාල විෂයට අදාළ සහ පුස්තකාල විෂයට පරිබාහිර පුහුණු මොඩියුලයන් ඇතුළත් කරමින් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ සහයෝගය ඇතිව ප්‍රායෝගික හා මාර්ගගත ක්‍රමය ඔස්සේ 2023.08.23 වැනි දින සිට 2023.08.31 වැනි දින දක්වා පුහුණු සැසි 10ක් ක්‍රියාත්මක කරන ලදී.

**මාණ්ඩලික නිලධාරී පුහුණු වැඩසටහන්**

අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරීන් සඳහා උපාය මාර්ගික ක්‍රම පිළිබඳ දැනුම, වාර්තා ලිවීම, ප්‍රසම්පාදන ක්‍රියාවලිය හා විනය කාර්ය සංග්‍රහය පිළිබඳ ප්‍රායෝගික දැනුම යනාදී විවිධ පැතිකඩ ඔස්සේ පුහුණු වැඩමුළු පවත්වන ලදී. මීට අමතරව සෑම මාණ්ඩලික නිලධාරියකුම සතු විය යුතු එනම්, යහපත් නායකයකු සතු විය යුතු ගුණාංග පිළිබඳ න්‍යායාත්මක කරුණු මෙන්ම ප්‍රායෝගික භාවිතයන් ඇතුලත් පුහුණුවක් පවත්වන ලදි. මෙම පුහුණු වැඩමුළු සඳහා මාණ්ඩලික නිලධාරින් 119 දෙනෙකු සහභාගි වී ඇත0.

**සංවර්ධන නිලධාරී සහ කළමනාකරණ සේවා නිලධාරී පුහුණු වැඩසටහන්**



මෙම අමාත්‍යාංශයේ සේවයේ නියුතු සියලුම සංවර්ධන නිලධාරීන් සහ කළමනාකරණ සේවා නිලධාරීන් සඳහා ඔවුන්ට තම රාජකාරි ඉටු කිරීම සඳහා අවශ්‍ය දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය කිරීමේ අරමුණින් වර්ෂය පුරා පුහුණු වැඩමුළු සංවිධානය කරන ලදී. ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, තොරතුරු තාක්ෂණය, දත්ත හා තොරතුරු ඵලදායීව ඉදිරිපත් කිරීම ඇතුළු පුහුණු වැඩසටහන් 20ක් පවත්වන ලද අතර එම වැඩමුළු සඳහා නිලධාරීන් 1038ක් සහභාගී වී ඇත.

අමාත්‍යාංශයේ සේවයේ නියුතු කාර්යාල කාර්ය සේවයේ නිලධාරීන් හා රියදුරු මහතුන් ඇතුලු **ප්‍රාථමික ශ්‍රේණියේ නිලධාරීන්** වෙනුවෙන් ඔවුන්ගේ දැනුම, ආකල්ප හා කුසලතා සංවර්ධනය සඳහා වර්ෂය පුරාම විවිධ මාතෘකා ඔස්සේ පුහුණු වැඩසටහන් අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදී.

ඒ අතර රාජ්‍ය සේවකයකුගෙන් අපේක්ෂිත විනය හා හැසිරීම පිළිබඳ මූලික දැනුම ලබාදීම පිළිබඳ පුහුණු වැඩසටහන, ආරක්ෂණ මූලධර්ම, මාර්ග නීති සහ අනතුරු වළක්වා ගැනීම පිළිබඳ පුහුණු වැඩසටහන් පවත්වන ලදී. තවද, කණ්ඩායම් වැඩ හා හොඳ කණ්ඩායම් සාමාජිකයෙකු වීම, සේවාලාභී සත්කාරය, ආචාර ධර්ම හා යහපත් සන්නිවේදනය වැනි වැඩසටහන් ද පවත්වන ලදී. මෙම පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් 322ක් සහභාගී වි ඇත.

**නිවාඩු නිකේතන හා සංචාරක බංගලා කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන**

අප අමාත්‍යාංශය යටතේ වන රාජ්‍ය පරිපාලන නිවාඩු නිකේතන හා සංචාරක බංගලාවන්හි සේවයේ නියුතු කාර්ය මණ්ඩලයේ දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධන කිරීමේ අරමුණින් සංවිධානය කල නේවාසික පුහුණු වැඩමුළුව 2023 ඔක්තෝම්බර් මස 03 හා 04 දෙදින නිලධාරීන් 29 දෙනෙකුගේ සහභාගීත්වයෙන් මිහින්තලය රාජ්‍ය පරිපාලන නිවාඩු නිකේතනයේ දී පවත්වන ලදී. මෙම පුහුණු වැඩසටහන විෂයානුබද්ධ දේශන, ප්‍රායෝගික ක්‍රියාකාරකම්, නිවාඩු නිකේතන ගැටළු, සාකච්ඡාමය සැසිවාර හා සේවක රසාස්වාදන වැඩසටහන්වලින් සමන්විත විය.

**අමාත්‍යාංශයේ සියළුම නිලධාරීන් සඳහා පොදුවේ පැවැත් වූ පුහුණු වැඩසටහන්**

එක් එක් නිලධාරී කණ්ඩායම්වලට අමතරව පොදුවේ අමාත්‍යාංශයේ සියළුම නිලධාරීන් සඳහා විවිධ පුහුණු වැඩසටහන් පවත්වන ලදී. ඒ අතර පරිගණක පිළිබඳ මූලික දැනුම වර්ධනය කිරීමේ අරමුණින් e-mail, internet, Google forms , MS office පිළිබඳ පුහුණුව, තොරතුරු දැනගැනීමේ පනත පිළිබඳ පුහුණුවක් හා කාලීන මාතෘකාවක් ලෙස බෝ නොවන රෝග වළක්වා ගැනීම සඳහා යහපත් සෞඛ්‍ය පුරුදු පිළිබඳ වැඩමුළුවක් පවත්වන ලදි. එමෙන්ම අමාත්‍යාංශයේ සියළුම නිලධාරීගේ ආකල්ප සංවර්ධනය කිරීමේ අරමුණින් පුහුණු වැඩසටහනක් හා රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම පිළිබඳ පුහුණුවක් පවත්වන ලදි. ඒ අනුව අමාත්‍යාංශයේ නිලධාරීන් සඳහා පවත්වන ලද පොදු වැඩමුළු සඳහා නිලධාරීන් 316ක් සහභාගී වන ලදී.

**කළමනාකරණ සේවා නිලධාරි I ශ්‍රේණියේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් පාඨමාලා**

කළමනාකරණ සේවා නිලධාරි I ශ්‍රේණියේ නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම වෙනුවට පැවැත්වෙන දින 10ක පුහුණු පාඨමාලාව දිස්ත්‍රික් මට්ටමින් පැවැත්වීමට අදාළව ප්‍රතිපාදන නිදහස් කිරීම සහ පාඨමාලා සම්බන්ධීකරණය කිරීම සිදු කරන ලදී. ඒ අනුව 2023 වර්ෂයට අදාළව දිස්ත්‍රික්ක 07ක්

තුළ නිලධාරින් 669 දෙනෙකු සඳහා මෙම අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත අදාළ පුහුණු වැඩසටහන පවත්වා අවසන් කරන ලදී.

**දිගු කාලීන දේශීය පුහුණු පාඨමාලා**

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරින් පස් දෙනෙකු සඳහා පශ්චාත් උපාධි හා පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා හැදෑරීම සඳහා ප්‍රතිපාදන ලබා දී ඇත.

**කෙටි කාලීන දේශීය පුහුණු පාඨමාලා**

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් පවත්වනු ලබන වෘත්තීය ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව සඳහා මාණ්ඩලික නිලධාරීන් 09 දෙනෙකු සඳහා ප්‍රතිපාදන ලබා දී ඇත.

**භාෂා පුහුණු වැඩසටහන්**

දමිළ භාෂා පුහුණු වැඩසටහන්

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 අනුව රාජ්‍ය නිලධාරීන් විසින් අත්කර ගත යුතු රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා දීමට අදාළව අමාත්‍යාංශයේ සේවයේ නියුතු ද්විතීයික මට්ටමේ නිලධාරීන් සඳහා දෙමළ භාෂා පුහුණු වැඩසටහන (පැය 150 ) රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ සම්පත්දායකයකු යටතේ කණ්ඩායම් දෙකක් වශයෙන් නිලධාරීන් 208 දෙනෙක් සඳහා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පුහුණු වැඩසටහන් පවත්වන ලදි.

ඉංග්‍රීසි භාෂා පුහුණු වැඩසටහන්

අමාත්‍යාංශයේ සේවයේ නිරතව සිටින ඒකාබද්ධ සේවයේ නිලධාරීන්ගේ ඉංග්‍රීසි භාෂා දැනුම වර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ භාෂා අංශයේ ජ්‍යෙෂ්ඨ උපදේශකවරයෙකුගේ සම්පත්දායකත්වය යටතේ ඉංග්‍රීසි භාෂා පුහුණු පාඨමාලාවක් පවත්වන

**විදේශීය පුහුණු වැඩසටහන්**

**දිගු කාලීන පුහුණු වැඩසටහන්**

2023 වර්ෂය තුළ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව මඟින් පශ්චාත් උපාධි පාඨමාලා 20ක් සඳහා අයදුම්පත් කැඳවා තිබූ අතර මෙම අමාත්‍යාංශයෙන් අයදුම් කල නිලධාරීන් කිසිවෙකු තේරී පත් වී නොතිබුණි.

**කෙටි කාලීන පුහුණු වැඩසටහන්**

මෙම වැඩසටහන යටතේ අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයට අයත් මාණ්ඩලික නිලධාරීන් 13 දෙනෙකු පකිස්තානය, චීනය හා ඉන්දියාව යන රටවල්වලට පුහුණු පාඨමාලා 07 ක් සඳහා සහභාගි වී ඇත. තවද කැනඩාවෙහි පැවති (NLEAP) ව්‍යාපෘතිය සඳහා අමාත්‍යාංශ නිලධාරීන් 07 දෙනෙකු සහභාගි වී ඇත.

**අමාත්‍යාංශයෙන් බැහැර නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන්**

රාජ්‍ය සේවයේ මානව සම්පතෙහි දැනුම වර්ධනය කිරීම අරමුණු කර ගනිමින් දිවයිනේ සියලුම රාජ්‍ය ආයතනවල සේවයේ නියුතු සංවර්ධන නිලධාරී සේවයේ සහ කළමනාකරණ සේවා නිලධාරී සේවයේ නිලධාරීන් ඉලක්ක කර ගනිමින් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ දිස්ත්‍රික් මට්ටමින් පුහුණු පාඨමාලා සංවිධානය කෙරිණි. ඒ යටතේ පුහුණු වැඩසටහන් අදියර 07ක් සිංහල මාධ්‍යයෙන් පැවැති අතර එක් පුහුණු

වැඩසටහනක් දමිළ මාධ්‍යයෙන් පැවැත්විණි. මේ යටතේ ඒකාබද්ධ සේවයේ නිලධාරීන් 2510 දෙනෙකුගේ පුහුණු අවශ්‍යතා සම්පූර්ණ කරන ලදී.

**කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම**

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණයේ කළමනාකරණ සහකාර තනතුර සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2023 වසරේ අප්‍රේල් මාසයේ දී පවත්වන ලදී. මීට අමතරව මෙම අමාත්‍යාංශයේ කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - බහුකාර්ය ඛණ්ඩ 01 සේවා ගණයේ කළමනාකරණ සහකාර තනතුර සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2023 දෙසැම්බර් මස දී පවත්වන ලදී.

**විශේෂ වැඩසටහන්**

**කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිත ආයතනය (KOICA) යටතේ ක්‍රියාත්මක වන වැඩසටහන්**

මේ යටතේ ශ්‍රී ලංකාවේ මධ්‍යම සහ ඌව පළාත්වල කොවිඩ්-19 වසංගතයෙන් පීඩාවට පත් ප්‍රජාවන්ගේ සමාජ ආර්ථික ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමේ වැඩසටහන යටතේ 2023.07.10 හා 2023.12.19 මෙහෙයුම් කමිටු රැස්වීම් පැවැත්වූ අතර එම ව්‍යාපෘතියෙහි ප්‍රගතිය සාකච්ඡා කරන ලදි. 2023 වර්ෂය වන විට සමස්ත භෞතික ප්‍රගතිය 30% ක් වන අතර මූල්‍ය ප්‍රගතිය 21%ක් වන බව ප්‍රගති වාර්තාවල සඳහන් වේ.

**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂණ කොමිෂන් සභාව හා එක්ව සිදු කල වැඩසටහන් -**

ශ්‍රී ලංකාව තුළින් අල්ලස හා දූෂණය තුරන් කිරීම සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන පස් අවුරුදු ජාතික ක්‍රියාකාරී සැලැස්ම යටතේ වන උපායමාර්ග රාජ්‍ය ආයතන තුළ ක්‍රියාත්මක කිරීම උදෙසා රාජ්‍ය නිලධාරීන්ගේ දැනුම්වත්භාවය වැඩි කිරීම සඳහා දූෂණ විරෝධී පුහුණුකරුවන් පුහුණු කිරීම සඳහා වූ පුහුණු වැඩසටහන් වෙනුවෙන් සම්බන්ධීකරණ සහාය ලබාදීම සිදු කර ඇත.

ඒ අනුව, 2023 වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පළාත් පාලන ආයතන, ප්‍රධාන ලේකම් කාර්යාල නියෝජනය වන පරිදි පළාත් 6ක් ආවරණය කරමින් දූෂණ විරෝධී පුහුණුකරුවන් පුහුණු කිරීම සඳහා තෙදින නේවාසික පුහුණු වැඩමුළු මාලාවන් 6ක් සහ සුපිළිපන්න නිලධාරීන් පුහුණු කිරීමේ එක්දින පුහුණු වැඩමුළු මාලාවන් 6ක් පවත්වා ඇති අතර ඒ සඳහා සම්බන්ධීකරණ සහාය ලබා දෙන ලදී.

**පොදු වැඩසටහන්**

අමාත්‍යාංශයේ මාණ්ඩලික හා මාණ්ඩලික නොවන කාර්ය මණ්ඩලය අතර අන්‍යෝන්‍ය සුහදතාව වර්ධනය කිරීම, නිලධාරීන්ගේ මානසික සමතුලිතතාවය ආරක්ෂා කිරීම,

කණ්ඩායම් හැඟීම වර්ධනය කිරීම සහ නිලධාරීන් අභිප්‍රේරණය කිරීම යන උත්කෘෂ්ඨ අරමුණු පෙරදැරිව රාජකාරියෙන් ඔබ්බට වූ ඔවුන් සතු සුවිශේෂී දක්ෂතා සහ සෞන්දර්යාත්මක හා නිර්මාණශීලී කලා හැකියාවන් ඔප්නැංවීම උදෙසා සංවිධානය කරන ලද රසෝත්සය 2023, රසාස්වාදයන වැඩසටහන අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2023 නොවැම්බර් මස 30 වන දින ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ සංහිඳ ශ්‍රවණාගාරයේදී පැවැත්වීමට කටයුතු කරන ලදී. තවද, රසෝත්සය වැඩසටහනෙහි ඉදිරිපත් කිරීම් සිදු කළ නිලධාරීන් වෙනුවෙන් සහතික පත්‍ර හා ප්‍රශංසා ලිපි ප්‍රදානය කිරීම සිදු කරන ලදී.

**ප්‍රදීප් යසරත්න**

**ලේකම්**

**රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය**

## 03 පරිච්ඡේදය- වර්ෂය සඳහා සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

### 3.1.මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-එෆ්

**2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය**

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2023 රු. | | සටහන | තත්‍ය 2023 රු. | තත්‍ය 2022 රු. | |
|---|---|---|---|---|---|
| | **ආදායම් ලැබීම්** | | | | |
| - | ආදායම් බදු | 1 | - | - | |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| 1,745,000,000 | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | 1,790,807,383 | 1,650,494,125 | |
| **1,745,000,000** | **මුළු ආදායම් ලැබීම් (අ)** | | **1,790,807,383** | **1,650,494,125** | |
| | **ආදායම් නොවන ලැබීම්** | | | | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 369,923,199,465 | 86,765,544,160 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 195,705,368 | 125,683,366 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 681,798,712 | 725,454,832 | ඒසීඒ-5 |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම | අනුකූල නොවේ | 02/2018 (ii) චක්‍රලේඛය මගින් කාර්ය සාධන ගිවිසුම් අත්සන් | |

| අංකය | අදාළ අවශ්‍යතා | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනනුකූලතාවන් සඳහා කෙටි පැහැදිලි කිරීම | අනාගතයේ දී අනනුකූලතා වන් වැලැක්වීමට යෝජිත නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| | වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | | කිරීම අවලංගු කිරීම. | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම | අනුකූල වේ | | |
| 20 | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂය සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |

# ස්වදේශ කටයුතු අංශය

## පරිච්ඡේද


**1. ආයතන පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය ... 1**

1.1. හැඳින්වීම ... 1
1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණ ... 2
1.3. ප්‍රධාන කාර්යයන් ... 3
1.3.1. පාලන අංශය ... 3
1.3.2. සංවර්ධන අංශය ... 3
1.3.3. මූල්‍ය අංශය ... 4
1.3.4. විමර්ශන අංශය ... 4
1.3.5. ස්වදේශ කටයුතු අංශය ... 5
1.3.5.1. දිස්ත්‍රික් පාලන අංශය ... 5
1.3.5.2. ප්‍රාදේශීය පාලන අංශය ... 6
1.3.5.3. ග්‍රාම නිලධාරී පාලන අංශය ... 6
1.3.6. අභ්‍යන්තර විගණන අංශය ... 6
1.3.7. ඉංජිනේරු අංශය ... 7
1.3.8. ක්‍රමසම්පාදන අංශය ... 7
1.3.9. ප්‍රාදේශීය පරිපාලන ප්‍රතිසංස්කරණ අංශය ... 7
1.4. සංවිධාන සටහන ... 9
1.5. අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු / ආයතන ... 11
1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු ... 11

**2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම, විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක ... 12**

2.1. ප්‍රගතිය හා ඉදිරි දැක්ම, විශේෂ ජයග්‍රහණ ... 12
2.1.1. මූල්‍ය අංශය ... 12
2.1.2. විමර්ශන අංශය ... 12
2.1.3. ස්වදේශ කටයුතු අංශය ... 12
2.1.3.1. දිස්ත්‍රික් පාලන අංශය ... 12
2.1.3.2. ප්‍රාදේශීය පාලන අංශය ... 12
2.1.3.3. ග්‍රාම නිලධාරී පාලන අංශය ... 12
2.1.4. ඉංජිනේරු අංශය ... 12
2.1.5. ක්‍රමසම්පාදන අංශය ... 13
2.1.6. ප්‍රාදේශීය පරිපාලන ප්‍රතිසංස්කරණ අංශය ... 13
2.2. අභියෝග ... 15
2.2.1. පාලන අංශය ... 15
2.2.2. සංවර්ධන අංශය ... 15
2.2.3. මූල්‍ය අංශය ... 15
2.2.4. විමර්ශන අංශය ... 15
2.2.5. ස්වදේශ කටයුතු අංශය ... 16
2.2.5.1. දිස්ත්‍රික් පාලන අංශය ... 16
2.2.5.2. ග්‍රාම නිලධාරී පාලන අංශය ... 16
2.2.6. ඉංජිනේරු අංශය ... 16
2.2.7. ප්‍රාදේශීය පරිපාලන ප්‍රතිසංස්කරණ අංශය ... 16
2.3. අනාගත ඉලක්ක ... 17
2.3.1. පාලන අංශය ... 17
2.3.2. සංවර්ධන අංශය ... 17
2.3.3. මූල්‍ය අංශය ... 17
2.3.4. විමර්ශන අංශය ... 17
2.3.5. ස්වදේශ කටයුතු අංශය ... 18
2.3.5.1. දිස්ත්‍රික් පාලන අංශය ... 18
2.3.5.2. ප්‍රාදේශීය පාලන අංශය ... 18

2.3.5.3. ග්‍රාම නිලධාරී පාලන අංශය ........ 18
2.3.6. ඉංජිනේරු අංශය ........ 18
2.3.7. ක්‍රමසම්පාදන අංශය ........ 18

**4. කාර්යසාධන දර්ශක ........ 19**

**5. තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය ........ 22**

5.1. හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු ........ 22
5.2. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග ........ 26
5.2.1. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ ........ 26
5.2.1.1. සංවර්ධන අංශය ........ 26
5.2.1.2. මූල්‍ය අංශය ........ 26
5.2.1.3. විමර්ශන අංශය ........ 26
5.2.1.4. ඉංජිනේරු අංශය ........ 26
5.2.1.5. ප්‍රාදේශීය පරිපාලන ප්‍රතිසංස්කරණ අංශය ........ 27
5.2.2. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ අභියෝග ........ 27
5.2.2.1. සංවර්ධන අංශය ........ 27
5.2.2.2. මූල්‍ය අංශය ........ 27
5.2.2.3. විමර්ශන අංශය ........ 27
5.2.2.4. ඉංජිනේරු අංශය ........ 27
5.2.2.5. ප්‍රාදේශීය පරිපාලන ප්‍රතිසංස්කරණ අංශය ........ 28

**6. මානව සම්පත් පැතිකඩ ........ 29**

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය ........ 29
6.3. මානව සම්පත් සංවර්ධනය ........ 33

**7. අනුකූලතා වාර්තාව ........ 38**

## 01. ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1. හැඳින්වීම

ආරක්ෂක අමාත්‍යාංශය යටතේ අභ්‍යන්තර ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය ලෙස 2020.11.20 සිට 2021.02.16 දින දක්වා පැවති මෙම අමාත්‍යාංශය 2021.02.16 දින සිට ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය ලෙස තනි ඒකකයක් වශයෙන් ක්‍රියාත්මක විය.

2022 මැයි මස 27 වන දින නිකුත් කරන ලද අති විශේෂ ගැසට් නිවේදනය පරිදි රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ලෙස වර්තමානයේ දී ක්‍රියාත්මක වේ.

**පසුබිම**

**සිවිල් පරිපාලනය, පහසුකම් සැපයීම සහ සම්බන්ධීකරණ කටයුතු වල කේන්ද්‍රස්ථානය වශයෙන් ඊට අදාළ සේවා සහ ඒවායේ ප්‍රධාන අංශ වන දිස්ත්‍රික් පරිපාලනය, සිවිල් ලියාපදිංචි කටයුතු සහ සේවක සුභ සාධනය යන කටයුතු ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය මඟින් ඉටු කෙරේ. රජයේ ජාතික ප්‍රමුඛතාවයන් හා සමගාමීව සමාජ හා ආර්ථික සංවර්ධනය ඉලක්ක කර ගනිමින් සංවිධානමය කාර්ය සාධනය සුවිශිෂ්ටත්වය උදෙසා වන රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, මානව සම්පත් කළමනාකරණය, ආයතනික සංවර්ධනය, විද්‍යුත් තාක්ෂණික ක්‍රම භාවිතය හරහා විශිෂ්ඨ සේවයක් සැපයීම මඟින් සෞභාග්‍යමත් දේශයක් විනයානුකූල සමාජයක් සහ සතුටුදායක පවුලක් තුළ වෙසෙන ඵලදායී පුරවැසියන් බිහි කිරීමට සහයෝගය සහ දායකත්වය සැලසීම ප්‍රමුඛ කාර්යයන් වේ.**

**උප අංශ**

- **ප්‍රධාන අභ්‍යන්තර අංශ**
  - පාලන අංශය
  - සංවර්ධන අංශය
  - මූල්‍ය අංශය
  - විමර්ශන අංශය
  - ස්වදේශ කටයුතු අංශය
  - අභ්‍යන්තර විගණන අංශය
  - ඉංජිනේරු අංශය
  - ක්‍රමසම්පාදන අංශය
  - ප්‍රාදේශීය පරිපාලන ප්‍රතිසංස්කරණ අංශය
- **සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල**
- **සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල**

## 1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

### දැක්ම



"ජාතියේ උන්නතිය උදෙසා වන සුවිශේෂී සේවාවක් සැපයීම"

### මෙහෙවර



**"භෞමික අඛණ්ඩතාවයෙන් යුත් සුරක්ෂිත, ස්වෛරී රටක් තහවුරු කිරීම උදෙසා උපායමාර්ගික සැලසුම් හා ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාවට නැංවීම."**

### අරමුණු



- රට තුළ වඩාත් සංවේදී සහ ජනතා හිතවාදී රාජ්‍ය සේවයක් ස්ථාපිත කිරීමට කැපවීම සහ කටයුතු කිරීම.
- ආයතනවල මානව සහ භෞතික සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීම තුළින් ඵලදායීතාවය ඉහළ නැංවීම.
- ජාතික අමාත්‍යාංශවල ක්‍රියාදාමය ප්‍රාදේශීය මට්ටමින් ශක්තිමත් කිරීම සඳහා දායකත්වයක් ලබාදීම. (දිස්ත්‍රික්ක / ප්‍රාදේශීය / ග්‍රාමීය මට්ටම )
- ප්‍රාදේශීයව ඇති සමාජ ආර්ථික යටිතල පහසුකම්වල අසමානතා අවම කිරීම.
- අන්තර්ජාතික පිරිවිතරයන් හා ප්‍රමිතීන්ට අනුකූලව, ශ්‍රී ලාංකේය අනන්‍යතාව හා ජාතික ආරක්ෂාව තහවුරු කරමින්, සංචරන පාලන කටයුතු මෙහෙයවීම.
- ශ්‍රී ලාංකේය පුරවැසියන් ලියාපදිංචි කරමින් ජාතික පුද්ගල නාම ලේඛනයක් ස්ථාපිත කර, පුද්ගල අනන්‍යතාව තහවුරු කිරීම උදෙසා හිමිකම් ලබන තැනැත්තන් හට හඳුනා ගැනීමේ පත්‍ර නිකුත් කිරීම.

## 1.3. ප්‍රධාන කාර්යයන්

### 1.3.1. පාලන අංශය

- මානව සම්පත් කළමනාකරණය
- කාර්යාල කළමනාකරණය.
- ඵලදායිතා කළමනාකරණ ප්‍රවේශයන් ඔස්සේ කාර්යාල ක්‍රමවේද ඉහළ නැංවීම.
- කළමනාකරණ කටයුතුවලට අදාළ වන උපාංග නඩත්තු කිරීම හා පාලනය කිරීම.
- පහසුවෙන් වැඩකළ හැකි වැඩ පරිසරයක් ඇති කිරීම උදෙසා ගුණාත්මක සහ ඵලදායි ලෙස නවීන තොරතුරු තාක්ෂණික ක්‍රම ක්‍රියාත්මක කිරීම.
- කාර්යක්ෂම හා ඵලදායිතාවයෙන් පිරිපුන් කාර්ය මණ්ඩලයක් ඇති කිරීම සඳහා නිලධාරින් වෙත පුහුණු අවස්ථා ලබාදීම.
- මනා සම්බන්ධීකරණය තුලින් ආයතන අතර මිත්‍රශීලී සම්බන්ධතාවයක් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.
- අමාත්‍යාංශය පිළිබඳව සහ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක සේවාවන් පිළිබඳ තොරතුරු වෙත මහජනතාවට පහසුවෙන් ප්‍රවේශ වීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.
- තොරතුරු පනත යටතේ මහජනතාව වෙතින් ලැබෙන ඉල්ලීම් සඳහා වඩාත් පහසු ලෙස තොරතුරු ලබා ගැනීමට අවශ්‍ය ක්‍රමවේදයන් පවත්වාගෙන යාම.
- අමාත්‍යාංශය වෙත ලැබෙන මහජන පැමිණිලිවලට කඩිනමින් විසඳුම් ලබාදීම සඳහා ක්‍රමවේදයක් පවත්වාගෙන යාම.
- අමාත්‍යාංශයට අයත් සංචාරක බංගලා සම්බන්ධ කටයුතු අධීක්ෂණය කිරීම, සේවාලාභීන්ට ගැටලුවකින් තොරව සංචාරක බංගලා වෙන්කරගැනීමට හැකිවන පරිදි කටයුතු සම්පාදනය කිරීම.
- අමාත්‍යාංශයේ කටයුතු සඳහා අවශ්‍ය ක්‍රියාකාරි ප්‍රවාහන සංචිතයක් පවත්වාගෙන යාම.
- අමාත්‍යාංශයේ සියලුම අංශ සඳහා සහ අමාත්‍යාංශය යටතේ පාලනය වන දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා අවශ්‍ය අවස්ථාවන්හීදී නීතිමය කාර්යයන් ඉටුකර දීමට හැකියාව ඇති නීති ඒකකයක් පවත්වාගෙන යාම.
- අනිකුත් අංශ වෙතින් ලැබෙන අමාත්‍ය මණ්ඩල සංදේශ කෙටුම්පත් කිරීම, සංශෝධනය කිරීම සහ අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත යොමු කිරීම.
- අමාත්‍ය මණ්ඩලය වෙතින් ලැබෙන අමාත්‍ය මණ්ඩල තීරණ සඳහා අදාළ ක්‍රියා මාර්ග ගැනීමට අදාළ අංශ වෙත යොමු කිරීම.
- පාර්ලිමේන්තු ප්‍රශ්නවලට පිළිතුරු සකස් කිරීම හා එම පිළිතුරු වාර්තා ත්‍රෛභාෂාවෙන් සකස් කර පාර්ලිමේන්තුව වෙත ලබා දීම.
- මහජන පෙත්සම් කාරක සභා, උපදේශක කාරක සභා, ආංශික අධීක්ෂණ කාරක සභා රැස්වීම් සම්බන්ධ කටයුතු කිරීම.
- අමාත්‍යාංශය යටතේ ඇති දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සහ රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව වෙතින් ලැබෙන දේශීය හා විදේශීය නිවාඩු අනුමත කිරීමේ කටයුතු සිදු කිරීම.
- අමාත්‍යාංශයේ තැපැල් ඒකකයට සම්බන්ධ කටයුතු මෙහෙයවීම හා අධීක්ෂණය.
- මැතිවරණ සම්බන්ධ අමාත්‍යාංශයේ සම්බන්ධීකරණ කටයුතු.
- රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ආයතනික කටයුතු සම්බන්ධයෙන් අමාත්‍යාංශය මඟින් සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

### 1.3.2. සංවර්ධන අංශය

- ස්වදේශ කටයුතු අංශයට අදාළ ගොඩනැගිලි සහ වෙනත් ඉදිකිරීම් සම්බන්ධ ප්‍රසම්පාදන කළමනාකරණය.
- ඉදිකිරීම් හා සම්බන්ධ ප්‍රාග්ධන වියදම් වැය ශීර්ෂයට අදාළව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සහ එම සැලැස්ම අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාල සඳහා අරමුදල් වෙන් කිරීම.
- ඉදිකිරීම් වැය ශීර්ෂය යටතේ අරමුදල් වෙන් කෙරෙන ව්‍යාපෘතීන්හි භෞතික හා මූල්‍ය ප්‍රගතිය අධීක්ෂණය කිරීම සහ අවශ්‍ය අවස්ථාවන්හිදී අවශ්‍ය මඟ පෙන්වීම් සිදු කරමින් මෙම ව්‍යාපෘතිවල ප්‍රගතිය පිළිබඳ පසු විපරම් සිදු කිරීම.
- ඉදිකිරීම් නොවන අනෙකුත් සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය විමසීම.
- දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සහ ගොඩනැගිලි ඉදිකිරීම් හා යටිතල පහසුකම්වල ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා එක් එක් ක්‍රියාකාරකම වෙනුවෙන් වෙන් කර ඇති

අරමුදල් උපරිම හා කාර්යක්ෂම අන්දමින් උපයෝගි වන බව සහතික කිරීම සඳහා එම ක්‍රියාකාරකම්වල ප්‍රගතිය අධීක්ෂණය කිරීම.

- මුදලට සරිලන වටිනාකම, විනිවිදභාවය ඇතුළු ප්‍රසම්පාදන මූල ධර්ම අනුගමනය කිරීම සහ රාජ්‍ය ප්‍රසම්පාදන පටිපාටිවලට අනුගතව කටයුතු කිරීම සහතික කරමින් මුළු පිරිවැය ඇස්තමේන්තුව රුපියල් මිලියන 200 ඉක්මවන ඉදිකිරීම්වලට අදාළ කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් කාලීන හා ගුණාත්මක ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීම.
- සංවර්ධන අංශය මෙන්ම දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ඍජුව ක්‍රියාවට නංවනු ලබන හෝ මෙහෙයවනු ලබන ඉදිකිරීම් හා සංවර්ධන ව්‍යාපෘති හා සම්බන්ධ ප්‍රගති වාර්තා ප්‍රසම්පාදන වාර්තා සහ වෙනත් තොරතුරු භාණ්ඩාගාරය, මුදල් අමාත්‍යාංශය, ජනාධිපති ලේකම් කාර්යාලය හා අගමැති කාර්යාලය වැනි අදාළ නියෝජිතායතන වෙත ඉදිරිපත් කිරීම.
- ප්‍රසම්පාදන කටයුතු හා අරමුදල් වෙන්කිරීම සැලසුම් කිරීමේදී සැලකිල්ලට ගත යුතු යටිතල පහසුකම් සංවර්ධනයට අදාළ ඉදිකිරීම් අවශ්‍යතා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ලබාගැනීම සහ ඒවා ඇගයුමට ලක් කිරීම.
- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සීමා නිර්ණය කිරීම සම්බන්ධ කටයුතු සිදු කිරීම.
- අලුත් ගමක් අලුත් රටක් ජාතික ඒකාබද්ධ සහභාගීත්ව සංවර්ධන වැඩසටහන යටතේ දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ කාර්ය සාධන ගිවිසුම සම්බන්ධව වාර්ෂික ප්‍රගතිය කාර්තුමය වශයෙන් යාවත්කාලීන කිරීම.
- අලුත් ගමක් අලුත් රටක් ජාතික ඒකාබද්ධ සහභාගීත්ව සංවර්ධන වැඩසටහන යටතේ දිස්ත්‍රික් මට්ටමින් ප්‍රගති සමාලෝචන රැස්වීම් සම්බන්ධව කටයුතු කිරීම.
- ආහාර ප්‍රතිපත්ති කමිටුව සඳහා සහභාගි වීම.
- ගරු රාජ්‍ය අමාත්‍යතුමාගේ රාජකාරි කටයුතු සම්බන්ධව කටයුතු කිරීම.
- සියලුම ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු (දිස්ත්‍රික් ලේකම් කාර්යාල/ ප්‍රාදේශීය ලේකම් කාර්යාල/ ග්‍රාම නිලධාරි කාර්යාල/ සේවා පියස)
- නිල සෙවන ව්‍යාපෘතියේ ඉදිකිරීම් ක්‍රියාවට නැංවීම සහ එහි ප්‍රගතිය සමාලෝචනය කිරීම.
- දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ පවත්වන සම්බන්ධීකරණ කමිටුවල ප්‍රතිපත්තිමය කටයුතු.
- දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවල ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පහසුකරන වැඩපිළිවෙල සකස් කිරීම.
- “පිබිදෙමු පොලොන්නරුව” වැඩසටහනට අදාල ව්‍යාපෘතීන් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම හා එහි ප්‍රගතිය අධීක්ෂණය කිරීම.
- රජයේ නිවාස සම්බන්ධව කටයුතු කිරීම, පොදු සේවා නිවාස හා උපලේඛනගත නිවාස පැවරීම, කාලය දීර්ඝ කිරීම, අලුත්වැඩියා කිරීම ආදී කටයුතු.
- දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අයත්වන රජයේ නිවාසවල ආර්ථික කුලිය අය කිරීම සම්බන්ධ කටයුතු.
- ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිල නිවාස සම්බන්ධ කටයුතු කිරීම.
- ස්වදේශ කටයුතු අංශයේ අධීක්ෂණය යටතේ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන මඟින් දිවයින පුරා ක්‍රියාත්මක කෙරෙන සියලුම සංවර්ධන ව්‍යාපෘති මෙහෙයවීම, ඇගයීම, වාර්තාකරණය සහ සම්බන්ධීකරණය.

### 1.3.3. මූල්‍ය අංශය

- ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය.
- ප්‍රසම්පාදන කළමනාකරණය.
- මූල්‍ය කළමනාකරණය සඳහා නවීන තාක්ෂණික ක්‍රම උපයෝගි කර ගැනීම.
- වත්කම් කළමනාකරණය.
- මූල්‍ය කළමනාකරණය පිළිබඳ පුහුණුව හා සංවර්ධනය සම්බන්ධ කටයුතු.
- විගණන සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය.
- රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට අදාළ ක්‍රියාකාරකම් අධීක්ෂණය හා පසු විපරම් කිරීම.

### 1.3.4. විමර්ශන අංශය

- 2016 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා මෙම අංශයට විවිධ ආකාරයට (ලිපි, ජනාධිපති කාර්යාල, අග්‍රාමාත්‍ය කාර්යාල ආදි කාර්යාලවලින් ලැබෙන පැමිණිලි සහ දෛනික පුවත්පත්, රූපවාහිනී, 1905 මහජන පැමිණිලි ඒකකය මෙන්ම අන්තර්ජාලය ඔස්සේ) ලද පැමිණිලි පරීක්ෂා කර බලා එම පැමිණිලි වලට අදාල අංශ 07ක් හඳුනාගෙන

ඇති අතර ඒවා ඇති වීමට හේතු සහ එකී අඩුපාඩු මඟ හැරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග හඳුනාගැනීම. (අදාළ අංශ 07 - ඉඩම් ගැටලු, රාජ්‍ය නිලධාරීන්ගේ අකටයුතුකම්, රාජ්‍ය දේපළ අවභාවිතා කිරීම, මූල්‍ය වංචා,නීති විරෝධී ව්‍යාපාර, යටිතල පහසුකම් අක්‍රමිකතා, මානව හිමිකම් කඩවීම්)

- මෙම අඩුපාඩු මගහරවා ගැනීමේ එක් පියවරක් ලෙස දිස්ත්‍රික් හා ප්‍රාදේශීය පරිපාලන නිලධාරීන් (දිස්ත්‍රික් ලේකම්, අතිරේක දිස්ත්‍රික් ලේකම්වරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගණකාධිකාරීවරුන් සහ අධ්‍යක්ෂ (සැලසුම්) දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්, සහකාර ප්‍රාදේශිය ලේකම්වරුන්, ගණකාධිකාරීවරුන්, සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ සැලසුම් සහ එම කාර්යාලවල පරිපාලන ග්‍රාම නිලධාරීන්, පරිපාලන නිලධාරීන්) දැනුවත් කිරීම සඳහා ROAD MAP FOR THE BETTER SERVICE වැඩසටහන් මාලාව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ මූල්‍ය හා සම්පත් දායකත්වය යටතේ මෙන්ම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සම්පත් දායකත්වය යටතේ ගාල්ල, මාතර, රත්නපුර දිස්ත්‍රික්කවල පැවැත්වීම. එහිදී තමන් අතින් සිදුවිය හැකි වැරදි අවම කර කාර්යක්ෂම සේවාව සපයා ගැනීම සඳහා රාජ්‍ය නිලධාරීන් 1145 දෙනෙකු දැනුවත් කර ඇත.
- කොළඹ දිස්ත්‍රික්කයට අදාළ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, කැස්බෑව, කඩුවෙල, සීතාවක සහ තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ග්‍රාම නිලධාරී කාර්යාලවල හදිසි කාර්යාල පරීක්ෂණ පැවැත්වීම.
- අමාත්‍යාංශයේ විෂය පථයට අයත් සියලුම ආයතනවල මූලික විමර්ශන කටයුතු සිදු කිරීම හා මූලික විමර්ශනයෙන් අනාවරණය වන කරුණු අනුව චෝදනාපත්‍ර කෙටුම්පත් අදාළ විනය බලධාරීන් වෙත යොමු කිරීම.
- විධිමත් විනය පරීක්ෂණවලදී සාක්ෂි ලබා දීම.
- විධිමත් විනය පරීක්ෂණවලදී පැමිණිල්ල මෙහෙයවීම.
- මූලික විමර්ශන සිදු නොකරන පැමිණිලි සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම්/අදාළ පාර්ශව වෙතින් වාර්තා කැඳවා එමඟින් විසඳුම් ලබාදීමට කටයුතු කිරීම. (කාරණා ගොනු නඩත්තු කිරීම).
- එක් එක් ආයතනවල ඇති නව නිර්මාණ ඉහළ කළමනාකාරීත්වයේ අවධානයට යොමු කිරීම තුළින් ඇගයීම් ලබාදීම.
- පැමිණිලි පාර්ශවය හා පැමිණිල්ලේ සඳහන් කාරණාවලට අදාල රාජ්‍ය නිලධාරීන් විමර්ශන අංශය වෙත කැඳවා කඩිනමින් එම ගැටළු විසඳීමට කටයුතු කිරීම.
- වෙනත් අමාත්‍යාංශවල ඉල්ලීම මත එම අමාත්‍යාංශවල පැවැත්වෙන විමර්ශන හා පැමිණිල්ල මෙහෙයවීමේ කටයුතු සඳහා විමර්ශන නිලධාරීන් යොමු කිරීම.
- ග්‍රාම නිලධාරීන් සඳහා පුහුණු අත්පොතක් සකස් කිරීමට කටයුතු ආරම්භ කිරීම.

### 1.3.5. ස්වදේශ කටයුතු අංශ
### 1.3.5.1. දිස්ත්‍රික් පාලන අංශය

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සේවයේ නියුතු මාණ්ඩලික මෙන්ම මාණ්ඩලික නොවන සියලුම නිලධාරීන්ගේ ආයතන කටයුතු
- ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අනුයුක්ත සංවර්ධන නිලධාරීන්ගේ සියළුම ආයතන කටයුතු
- දිස්ත්‍රික් පරිපාලන කටයුතු වලට අදාළව උපදෙස් / චක්‍රලේඛ නිකුත් කිරීම.
- දිස්ත්‍රික් පරිපාලන කටයුතු සම්බන්ධයෙන් ලැබෙන පොදු ලිපි සම්බන්ධයෙන් කටයුතු කිරීම.
- දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සේවය කරන නිලධාරීන්ගේ දේශීය පුහුණු අවශ්‍යතා සම්බන්ධයෙන් කටයුතු කිරීම.
- දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ මාසික සමුළු පැවැත්වීම
- රාජ්‍ය උත්සව සංවිධාන කටයුතු
- වන්දනා ගමන් ආඥා පනතට අදාළ කටයුතු
- 1971 අංක 29 දරණ නිවාඩු පනත අනුව පොහොය දින, රජයේ සහ බැංකු නිවාඩු සම්බන්ධව කටයුතු
- සමාජ තෑගි තරග වලට අදාල සියළුම කටයුතු සහ ඊට සම්බන්ධ සියළු ලිපි හා ලේඛණ යාවත්කාලීනව පවත්වාගෙන යාම.
- උත්සව භාණ්ඩ නිකුත් කිරීම සම්බන්ධ කටයුතු
- ග්‍රාම නාම වෙනස් කිරීම
- ජනරජ ප්‍රමුඛතා ලේඛනය යාවත්කාලීන කිරීම.

- පාර්ලිමේන්තු ප්‍රශ්න සම්බන්ධ කටයුතු (අදාල විෂය ලිපිකරුගෙන් පිළිතුරු ලබා ගෙන අවසාන පිළිතුරු යැවීම සහ ඒ සම්බන්ධව පොදු ගොනුවක් පවත්වා ගැනීම)
- පුපුරන ද්‍රව්‍ය බලපත්‍ර පොත් නිකුත් කිරීම සම්බන්ධ කටයුතු
- දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල කාර්ය මණ්ඩල පුරප්පාඩු, සමාලෝචන වාර්තා සම්බන්ධ කටයුතු

### 1.3.5.2. ප්‍රාදේශීය පාලන අංශය

- ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ පත් කිරීම්/උසස් කිරීම්/ස්ථානමාරු සඳහා නිර්දේශ ලබාදීම.
- සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ පත් කිරීම්/උසස් කිරීම්/ස්ථානමාරු සඳහා නිර්දේශ ලබාදීම හා පත් කිරීම.
- ක්‍රම සම්පාදන සේවයේ නිලධාරීන්ගේ පත් කිරීම්/උසස් කිරීම්/ස්ථානමාරු සඳහා නිර්දේශ ලබාදීම හා පත් කිරීම.
- ගණකාධිකාරී සේවයේ නිලධාරීන්ගේ පත් කිරීම්/උසස් කිරීම්/ස්ථානමාරු සඳහා නිර්දේශ ලබාදීම හා පත් කිරීම.
- පරිපාලන නිලධාරීන්ගේ නිලධාරීන්ගේ පත් කිරීම්/උසස් කිරීම්/ස්ථානමාරු සඳහා නිර්දේශ ලබාදීම හා පත් කිරීම.
- භාෂා පරිවර්තක නිලධාරීන්ගේ පත් කිරීම්/උසස් කිරීම්/ස්ථාන මාරු සඳහා නිර්දේශ ලබාදීම හා පත් කිරීම.
- කළමනාකරණ සේවා නිලධාරීන්ගේ පත් කිරීම්/ උසස් කිරීම්/ස්ථාන මාරු සඳහා නිර්දේශ ලබාදීම හා පත් කිරීම.
- රියදුරු/කාර්යාල කාර්යය සහයක/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර නිලධාරීන්ගේ පත් කිරීම්/ උසස් කිරීම්/ස්ථාන මාරු සඳහා නිර්දේශ ලබාදීම හා පත් කිරීම.
- මාණ්ඩලික නිලධාරීන්ගේ දේශිය පශ්චාත් උපාධි පාඨමාලා සඳහා ප්‍රතිපාදන අනුමත කිරීම.
- විදේශ නිවාඩු ඉල්ලීම් නිර්දේශ කිරීම හා විදේශ පුහුණු නිර්දේශ කිරීම.
- විශ්‍රාම ගැන්වීම් නිර්දේශ කිරීම හා විශ්‍රාමික ප්‍රාදේශීය ලේකම්වරුන් සඳහා වාහන බලපත්‍ර නිකුත් කිරීම.
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා අවශ්‍ය පරිදි කාර්ය මණ්ඩල අනුමැතිය ලබාදීම.
- අමාත්‍යාංශයට යොමුවන මහජන ගැටලු සම්බන්ධයෙන් විසඳුම් ලබාදීමට අදාළ වාර්තා කැඳවීම හා විසඳුම් ලබා දීමට කටයුතු කිරීම.
- ප්‍රාදේශීය පරිපාලනයට අදාළ වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු අතර සම්බන්ධීකරණය.

### 1.3.5.3. ග්‍රාම නිලධාරී පාලන අංශය

- ග්‍රාම නිලධාරීන් හා පරිපාලන ග්‍රාම නිලධාරීන් බඳවා ගැනීම, ස්ථිර කිරීම, උසස් කිරීම, කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම, ස්ථාන මාරු සිදු කිරීම, විනය පාලනය, විශ්‍රාම ගැන්වීම හා ග්‍රාම නිලධාරී හරහා සිදුවන මහජන සේවාවලට අදාළ ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට සහාය වීම යන කාර්යයන් මෙම අංශයේ විෂය පථයට අයත් කාර්යයන් වේ. ග්‍රාම නිලධාරීන්ගේ සේවා පහසුකම් වැඩිදියුණු කරමින් ග්‍රාම නිලධාරීන් මඟින් ලබා දෙන මහජන සේවය ප්‍රශස්ථ මට්ටමක පවත්වා ගැනීමට නිරන්තරයෙන් කටයුතු කරමින් සිටියි.

### 1.3.6. අභ්‍යන්තර විගණන අංශය

- වාර්ෂික විගණන සැලැස්ම පරිදි අභ්‍යන්තර විගණන සිදු කර අනාවරණය කරගත් අඩුපාඩු හා නිර්දේශ සාකච්ඡා කිරීමේ යාන්ත්‍රණයක් ලෙස කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/01/2019 ඡේද අංක 5.3 හි උපදෙස් පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04ක් පැවැත්වීම.
- කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/01/2019 ඡේද අංක 5.3 හි උපදෙස් පරිදි දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 තුළ හා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ කාර්තුගතව පැවැත්වෙන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 104 කට අමාත්‍යාංශ නියෝජිත ලෙස සහභාගී වීම.
- රෙජිස්ට්‍රාර් ජනාරල් දෙපාර්තමේන්තුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා අමාත්‍යාංශයේ එක් එක් අංශ වලට අදාල වන ලෙස මූල්‍ය විගණනය, කාර්යසාධන විගණනය, මුදලට අගය විගණනය, පද්ධති විගණනය ලෙස අභ්‍යන්තර විගණනයන් සිදු කිරීම මඟින් විගණන විමසුම් නිකුත් කිරීම.
- දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 හි ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන්ගේ විගණන වාර්තා

පසුවිපරම් සිදු කිරීම තුලින් අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය තහවුරු කිරීම.

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි ප්‍රධාන අභ්‍යන්තර විගණකවරුන්ගේ කාර්තු වාර්තා පදනම්ව කාර්තුගතව අමාත්‍යාංශ ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ වාර්තාව සකස්කර මහා භාණ්ඩාගාරය වෙත යොමු කිරීම.

## 1.3.7. ඉංජිනේරු අංශය

- මෙම අමාත්‍යාංශයේ ස්වදේශ කටයුතු අංශය මඟින් ප්‍රතිපාදන වෙන් කරනු ඉදිකිරීම් ව්‍යාපෘති අධීක්ෂණය හා උපදේශනය ලබා දීමට අදාළ උපදේශන ආයතනයන් සම්බන්ධීකරණය කිරීම.
- ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය මගින් ප්‍රතිපාදන වෙන් කරනු ලබන මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.මිලියන 200 ඉක්මවන ඉදිකිරීම් ව්‍යාපෘතිවලට අදාල සැලසුම් ඇස්තමේන්තු හා මිල විචල්‍යතා වාර්තා පිළිබද නිර්දේශ ලබා දීම.
- ප්‍රාදේශීය මට්ටමේ ඉදි කිරීම් අලුත්වැඩියාවන් සිදු කිරීම
- සියලුම ඉදිකිරීම් සම්බන්ධ ව්‍යාපෘතිවල ප්‍රගතිය විමසීම
- කවර හෝ ප්‍රතිපාදන ප්‍රභවයක් යටතේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ක්‍රියාත්මක කරනු ලබන යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සම්බන්ධව ඉංජිනේරුමය උපදේශන කටයුතු සිදු කිරීම.
- දිස්ත්‍රික් ඉංජිනේරු, තාක්ෂණික නිලධාරී, සහ තාක්ෂණ සහායක නිලධාරීන්ගේ වෘත්තීමය කාර්යභාරය අධීක්ෂණය
- අමාත්‍යාංශ/ දිස්ත්‍රික් ඉංජිනේරුවරුන්ගේ වරලත් සුදුසුකම් තත්ව ලබා ගැනීමේ කටයුතු සඳහා පහසුකම් සැපයීම සහ තාක්ෂණික කාර්ය මණ්ඩලවල පුහුණු අවශ්‍යතා සපුරාලීමට කටයුතු කිරීම.
- ඉදිකිරීම් කොන්ත්‍රාත් වලදී ඇතිවන ගැටළු වලදී බේරුම්කරණ ක්‍රියාවලිය සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාට අවශ්‍ය ඉංජිනේරුමය උපදෙස් ලබා දීම.
- අවස්ථානුකූලව විමධ්‍යගත අයවැය සම්බන්ධ ව්‍යාපෘති, වෙනත් අමාත්‍යාංශ සහ රාජ්‍ය නොවන සංවිධාන විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති සම්බන්ධ තාක්ෂණික සහ ඉංජිනේරුමය වෘත්තීමය උපදේශන කටයුතු සිදු කිරීම.

- ස්වදේශ කටයුතු අංශයට අයත් සියලුම සංචාරක බංගලාවල ඉදිකිරීම් ව්‍යාපෘති හා නඩත්තු කටයුතු ක්‍රියාත්මක කිරීමට අදාල තාක්ෂණික උපදේශනය ලබා දීම.
- “නිල මැදුර” පරිපාලන සංකීර්ණයේ නඩත්තු කටයුතු පරිපාලනය හා තාක්ෂණික උපදේශනය හා ක්‍රියාත්මක කිරීම.

## 1.3.8. ක්‍රමසම්පාදන අංශය

- අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම හා ප්‍රගති පාලනය.
- වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කර විගණකාධිපති වෙත හා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.
- දිස්ත්‍රික් කාර්යසාධන වාර්තා විගණකාධිපති වෙත හා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු.
- දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන්වල සහ අමාත්‍යාංශ සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය සමාලෝචනය හා වාර්තාකරණය.
- පාර්ලිමේන්තු අයවැය සඳහා අමාත්‍යාංශයේ වාර්ෂික ප්‍රගතිය ඉදිරිපත් කිරීම.
- ජාතික සම්පත් පැතිකඩ ඩිජිටල්කරණය.
- අවශ්‍යතාවය අනුව විශේෂ සහ අත්‍යවශ්‍ය ගැටලු සඳහා ව්‍යාපෘති සංකල්ප පත්‍රිකා පිළියෙල කිරීම හා අයවැය සම්පාදනය සඳහා මුදල් අමාත්‍යාංශය වෙත යොමු කිරීම.
- තිරසාර සංවර්ධන අභිමතාර්ථ වලට අදාළ වැඩසටහන් සහ ව්‍යාපෘති සම්බන්ධීකරණය.

## 1.3.9. ප්‍රාදේශීය පරිපාලන ප්‍රතිසංස්කරණ අංශය

- ඉ-ග්‍රාම නිලධාරි ව්‍යාපෘතිය, යාපනය ප්‍රදේශය තුළ ඉන්කියුබේටර්/ ඇක්සලරේටර් සඳහා ව්‍යාපාරික මධ්‍යස්ථානයක් ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීම සඳහා වූ ව්‍යාපෘතිය හා ප්‍රාදේශීය පරිපාලන ප්‍රතිසංස්කරණ සහාය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.
- මූලික තොරතුරු, ක්‍රියාවලීන් හා සම්පත් සඵලදායී ලෙස ඒකාබද්ධ කිරීමේ කටයුතුවලට ප්‍රමුඛත්වය ලබා දෙමින් ප්‍රාදේශීය හා දිස්ත්‍රික් පරිපාලනයට අදාළ කාර්යයන් සමාලෝචනය කිරීම.
- මහජන හිතකාමී අයුරින් වැඩ පියවර සරල කිරීමේ කටයුතු හා පුරවැසි ප්‍රඥප්ති සමාලෝචනය.

- දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම් හා ග්‍රාම නිලධාරි කොට්ඨාස මට්ටම්වල ධාරිතා සංවර්ධන හා ආකල්ප ප්‍රවර්ධන කටයුතු සඳහා සහාය ලබා දීම.
- අමාත්‍යාංශය යටතේ ඇති ආයතන හා අංශයන්හි ප්‍රගමණයට අදාල වඩාත් ප්‍රශස්ත සේවා සැපයීමේ හා අභ්‍යන්තර සම්පත් කළමනාකරණ කාර්යයන්ට සහාය වීම පිණිස රාජ්‍ය හා රාජ්‍ය නොවන පාර්ශවකරුවන් සමග සඵලදායී සහයෝගීතා ගොඩනැංවීම.



ගරු ඇමැතිතුමා
ලේකම්
අතිරේක ලේකම් (පාලන)
අතිරේක ලේකම් (ස්වදේශ කටයුතු)
අධ්‍යක්ෂ ජනරාල් (ක්‍රමසම්පාදන)
අතිරේක ලේකම් (විමර්ශන)
අතිරේක ලේකම් (ප්‍රා.පා.ප්‍රති.)
අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණ)
අධ්‍යක්ෂ ජනරාල් (ක්‍රමසම්පාදන)
ප්‍රධාන මූල්‍ය නිලධාරී
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන)
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (දිස්ත්‍රික් පරිපාලන)
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ප්‍රා.පරි.)
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ග්‍රා.නි.පා)
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (සංවර්ධනය)
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (විමර්ශන)
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ප්‍රා.පා.ප්‍රති.)
අධ්‍යක්ෂ (තො. තා)
ප්‍රධාන ඉංජිනේරු
අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන)
ප්‍රධාන ගණකාධිකාරී
ප්‍රධාන අභ්‍යන්තර විගණක
සහකාර ලේකම් (පාලන)
සහකාර ලේකම් (පුහුණු)
සහකාර අධ්‍යක්ෂක (තො. තා)
නීති නිලධාරී
සහකාර ලේකම්
නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන)
ඉංජිනේරු
පරීක්‍ෂ කළමනාකරු
ගෘහ නිර්මාණ ශිල්පී
නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන)
ගණකාධිකාරී
අභ්‍යන්තර විගණක
පරිපාලන නිලධාරී
පරිවර්තක (සිංහල දෙමළ) (සිංහල ඉංග්‍රීසි)
තො.ස.තා.නි.
තො.ස.තා.ස.
මාධ්‍ය නිලධාරී
විමර්ශන නිලධාරී
සහකාර පරීක්‍ෂ කළමනාකරු
කාර්මික නිලධාරී
කාර්මික සහකාර
කෙටුම්පත්කරු
සං. නි.
කළ.සේ.නි.
ඡායාරූප ශිල්පියා
වීඩියෝ කැමරා ශිල්පියා
සහකාර ඡායාරූප ශිල්පියා
රියදුරු
සංචාරක බංගලා භාරකරු
සහායක සංචාරක බංගලා භාරකරු
කා.සේ.සේ

## 1.5. අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු / ආයතන

**ස්වදේශ කටයුතු අංශය**

- සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල
- සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල
- රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

## 1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

අ) **ව්‍යාපෘතියේ නම** : යාපනය ප්‍රදේශය තුළ ඉන්කියුබේටර්/ ඇක්සලරේටර් සඳහා ව්‍යාපාරික මධ්‍යස්ථානයක් ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීම

ආ) **දායක නියෝජිතායතනය** : ඉන්දියානු රජය (රු. මිලියන 250)

ඇ) **ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම**: රු. මි. 307

ඈ) **ව්‍යාපෘති කාල සීමාව**: 2021- 2025

# 2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම, විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

## 2.1. ප්‍රගතිය හා ඉදිරි දැක්ම, විශේෂ ජයග්‍රහණ

### 2.1.1. මූල්‍ය අංශය

- මෙහෙයුම් පිරිවැය අවම කිරීම සහ අනාගත වර්ධනය උපරිම කිරීම සඳහා කාර්යක්ෂමව මූල්‍ය වාර්තාකරණය.
- ස්වදේශ කටයුතු අංශයෙහි යෝජිත මූල්‍ය පාලනයේ නීති රීති අනුව කටයුතු කිරීම.
- ස්වදේශ කටයුතු අංශයෙහි නිසි ප්‍රසම්පාදන ක්‍රියාවලිය නිසි පරිදි පවත්වාගෙන යාම.
- ග්‍රාමීය හා ප්‍රාදේශීය පරිපාලන කටයුතු සඳහා ප්‍රතිපාදන සැපයීම.

### 2.1.2. විමර්ශන අංශය

- පැරණි විමර්ශනවල තොරතුරු සහ වර්තමාන විමර්ශනවල තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් සකස් කර පවත්වාගෙන යාම.
- අංශය තුළ සුබ සාධක සංගමයක් පිහිටුවා ගැනීම තුළින් නිලධාරින්ගේ උපන්දින, අවමංගල කටයුතු, විනෝද චාරිකා ආදි වැඩකටයුතුවලට ශක්තියක් වීම.
- ඵලදායීතා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මඟින් අංශයේ වැඩකටයුතු පහසුකර ගැනීමට කටයුතු කිරීම.
- ලේඛන ගොනු සම්බන්ධයෙන් ලේඛනාගාරයක් නඩත්තු කිරීම.
- නිලධාරීන්ගේ දැනුම, මානසික සුවය වැඩිදියුණුව උදෙසා පුස්තකාලයක් පවත්වාගෙන යාම.
- ප්‍රථමාධාර ඒකකයක් අංශය තුළ පවත්වාගෙන යාම.

### 2.1.3. ස්වදේශ කටයුතු අංශය

#### 2.1.3.1. දිස්ත්‍රික් පාලන අංශය

- 75 වන නිදහස් දින සමරු උළෙලට සමගාමීව හොඳම රුක් රෝපණ ව්‍යාපෘති ලෙස දිස්ත්‍රික් මට්ටමින් ව්‍යාපෘති 75ක් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ව්‍යාපෘති 75ක් තෝරා ගැනීම.

#### 2.1.3.2. ප්‍රාදේශීය පාලන අංශය

- රා.සේ.කො.ස චක්‍රලේඛ අංක 02/2022 අනුව දීප ව්‍යාප්තව පුරප්පාඩු පවතින ශ්‍රී.ලං.ප.සේ I ශ්‍රේණියේ ප්‍රාදේශීය ලේකම් තනතුරු සඳහා නිලධාරීන් තෝරා පත් කර ගැනීමට අදාළ සම්මුඛ පරීක්ෂණ පවත්වා එම සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල මත පත්කිරීම් සිදු කිරීම සඳහා අදාළ නිර්දේශයන් 2023.06.06 දින රා.සේ.කො.ස වෙත යොමු කරන ලදී.එම නිර්දේශයන් සඳහා 2023.07.31 දිනැති රා.සේ.කො.ස අනුමැතිය පරිදි තෝරා පත් කර ගන්නා ලද නිලධාරීන්ගේ ලේඛනය 2023.07.28 දිනැතිව නිල වෙබ් අඩවියෙහි ප්‍රසිද්ධ කරන ලද අතර එම සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල සම්බන්ධයෙන්අභියාචනා හා විරෝධතා යොමු වූ අතර එම අභියාචනා හා විරෝධතා සම්බන්ධව සමාලෝචන කටයුතු සිදු කර රා.සේ.කො.ස අනුමැතිය සහිතව තෝරා පත් කර ගන්නා ලද නිලධාරීන්ගේ ලේඛනය 2024.01.03 දින නිල වෙබ් අඩවියේ පල කරන ලදී.ඒ අනුව ප්‍රාදේශීය ලේකම්වරුන් පත් කිරීමට කටයුතු කර ඇත.

#### 2.1.3.3. ග්‍රාම නිලධාරී පාලන අංශය

- සීමිත හා කුසලතා පදනම මත පරිපාලන ග්‍රාම නිලධාරී තනතුරට ග්‍රාම නිලධාරීන් 116 ක් බඳවා ගැනීම.

### 2.1.4. ඉංජිනේරු අංශය

- රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙනුවෙන් පොදු මහජන වැසිකිළි පද්ධතියක් හා අපදා අවස්ථාවන්හි සේවා සපයන ආරක්ෂක අංශ නිලධාරීන් වෙනුවෙන් වාස්තු විද්‍යාත්මක සැලසුම් සකස් කිරීම.
- කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දිසාපතිතුමාගේ ඉල්ලීම පරිදි පාදුක්ක සමෘද්ධි බැංකුව වෙනුවෙන් කාර්යාල සංකීර්ණ වාස්තු විද්‍යාත්මක සැලසුම් සකස් කිරීම.
- ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරීන් සඳහා ප්‍රමාදව පැවති උසස් වීම් සම්බන්ධ ගැටලුව සඳහා උසස්වීම් ලබාදීම සඳහා දෙපාර්තමේන්තු පරීක්ෂණ පවත්වන ලදී.
- ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සැලසුම් ශිල්පීන් සඳහා වසර 11 1/2ක කාලයක් තුළ දෙපාර්තමේන්තු පරීක්ෂණ පවත්වා නොමැති

අතර එම නිලධාරීන් සඳහා දෙපාර්තමේන්තු පරීක්ෂණ පවත්වන ලදී.

- ඉදිකිරීම් ව්‍යාපෘතීන් කිහිපයක් මෙම වසර තුළ නිම කිරීමට පියවර ගැනීම.
- කරෙයිනගර් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදිකිරීම (අදියර II) -යාපනය ඉදිකිරීම් ව්‍යාපෘතියේ බේරුම්කරණ ක්‍රියාවලිය අවසන් කිරීම.
- ඉදිකිරීම් ව්‍යාපෘති වල ප්‍රගතිය සමාලෝචනය සඳහා නව තාක්ෂණික ක්‍රමවේදයක් අනුගමනය කිරීම.
- "නිල මැදුර" ගොඩනැගිල්ලේ මෙහෙයුම්,නඩත්තු හා අලුත්වැඩියාවන් සම්බන්ධව ක්‍රියාකාරීත්වය විධිමත් කිරීමට හැකි වීම තුළින් සියලු අංශවල නඩත්තු කාර්යයන් ක්‍රමවත් පරිදි සිදු කිරීමට හැකි වීම.

### 2.1.5. ක්‍රමසම්පාදන අංශය

- අංශයේ අභ්‍යන්තර මානව හා භෞතික සම්පත් භාවිතයෙන් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වාර්ෂික වාර්තා අමතර පිරිවැය දැරීමක් තොරව නිම කිරීම.
  I. වාර්ෂික කාර්යසාධන වාර්තාව
  II. වාර්ෂික ප්‍රගති වාර්තාව

- අත්‍යාවශ්‍ය හා හදිසි අවස්ථාවක දී හැර ලිපිද්‍රව්‍ය භාවිතය කාර්යක්ෂම කර ගැනීම සඳහා මෘදු පිටපත් මඟින් සියළුම ලේඛන පරීක්ෂා කිරීමට සියළුම නිලධාරීන් යොමු වීම, whatsapp සමූහය හරහා රාජකාරිමය දැනුම් දීම් සිදු කිරීම.

### 2.1.6. ප්‍රාදේශීය පරිපාලන ප්‍රතිසංස්කරණ අංශය

**ඉ-ග්‍රාම නිලධාරි (eGN) ව්‍යාපෘතිය**

- තිරසාර පුරවැසි සේවා සැපයීම් ක්‍රමවේදයක් උදෙසා පුළුල්, විශ්වාසනීය ඒකීය ගෘහ හා පුරවැසි දත්ත සමුදායක අවශ්‍යතාවය රාජ්‍ය ආයතන වෙත අවබෝධ කරවීම. මෙම අවශ්‍යතාව ඉ-ග්‍රාම නිලධාරි (eGN) ව්‍යාපෘතිය හරහා ඉටු වන අතර, මෙම ව්‍යාපෘතියේ නියමු අදියරේ සාර්ථකත්වයෙන් පසු ආරම්භ කළ දෙවැනි අදියර මගින් 14,022ක් වූ මුළු ග්‍රාම නිලධාරි කොට්ඨාශ අතරින් කළුතර, කොළඹ, මන්නාරම, හම්බන්තොට, ගාල්ල, පුත්තලම හා ගම්පහ යන දිස්ත්‍රික්ක 7 හි සියලුම ග්‍රා.නි.වසම් වෙත මෙම ව්‍යාපෘතියේ ප්‍රතිලාභ ලබා දීමට කටයුතු කෙරේ.
- මේ යටතේ වඩාත් පුළුල් කාර්යභාරයක් සහිත ත්‍රෛභාෂික මෘදුකාංගයක් නිර්මාණය කර ඇත. එකී මෘදුකාංගයේ ආදර්ශන පිටපත පුහුණු කාරණා සඳහා භාවිතා කරනු ලබන අතර, පිරිවැය සඵලදායී පුහුණුකරුවන් පුහුණු කිරීමේ ක්‍රමවේදය (ToT) යටතේ ග්‍රාම නිලධාරීන් 89ක් හා සෙසු නිලධාරීන් 82ක් එම මෘදුකාංගය පිළිබඳව සෙසු ග්‍රාම නිලධාරීන් අදියර ලෙස පුහුණු කිරීමට අවශ්‍ය දැනුම හා කුසලතා ලබා දී ඇත. යාවත්කාලීන කරන ලද ගෘහ හා පුරවැසි දත්ත එක්රැස් කිරීමට අදාළ ආකෘති පත්‍රයට අනුව මෙම මෘදුකාංගයේ අත්‍යාවශ්‍ය වැඩිදියුණු කිරීම් කටයුතු ආරම්භ කර ඇත. එසේම 2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත යටතේ මෙම දත්ත සියලුම නිල කාර්යයන් සඳහා ඉලෙක්ට්‍රොනිකව භාවිතා කළ හැකි වන සේ තාක්ෂණ විෂය බාර අමාත්‍යවරයා විසින් මෙම දත්ත එකතු කිරීමේ ආකෘති හා වෙනත් අදාළ විධිවිධාන ඇතුළත් 2022 අංක 01 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු (ඉ-ග්‍රාම නිලධාරි තොරතුරු පද්ධතිය) නියෝග ප්‍රකාශයට පත් කර තිබේ.
- මෙහිදී, ගෘහ හා පුරවැසි දත්ත එක්රැස් කිරීමට අදාළ ආකෘති පත්‍ර, අනෙකුත් රාජ්‍ය ආයතන ඇතුළු පාර්ශවයන්හි දත්ත අවශ්‍යතා ද සළකා නැවත නිර්මාණය කරන ලදි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක ඉහත දිස්ත්‍රික්ක 7 හි සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල ආවරණය කරමින් ගෘහ හා පුරවැසි දත්ත එකතු කිරීමේ නිලධාරීන් පුහුණුව අවසන් කර ඇති අතර, දත්ත එකතු කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය වන අනෙකුත් සියලුම උපකරණ හා ද්‍රව්‍ය ද අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින් බෙදා අවසන් කර ඇත. තවද, දත්ත එකතු කිරීමට අවශ්‍ය පෝරම බෙදා හැරීම් කටයුතු ද ගම්පහ හැර සෙසු දිස්ත්‍රික්ක 06 හි සම්පූර්ණ කර ඇති අතර, එම දිස්ත්‍රික්කයන්හි දත්ත එකතු කිරීමේ කාර්යය මේ වනවිට සාර්ථකව සිදුකෙරෙමින් පවතී. කළුතර දිස්ත්‍රික්කයෙහි දත්ත එකතු කිරීමේ කාර්යය 85%ක් පමණ අවසන් කර ඇති අතර, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 5ක දත්ත එකතු කිරීමේ පත්‍රිකා පරිලෝකන හා ඩිජිටල්කරණ කටයුතු මේ වනවිට සිදු කරමින් පවතී. ගම්පහ දිස්ත්‍රික්කයෙහි දත්ත එකතු කිරීමේ පෝරම මුද්‍රණය අවසන් අදියරෙහි ඇති අතර, ඒවා බෙදා හැරීමට කටයුතු සැලසුම් කර ඇත.

- මූලික පරිගණක දැනුම අවශ්‍ය කරනු ලබන කළුතර දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරීන් වෙත පුහුණු සැසිවාර සැලසුම් කළ පරිදි පවත්වා ඇත.තවද ඉ-ග්‍රාම නිලධාරී මෘදුකාංගය පිළිබඳ පුහුණුව ද ඉහත දිස්ත්‍රික්ක 07හි සම්පූර්ණයෙන්ම අවසන් කර ඇත.
- ඉ-ග්‍රාම නිලධාරී මෘදුකාංගයේ අත්‍යවශ්‍ය වෙනස්කිරීම්/සංශෝධන අතරින් කිහිපයක් පමණක් සිදු කිරීමට අදාළ ප්‍රසම්පාදනය පිරිනමා එහි කටයුතු පසුවිපරම් කර ඇති අතර, ග්‍රාම නිලධාරීන්ට එම මෘදුකාංගයට ප්‍රවේශ වී සේවා සැපයීමට අවශ්‍ය පරිගණක උපාංග ලබා දීමේ විකල්ප ක්‍රමවේද සළකා බලමින් පවතී.
- රාජ්‍ය සංවිධාන ව්‍යුහයේ බිම් මට්ටමේ වඩාත් මහජනතාවට සමීපතම රාජ්‍ය නිලධාරියා ලෙස ග්‍රාම නිලධාරී තනතුරට මෙතෙක් තිබූ පිළිගැනීම් තත්ත්වය තවදුරටත් ඉහළ යන පරිදි ඔවුන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයෙන් බල ගැන්වීමට කටයුතු කළ හැකි වීම.
- නවීන තාක්ෂණය කෙරෙහි ග්‍රාම නිලධාරීන් හා සෙසු නිලධාරී කණ්ඩායම්වල තිබූ වැරදි ආකල්ප වළකාලමින් ඔවුන් වඩාත් ධනාත්මක ලෙස සිතනු ලබන තත්ත්වයක් දක්වා යොමු කරවීමට හැකි වීම. ව්‍යාපෘතිය යටතේ වෙනම පුහුණු සැසි සංවිධානය කර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සාක්ෂරතාව සාපේක්ෂව අඩු මට්ටමේ සිටින බවට හඳුනා ගත් ග්‍රාම නිලධාරීන් 3,500කට අධික සංඛ්‍යාවක් මේ දක්වා පුහුණු කර ඇත. මීට අතිරේකව තොරතුරු තාක්ෂණය සම්බන්ධව ග්‍රාම නිලධාරීන් පුහුණුකිරීම් වෙනුවෙන් මෙරට තො.ස.තා. කර්මාන්තවල වෘත්තීයමය සංවිධානවල ස්වේච්ඡා දායකත්වය ලබා ගත හැකි වී ඇත.
- ගෘහ හා පුරවැසි දත්ත එකතු කිරීමට හා යාවත්කාලීන කිරීම සඳහා විවිධ රාජ්‍ය ආයතන විසින් දරනු ලබන ප්‍රයත්නයන් හා අදාළ පිරිවැය අවම වන සේ බෙදාහදා ගත හැකි අන්දමේ පුළුල් ප්‍රජා පාදක ඉලෙක්ට්‍රොනික දත්ත පදනමක් (Community-based electronic database) බිහිකිරීම සඳහා තිරසාර අඩිතාලමක් දැමීමට හැකිවීම. මෙම ගෘහ/පුරවැසි දත්ත එකතු කිරීමේ ආකෘති පත්‍රය ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තු විශේෂඥයින් ඇතුළු කණ්ඩායමක් විසින් විධිමත්ව සකස් කර ඇත.
- ව්‍යාපෘතියේ දත්ත පදනම භාවිතයෙන් ග්‍රාම නිලධාරීන් විසින් නිකුත් කරනු ලබන සහතික පත්‍ර වර්ග 22ක් නිකුත් කිරීමට පදනම සකස් කර තිබීම.
- ව්‍යාපෘති මෙහෙයවීම හා නායකත්වය සඳහා දිස්ත්‍රික් මට්ටමේ හා ප්‍රා. ලේ. කොට්ඨාස මට්ටමේ ක්‍රියාකාරී කමිටු පත් කර ඇත. ග්‍රාම නිලධාරී වෘත්තීය සංගම්වල සක්‍රීය දායකත්වය ද මෙම ව්‍යාපෘතියට ලැබී ඇත.
- පුරවැසි පරිශීලකයන්ගේ දත්ත පද්ධතියට ඇතුළත් කිරීමට විශේෂ ඉ-සේවා පෝටලය සංවර්ධනය කර ඇත.
- රාජ්‍ය සේවයේ සේවා සම්පාදනය කාර්යක්ෂමව හා මිත්‍රශීලී අයුරින් පවත්වාගෙන යාම සම්බන්ධව ආර්ථික පුනර්ජීවනය සහ දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යසාධක බලකාය විසින් ඉ-ග්‍රාම නිලධාරී ව්‍යාපෘතිය ඒ සඳහා වඩාත් සාධනීය බවට පිළිගැනීම. එහි මෙහෙයවීමෙන් පැවති සාකච්ඡාවල නිර්දේශ/තීරණ අනුව මෙම ව්‍යාපෘතියේ යෝජිත දත්ත රැස් කිරීමේ ක්‍රමවේදය කඩිනම් කිරීමටත්, මුළු දිවයිනම ආවරණය වන සේ එම දත්ත රැස් කිරීමටත් සැලසුම් සකස් කිරීම.
- සියලුම රාජ්‍ය ආයතනවල සියලුම රාජ්‍ය නිලධාරීන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ දත්ත ඉ-ග්‍රාම නිලධාරී පද්ධතියට එකතු කිරීම සඳහා උපදෙස් ලබා දීමට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.
- දැනට අභාවිත ගෘහමූලික ලැයිස්තු ක්‍රමයේ අවශ්‍යතාව සපුරන වඩාත් පිළිගත හැකි ජාතික දත්ත පද්ධතිය ලෙස ඉ-ග්‍රාම නිලධාරී ව්‍යාපෘතිය යටතේ ගොඩනැගෙන දත්ත පද්ධතිය අමාත්‍ය මණ්ඩලය විසින් පිළිගැනීම හා ඒ වෙනුවෙන් ඒකාත්මික ආකාරයේ නව පොදු ගෘහ ලේඛනයක් හඳුන්වා දීම.

### යාපනය ප්‍රදේශය තුළ ඉන්කියුබේටර් / ඇක්සලරේටර් සඳහා ව්‍යාපාරික මධ්‍යස්ථානයක් ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීම ව්‍යාපෘතිය

- යාපනය ප්‍රදේශය තුළ ඉන්කියුබේටර්/ ඇක්සලරේටර් සඳහා ව්‍යාපාරික මධ්‍යස්ථානයක් ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීම නම් වූ ව්‍යාපෘතිය සඳහා ඉන්දීය රාජ්‍ය ආධාර ලෙස මුලින් එකඟ වී තිබූ අරමුදල් සක්‍රීය

කරවා ගැනීමට ව්‍යාපෘති මෙහෙයුම් කමිටුවට හා මෙරට ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලයට අවශ්‍ය මූලික වාර්තා සැකසීම පිණිස දේශීය අරමුදල් සංරචකය යොදා යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහාය ඇතිව උපදේශන ආයතනයක සේවාව ප්‍රසම්පාදනය කරන ලදී. මෙම කොන්ත්‍රාත්තුව හිමිකර ගත් උපදේශන සේවාවලට අදාළ කටයුතු අවසන් කර වාර්තාව ඉදිරිපත් කර ඇත. යෝජිත ව්‍යාපාර මධ්‍යස්ථානය පිහිටුවීමට වඩාත් සුදුසු ස්ථානය ලෙස යාපනය සංස්කෘතික මධ්‍යස්ථානය නිර්දේශ කර ඇති අතර ඊට සංස්කෘතික විෂය බාර අමාත්‍යාංශයේ එකඟතාවයද ලැබී ඇත. මෙහි ඉඩකඩ භාවිතය, කුලී ගාස්තු යනාදිය පිළිබඳව ඒකාබද්ධ කළමනාකරණ කමිටුවේ තීරණය ලැබීමට තිබෙන අතර, එය ලැබීමෙන් පසු ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව විසින් මෙහි ඉදිරි ක්‍රියාමාර්ග තීරණය කළ යුතුව ඇත.

## 2.2. අභියෝග

### 2.2.1. පාලන අංශය

- සැලසුම් කළ පරිදි කටයුතු කිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් නොවීම.
- තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධව නිලධාරීන්ගේ පවතින අවම දැනුම
- කාර්ය මණ්ඩල පුහුණුව ලබා දීමට ඇති මූල්‍යමය අපහසුතා

### 2.2.2. සංවර්ධන අංශය

- රටෙහි පවතින මූල්‍ය අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් වෙළෙඳපොළෙහි ගොඩනැගිලි ද්‍රව්‍යයන්හි හිඟයක් පැවතීම හා ඒවායෙහි මිල අධික නිසා අතැම් කාර්යයන් අපේක්ෂිත පරිදි නිම කිරීමට නොහැකි වීම.
- ජාතික අයවැය චක්‍රලේඛ 05/2019 හි පරිදි නව ව්‍යාපෘති ආරම්භ කිරීමට නොහැකි වීම නිසා නව ඉදිකිරීම් සිදු කිරීමට නොහැකි වීම.
- වෙන් කරන ලද ප්‍රතිපාදනයට අදාළව අක්මුදල් ලැබීම ප්‍රමාද වීම හේතුවෙන් වැඩ අවසන් කිරීමේ කාල රාමුවට(work plan) අනුව වැඩ අවසන් කිරීමට ප්‍රමාද වීම.
- සිදු කරන ලද කාර්යයන් සඳහා බිල්පත් ගෙවීමට අක්මුදල් ලැබීම ප්‍රමාද වීම.

### 2.2.3. මූල්‍ය අංශය

- අදාළ අංශවලින් සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලින් නියමිත වේලාවට පුරෝකථනය කරන ලද තොරතුරු එක්රැස් කිරීමේ දුෂ්කරතා.
- සමහර පුරෝකථන මිනුම් මූල්‍ය වාර්තාකරණය සඳහා සුදුසු නොවීම.
- මූල්‍ය කාර්ය සාධන තොරතුරු නොමැතිවීම.
- නිසි ගෙවීම් පද්ධතියක් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වීම.
- ගෙවීම් ක්‍රියාවලිය සඳහා අවශ්‍ය ලියකියවිලි සමඟ සම්පූර්ණ කරන ලද වවුචර් ඉදිරිපත් නොකිරීම.
- වර්ෂය සඳහා වන සියළුම වියදම් පියවා ගැනීම සඳහා භාණ්ඩාගාරය වෙන් කරන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම.
- තාක්ෂණික ඇගයීම් කමිටු සහ ප්‍රසම්පාදන කමිටු සඳහා සුදුසු දිනයන් සහ වේලාවන් සොයාගැනීම දුෂ්කර වීම.
- අංශවලින් ලැබෙන හදිසි ඉල්ලීම් සපයා දීම අසීරු වීම.

### 2.2.4. විමර්ශන අංශය

- දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි පිහිටුවා ඇති විමර්ශන ඒකකවල කටයුතු අක්‍රියවීම නිසා සෘජුවම අමාත්‍යාංශයට ලැබෙන පැමිණිලි සංඛ්‍යාව ඉහළ යාම.
- අංශයේ නිලධාරීන් දෙනෙකු දේශීය හා 6 විදේශීය නිවාඩු ලබා ගැනීම නිසා අංශයේ රාජකාරි සිදු කිරීමට නිලධාරීන් හිඟතාවයක් පැවතීම.
- සිංහල හා දෙමළ ද්වි භාෂා නිලධාරී හිඟයක් පැවතීම.
- විමර්ශන කටයුතු සිදුකිරීමේදී නිලධාරීන්ගේ පෞද්ගලික ආරක්ෂාවට අභියෝග එල්ලවීම.
- අනෙකුත් රාජ්‍ය ආයතනයන්ගෙන් තොරතුරු ලබා ගැනීමේදී ඇතිවන බාධා.
- උදා: ශ්‍රී ලංකා පොලීසිය ,අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසන් සභාව
- දෙමළ මාධ්‍ය පැමිණිලි සම්බන්ධව සහ ඉංග්‍රීසි මාධ්‍ය පැමිණිලි සම්බන්ධව කටයුතු කිරීමේදී භාෂා පරිවර්තනයෙහි ගැටලු පැන නැගීම.
- ප්‍රමාණවත් ප්‍රවාහන පහසුකම් නොමැති වීම හේතුවෙන් අපේක්ෂිත දිස්ත්‍රික් වැඩමුළු සහ කාර්යාල පරීක්ෂණ සිදුකර ගැනීම අභියෝගයක් වීම. (වර්තමාන ඉන්ධන අර්බුදය හේතුවෙන්)

- විමර්ශන නිලධාරීන්ට රාජකාරී සඳහා දුරබැහැර දිස්ත්‍රික්ක වලට යාමේදී ප්‍රවාහන දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදුවීම.

**2.2.5. ස්වදේශ කටයුතු අංශය**

**2.2.5.1. දිස්ත්‍රික් පාලන අංශය**

- රටෙහි පැවති ආර්ථික හා සමාජයීය අර්බුද රැසක් හමුවේ වුව ද සීමිත කාර්ය මණ්ඩලයක් යටතේ රාජකාරි කාර්යක්ෂමව ඉටු කිරීම.

**2.2.5.2. ග්‍රාම නිලධාරී පාලන අංශය**

- පැවති කොරෝනා තත්ත්වය සහ අනෙකුත් අභියෝග හමුවේ පැවැත්වීමට නියමිතව තිබූ කාර්යක්ෂමතා කඩඉම් විභාග කල්යාම හේතුවෙන් කඩිනමින් එම විභාග පැවැත්වීම.
- ග්‍රාම නිලධාරීන් 2500 ට අධික පුරප්පාඩු ප්‍රමාණයක් පවතිද්දී දැනට සේවයේ නිරත ග්‍රාම නිලධාරීන් මඟින් කාර්යක්ෂම මහජන සේවාවක් සැපයීම සහතික කිරීම.

**2.2.6. ඉංජිනේරු අංශය**

- කාර්යය මණ්ඩල හිඟකම
- නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් නොලැබීම
- ඉදිකිරීම් කර්මාන්තයේ ද්‍රව්‍ය හිඟය හේතුවෙන් ඉදිකිරීම් කර්මාන්ත ප්‍රගතිය පසුබෑමට ලක්වීම
- ආර්ථික අර්බුදය හමුවේ ඉදිකිරීම් ද්‍රව්‍ය වල මිල උච්ඡාවචනය වීමෙන් ඉදිකිරීම් කර්මාන්තය දැඩි අභියෝගයකට ලක්වීම
- ඉදිකිරීම් ව්‍යාපෘති වල ප්‍රගතිය නිවැරදිව නිසි පරිදි නොලැබීම
- නිල මැදුර ගොඩනැගිල්ලෙහි නඩත්තු හා අලුත්වැඩියාවන් සිදු කිරීම සඳහා ද්‍රව්‍ය හිඟය සහ මුල්‍ය ප්‍රවාහයක් නොමැතිවීම හා ගෙවීම ප්‍රමාද වීම. ගෙවීම් ප්‍රමාදය නිසා වෙනත් පාර්ශවයන් සමඟ තිබෙන විශ්වාසය පළුදු වීම.
- දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් ලබා නොදීම.

**2.2.7. ප්‍රාදේශීය පරිපාලන ප්‍රතිසංස්කරණ අංශය**

**ඉ-ග්‍රාම නිලධාරි (eGN) ව්‍යාපෘතිය**

- තාක්ෂණික ශක්‍යතා කල් ඉකුත්වීම සහ අනෙකුත් ප්‍රායෝගික තත්ත්වයන් හේතුවෙන් අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව (CAPC) විසින් එය අවලංගු කිරීමෙන් පසු ග්‍රාම නිලධාරීන් වෙත ටැබ් පරිගණක සහ පරිගණක මුද්‍රණ යන්ත්‍ර සැපයීම සඳහා වූ ප්‍රසම්පාදනය අනපේක්ෂිත ලෙස අවසන් කිරීමට සිදු වීම. පිරිවැය සඵලදායී විකල්ප ක්‍රම යොදා ගනිමින් ව්‍යාපෘති සංරචක සියල්ල සපුරාලීම සඳහා වූ උපායමාර්ග හඳුනා ගැනීම සඳහා පත් කරන ලද නිලධාරීන්ගේ කමිටුවේ නිර්දේශ හා විකල්ප යෝජනා අමාත්‍ය මණ්ඩල අනුමැතියට යොමු කිරීම අවශ්‍ය වී තිබීම.
- මෙම ව්‍යාපෘතිය පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් නිර්මාණය පිළිබඳ කටයුතු සැලසිනෙ රූපවාහිනී ආයතනයට බාර දෙන ලද නමුත් සම්පූර්ණ කළ හැකි වූයේ ඉන් කොටසක් පමණි. එසේම පැන නැගුණු අනපේක්ෂිත සමාජ, ආර්ථික හා දේශපාලනික තත්ත්වයන් නිසා ජාතික හා ප්‍රාදේශීය මට්ටමින් වඩාත් ඵලදායී සන්නිවේදන ක්‍රමයක් ආරම්භ කිරීමට නොහැකි විය.
- ව්‍යාපෘතියට අදාළ ප්‍රසම්පාදන බොහෝමයක්ම අක්මුදල් සීමාකාරී වීම නිසා හා පාලනයෙන් බැහැර හේතූන් නිසා අදාළ කාල සීමාව තුළ ප්‍රදානය නොවීම මත ව්‍යාපෘති කටයුතු බොහොමයක් අනවශ්‍ය ලෙස ප්‍රමාද වීම.
- ව්‍යාපෘතිය කාලසීමාව 2023.12.31 දින අවසන් වීමට නියමිත අතර, විවිධ හේතු නිසා ව්‍යාපෘතිය යටතේ ගෘහ/පුරවැසි දත්ත එකතු කිරීම ප්‍රමාද වීම, ග්‍රාම නිලධාරීන්ට මෙම ව්‍යාපෘතියේ මෘදුකාංගය නිල භාවිතය සඳහා අවශ්‍ය උපාංග හා පහසුකම් සැලසීමට ප්‍රමාණවත් කාලයක් අවශ්‍ය වීම හා ව්‍යාපෘතියේ අනෙකුත් කටයුතු සම්පූර්ණ කිරීම සඳහා ව්‍යාපෘති කාලය පළමුව 2024.12.31 දක්වා දීර්ඝ කිරීම හා සෙසු වැදගත් යෝජනා සමගින් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් සම්පාදනය කර ඇත.

**යාපනය ප්‍රදේශය තුළ ඉන්කියුබේටර් / ඇක්සලරේටර් සඳහා ව්‍යාපාරික මධ්‍යස්ථානයක් ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීම ව්‍යාපෘතිය**

- යෝජිත ව්‍යාපාරික මධ්‍යස්ථානය පවත්වා ගෙන යාම සඳහා ප්‍රමාණවත් රජය සතු ඉඩකඩ සහිත ගොඩනැගිලි යාපනය නගරයේ හඳුනා ගැනීම දුෂ්කර වීම.
- ඉන්දීය ආධාර යටතේ යාපනයේ ඉදි කරන ලද සංස්කෘතික මධ්‍යස්ථානයේ ඉඩකඩ මෙම

ව්‍යාපෘතිය වෙනුවෙන් ලබා ගැනීමට ව්‍යා. මෙහෙයුම් කමිටුව ගෙන ඇති යෝජනාවට මූලික එකඟත්වය පල වී ඇතත් අදාළ මාසික ගාස්තු යනාදිය පිළිබඳ තොරතුරු නිර්ණය වී නොතිබීම

- ඉන්දීය රජයේ මූල්‍යාධාර ලබාගැනීම සඳහා දැනට දෙරට අතර අත්සන් කර ඇති, 2022 පෙබරවාරි මස කල් ඉකුත්ව ඇති අවබෝධතා ගිවිසුම විධිමත්ව අලුත් කර දීර්ඝ කර ගැනීමට සිදුව තිබීම.

## 2.3. අනාගත ඉලක්ක

### 2.3.1. පාලන අංශය

- මානව හා භෞතික සම්පත් කාර්යක්ෂමව හා සඵලදායිව භාවිත කිරීම තුළින් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම.
- ඉතා කෙටි කාලයක් තුළ තොරතුරු දැනගැනීමේ පනත යටතේ තොරතුරු ඉල්ලා සිටින අය වෙත ඔවුන්ගේ තොරතුරු අවශ්‍යතාවය සපුරාලීම.
- අමාත්‍යාංශය තුළ සේවය කරන නිලධාරීන්ගේ දේශීය-විදේශීය පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම සහ සැලසුම්ගත පුහුණු වැඩසටහන් සියල්ල නියමිත කාලය තුළ අවසන් කිරීම.
- ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ සේවය කරනු ලබන සියලු නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු ආශ්‍රිත තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් සැකසීම.
- දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙබ් අඩවි යාවත්කාලීනව පවත්වාගෙන යමින් සයිබර් අවකාශය තුළ වෙබ් අඩවිවල ආරක්ෂාව තහවුරු කිරීම.

### 2.3.2. සංවර්ධන අංශය

- රු.මි.433.40 ක වියදමින් දැනට උප කාර්යාලයක් ලෙස පවත්වාගෙන යන මාදම්පාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් ලෙස ස්ථාපිත කිරීම.
- කුලියාපිටිය බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව තෙමහල් ගොඩනැගිල්ල රු.මි .242.00 ක වියදමින් ඉදිකිරීම.
- කුලියාපිටිය නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව තෙමහල් ගොඩනැගිල්ල රු.මි.248.00 ක වියදමින් ඉදිකිරීම.
- ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නව තෙමහල් ගොඩනැගිල්ල රු.මි.307.00 ක වියදමින් ඉදිකිරීම.
- රු.මි.1991.00 ක වියදමින් අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිපාලන සංකීර්ණය ඉදිකිරීම.
- රු.මි.1150.00 ක වියදමින් දෙහිවල ප්‍රාදේශීය ලේකම් කාර්යාල නව ගොඩනැගිල්ල ඉදිකිරීම.
- මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දෙවන අදියර රු.මි.328.00 ක වියදමින් ඉදිකිරීම.
- කිලිනොච්චි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දෙවන අදියර රු.මි. 565.00ක වියදමින් ඉදිකිරීම.
- කල්තොට නව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය රු.මි.343.17 ක වියදමින් ඉදිකිරීම.

### 2.3.3. මූල්‍ය අංශය

- අදාළ ආයතනවල සියලු මට්ටම් සඳහා, ඵලදායී, වගවීමක් සහ විනිවිදභාවයකින් යුතු නිමැවුමක් ලබා දීම.
- කාර්යක්ෂම හා ඵලදායී ගෙවීම් පද්ධතියක් වැඩිදියුණු කිරීම.
- ආයතනයේ කාර්යක්ෂම සේවාවක් සහතික කිරීම සඳහා නිසි ප්‍රමිතියෙන් හා ප්‍රමාණයෙන් නිසි වේලාවට නිසි භාණ්ඩ හා සේවා සැපයීම.
- ස්වදේශ කටයුතු අංශය, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අරමුදල් කළමනාකරණය වඩාත් කාර්යක්ෂම කිරීම.

### 2.3.4. විමර්ශන අංශය

- මානව හා භෞතික සම්පත් පුළුල් කිරීම.
- නිලධාරීන්ගේ සේවා තෘප්තිය නංවාලීම සඳහා විධිමත් උසස් කිරීමේ පටිපාටියක් ඇති කර නිලධාරීන් එක් එක් ශ්‍රේණි වෙත අන්තර්ග්‍රහණය කිරීම.
- කාර්යාල පරීක්ෂණ පුළුල් කිරීම.
- දිස්ත්‍රික් විමර්ශන ඒකක ශක්තිමත් කිරීම.
- සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම අඛණ්ඩ ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ඔවුන් සඳහා අදාල වන උසස් අධ්‍යාපන අවස්ථා ලබා දීම.
- පැමිණිලි මෙහෙයවීම හා සාක්ෂි ලබාදීමේ කටයුතුවල තත්ත්වයන් ඉහළ නැංවීමට වැඩපිළිවෙලක් සැකසීම.

- දිස්ත්‍රික් හා ප්‍රාදේශීය පාලන ව්‍යුහයට අයත් රාජ්‍ය ආයතනවල වංචා හා දූෂණ වැළැක්වීමේ යාන්ත්‍රණයක් හඳුන්වාදීම.
- දුරකථන මඟින් ඉදිරිපත්වන මහජන පැමිණිලි සහ සෙසු පැමිණිලි සඳහා පසුවිපරම් ක්‍රියාවලියක් හඳුන්වාදීම.

### 2.3.5. ස්වදේශ කටයුතු අංශය

#### 2.3.5.1. දිස්ත්‍රික් පාලන අංශය

- ඉදිරියේදී පැවැත්වීමට නියමිත 76 වන නිදහස් දින සමරු උළෙල අති උත්කර්ෂවත් අන්දමින් පැවැත්වීමට කටයුතු සංවිධානය කිරීම.
- නවීන තොරතුරු තාක්ෂණික උපක්‍රම හඳුන්වාදෙමින් දිස්ත්‍රික් පරිපාලනයේ කාර්යක්ෂම බව හා ඵලදායීතාවය ඉහළ නැංවීම.

#### 2.3.5.2. ප්‍රාදේශීය පාලන අංශය

- ප්‍රාදේශීය පරිපාලනය හා සම්බන්ධ රාජ්‍ය යාන්ත්‍රණය ඩිජිටල්කරණය කිරීමට අදාළ ව්‍යාපෘති දියත් කිරීම. (SYSCGAA මාර්ගගත කළමනාකරණ පද්ධතිය)
- ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බැහැර කර ඇති ඉඩම් කොටස පූර්ණ අයිතිය සහිත නිදහස් ප්‍රදානපත්‍ර නිකුත් කිරීම හා උරුමය වැඩසටහන සම්බන්ධීරණ කටයුතු සිදුකිරීම.
- සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල කළමනාකරණ තරඟයක් තුළින් ප්‍රමුඛතාගත කිරීම.
- අස්වැසුම වැඩසටහනෙහි සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

#### 2.3.5.3. ග්‍රාම නිලධාරී පාලන අංශය

- උසස්වීම් ලද පරිපාලන ග්‍රාම නිලධාරීන් කඩිනමින් පුරප්පාඩු පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත අනුයුක්ත කිරීම හා ග්‍රාම නිලධාරී පුරප්පාඩු කඩිනමින් පිරවීම ප්‍රධාන ඉලක්කවේ.

### 2.3.6. ඉංජිනේරු අංශය

- සේවාදායකයන්ට / භාවිතාකරන්නන්ට සහ මහජනතාවට මනා ලෙස ප්‍රතිචාර දැක්වීමත්, තෘප්තිමත් රාජ්‍ය සේවයක් සැපයීමට ඉඩ සැලසෙන පරිදි කාර්යාල ව්‍යුහය සංවර්ධනය කිරීම.
- සියලුම දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදි කිරීම් ව්‍යාපෘති කටයුතු අධීක්ෂණය සහ තාක්ෂණික උපදෙස් ලබා දීම.
- මෙම අමාත්‍යාංශයේ ස්වදේශ කටයුතු අංශය මඟින් ප්‍රතිපාදන වෙන් කරනු ලබන ඉදිකිරීම් ව්‍යාපෘති හා රාජ්‍ය උත්සව සම්බන්ධයෙන් ඉංජිනේරුමය කටයුතු, අනෙක් රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු කිරීම.
- දිස්ත්‍රික් ඉංජිනේරුවරුන් හා වාස්තු විද්‍යාඥයින් උසස්වීම්, වෘත්තීය සුදුසුකම් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම හා වරලත් තත්ත්වය ලබා ගැනීමේ කටයුතු සඳහා පහසුකම් සැපයීම, තාක්ෂණික කාර්යය මණ්ඩලවල පුහුණු අවශ්‍යතා සපුරාලීමට කටයුතු කිරීම සහ ඔවුනට අවශ්‍ය ඉංජිනේරුමය හා තාක්ෂණික ක්‍රියාකාරකම් සංවිධානය කොට මෙහෙය වීම.
- රාජ්‍ය සේවා නිලධාරීන්ට විවේක කාලය තෘප්තිමත්ව ගත කිරීම සඳහා සංචාරක බංගලා වල පහසුකම් වැඩි දියුණු කිරීම.
- මෙම අමාත්‍යාංශයේ ස්වදේශ කටයුතු අංශයට අයත් සියලුම සංචාරක බංගලාවල ඉදිකිරීම් ව්‍යාපෘති හා නඩත්තු කටයුතු ක්‍රියාත්මක කිරීමට අදාල තාක්ෂණික උපදේශනය ලබා දීම.

### 2.3.7. ක්‍රමසම්පාදන අංශය

- විදේශ ගත හැකියා සහිත පිරිස් ග්‍රාමීය මට්ටමින් හඳුනාගෙන විදේශගත අතදෙන්නන්ගේ පොකුර නමින් ඔවුන් හරහා ගම දියුණු කිරීමට අවශ්‍ය සහය ලබා ගැනීම.

ප්‍රදීප් යසරත්න
ලේකම්/ ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

## 04. කාර්යසාධන දර්ශක

| # | විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|---|
| | | 100% - 90% | 89%-75% | 74%-50% |
| 1 | අළුත්වැඩියා කරන ලද වාහන සංඛ්‍යාව | √ | | |
| 2 | අළුත්වැඩියා කරන ලද සංචාරක බංගලා සංඛ්‍යාව | | | √ |
| 3 | අමාත්‍යාංශයේ මානව සම්පත් ඵලදායිතාවය වැඩිකිරීම වෙනුවෙන් දේශීයව පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව සහ විදෙස් පුහුණු සංඛ්‍යාව | | | √ |
| 4 | තොරතුරු පනත යටතේ ලද ඉල්ලීම් වෙනුවෙන් යොමු කළ පිළිතුරු සංඛ්‍යාව | √ | | |
| 5 | මහජන පැමිණිලි සම්බන්ධයෙන් ගැනීමට හැකි වූ පියවර සංඛ්‍යාව | √ | | |
| 6 | මාර්ගගතව සංචාරක බංගලා වෙන් කිරීමේ පහසුකම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ලබාදීම, වෙන්කිරීම් තොරතුරු සේවාලාභීන්ට දුරකථන පණිවුඩයකින් දැනුම්දීම සහ සේවාලාභී ප්‍රතිපෝෂණ ලබා ගැනීම යන අවශ්‍යතා ඉටුවන පරිදි සපයන ලද සංචාරක බංගලා වෙන් කිරීම් ගණන. | √ | | |
| 7 | දේශීය හා විදේශීය නිවාඩු අනුමත කිරීම. | √ | | |
| 8 | 2023.01.01 – 2023.12.31 ගොඩනැගිලි ඉදිකිරීම- 2104 | √ | | |
| 9 | 2023.01.01 – 2023.12.31 පිබිදෙමු පොලොන්නරුව- 2509 | √ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 16.3 | 2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල වේ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල වේ | | |
| **20** | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |

# පළාත් සභා
# හා
# පළාත් පාලන
# අංශය

# පරිච්ඡේද


**1. ආයතන පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය ........ 1**

1.1. හැඳින්වීම ........ 1
1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණ ........ 2
1.3. පැවරී ඇති කාර්යයන් හා කර්තව්‍යයන් ........ 2
1.4. සංවිධාන සටහන ........ 57
1.5. රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින අංශ ........ 2
1.6. අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මකවන සංවර්ධන ව්‍යාපෘති සඳහා අරමුදල් සපයන ආයතන/ රටවල් ........ 3
1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල මූලික තොරතුරු ........ 3

**2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම, විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක ........ 4**

2.1. විශේෂ ජයග්‍රහණ ........ 4
2.2. මහජන දුක් ගැනවිලි කළමනාකරණය ........ 4
2.3. පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ........ 4
2.4. අභියෝග ........ 5
2.5. ඉදිරි ඉලක්ක ........ 6
2.6. දේශීය අරමුදල් මත ක්‍රියාත්මකවන වැඩසටහන් හා ව්‍යාපෘතිවල කාර්යසාධනය ........ 7

**3. වසරේ සමස්ථ මූල්‍ය කාර්සාධනය ........ 38**

3.7. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්යසාධනය ........ 38
3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය ........ 38

**4. කාර්යසාධන දර්ශක ........ 39**

**5. තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය ........ 40**

5.1. හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු ........ 40
5.2. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග ........ 41

**6. මානව සම්පත් පැතිකඩ ........ 42**

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය ........ 42
6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය ........ 42
6.3. මානව සම්පත් සංවර්ධනය ........ 42

**7. අනුකූලතා වාර්තාව ........ 49**

# 01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 1.1. හැඳින්වීම

මෙම වාර්තාව මඟින් පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ විෂයයන් හා කාර්යයන්වල 2023 වර්ෂයට අදාළ භෞතික හා මූල්‍ය කාර්යසාධනය සවිස්තරාත්මකව ඉදිරිපත් කරයි. මුදල් අමාත්‍යාංශය විසින් ලබාදෙන ලද උපදෙස් හා ආකෘතිය අනුව මෙම වාර්තාවේ ආකෘතිය හා පෙළගැස්ම සකස් කර ඇත.

2023 අයවැය මඟින් මෙම අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සඳහා වෙන්වූ සමස්ත ප්‍රතිපාදන ප්‍රමාණය රු. 31,575,000,000 කි. එම ප්‍රතිපාදන වලින් රු. 23,463,000,000 ක් එනම්, 74.30% ක් 2023.12.31 දිනට ඵලදායීව වියදම් කිරීමට අමාත්‍යාංශයට හැකිවී තිබේ.

අමාත්‍යාංශයට වෙන්වූ ප්‍රතිපාදන උපයෝගී කරගනිමින් පළාත් සභා සහ පළාත් පාලන ක්ෂේත්‍රයේ සංවර්ධන කටයුතු සාර්ථකව ක්‍රියාත්මක කිරීමට, අමාත්‍යාංශයට හැකිවීම සුවිශේෂී කරුණකි. ඒ අනුව දිවයිනේ බොහෝ පළාත් පාලන ආයතන ආවරණය කරමින් දේශීය සහ විදේශීය අරමුදල් යටතේ සංවර්ධන ව්‍යාපෘති රාශියක් සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීමටත් ඉකුත් වර්ෂවල ක්‍රියාත්මක වූ සංවර්ධන ව්‍යාපෘතිවල නොපියවූ බිල්පත් නිරවුල් කිරීමටත් හැකිවිය. තවද, පළාත් සභා හා පළාත් පාලන ක්ෂේත්‍රයට අදාළ නීති අණපනත් සහ ජාතික ප්‍රතිපත්ති යාවත්කාලීන කිරීම හා නියමිත සංශෝධන කටයුතු ඉටු කිරීම හා ඒ පිළිබඳ අවධානය යොමු කිරීම අමාත්‍යාංශය විසින් ඉටුකරන ලද තවත් මෙහෙවරකි. ඒ යටතේ මහා නගර සභා ආඥා පනත, නගර සභා ආඥා පනත සහ ප්‍රාදේශීය සභා පනත් තුළ පවත්නා යල්පැනගිය නීතීන් ජාතික ප්‍රතිපත්ති රාමුව හා සැසඳෙන පරිදි යාවත්කාලීන කිරීම, උසාවි දඩ මුදල්, මුද්දර ගාස්තු සෘජුවම පළාත් පාලන ආයතනයේ ගිණුමට යොමුවන පරිදි පළාත් සභා පනතේ ඉදිරි සංශෝධන කටයුතු සිදු කිරීම සඳහා පළාත් සභාවල අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කිරීම, පළාත් පාලන ආයතනවල කාර්යයන් පහසු හා සුමට කිරීම සඳහා නව විද්‍යුත් මෙවලම් හඳුන්වා දීම විශේෂ වේ.

මෙම වාර්තාවේ ඉදිරි පරිච්ඡේද තුළින් 2023 වර්ෂයට අදාළ අමාත්‍යාංශයේ ප්‍රගතිය හා ඉදිරි දැක්ම, සමස්ත මූල්‍ය කාර්යසාධනය, කාර්යසාධන දර්ශක, තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය, මානව සම්පත් පැතිකඩ, විගණන මතය හා තවත් කරුණු පිළිබඳව තොරතුරු ඉදිරිපත් කරයි.

"සෞභාග්‍යයේ දැක්ම" ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුව අමාත්‍යාංශයේ විෂයය පථයට අයත් කාර්යයන් හා අමාත්‍යාංශයට නියමිත වූ සුවිශේෂී ප්‍රමුඛතා කාර්යක්ෂමව සහ ඵලදායීව ක්‍රියාත්මක කිරීම සඳහා ගරු අමාත්‍යතුමාගේ නිසි නායකත්වය හා මඟපෙන්වීම, අමාත්‍යාංශ ලේකම්තුමාගේ මනා කළමනාකාරිත්වය, අතිරේක ලේකම්වරුන් මෙන්ම පළාත් ප්‍රධාන ලේකම්වරුන්ගේ, පළාත් පාලන කොමසාරිස්වරුන්ගේ, ආයතන සහ විදේශ ආධාර ව්‍යාපෘතිවල අධ්‍යක්ෂවරුන්ගෙන් ලද මහඟු දායකත්වය විශේෂයෙන් මෙහිලා සඳහන් කළ යුතුය.

## 1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර

### 1.2.1. දැක්ම

පළාත් සහ ප්‍රාදේශීය ආණ්ඩුකරණයක් සඳහා බලගැන්වීම

### 1.2.2. මෙහෙවර

ජනතා හිතවාදී නීතිරීති හා ප්‍රතිපත්ති සම්පාදනය මඟින් හා නූතන තාක්ෂණයේ සහාය ඇතිව දේශීය සම්පත් පූර්ණ උපයෝජනයට ලක් කරමින් විනිවිදභාවයෙන් හා වග වීමෙන් කටයුතු කිරීම සඳහා පළාත් සභා හා පළාත් පාලන ආයතනවලට මඟපෙන්වීම සහ සහායවීම

## 1.3. පැවරී ඇති කාර්යයන් හා කර්තව්‍යයන්

2022.07.22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරන ලද නව අමාත්‍යාංශවල කාර්යයන් හා කර්තව්‍යයන් පිළිබඳ නිවේදනයට අනුව පළාත් සභා සහ පළාත් පාලන අංශයේ කාර්යයන් හා කර්තව්‍යයන්.

I. පළාත් සභාවලට අදාළ කටයුතු නියාමනය කිරීම.

II. පළාත් සභා හා පළාත් පාලන ආයතන පරිපාලනයෙහි සෑම මානයක් සම්බන්ධයෙන්ම පර්යේෂණ පැවැත්වීම.

III. පළාත් සභා හා පළාත් පාලන ආයතනවල අඩු පහසුකම් සහිත ක්ෂේත්‍ර/ අංශ හඳුනාගෙන අදාළ පහසුකම් ලබා දීම සඳහා විශේෂ ව්‍යාපෘති සැලසුම් කර ක්‍රියාත්මක කිරීම.

IV. පළාත් සභාවල මන්ත්‍රීවරුන්, නිලධාරීන් හා සේවකයින් පුහුණු කිරීම.

V. පළාත් පාලන ආයතනවලට අදාළ රජයේ කර්තව්‍යයන්.

VI. පොදු පහසුකම් සංවර්ධනය සඳහා පළාත් පාලන ආයතනවලට ණය පහසුකම් ලබා දීම.

VII. පළාත් පාලන ආයතනයන්හි මන්ත්‍රීවරුන් නිලධාරීන් හා සේවකයින් පුහුණු කිරීම.

## 1.4. සංවිධාන සටහන

කරුණාකර ඇමුණුම් අංක 1 බලන්න.

## 1.5. රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින අංශ

1. පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍ය කාර්යාලය
2. ලේකම් කාර්යාලය
3. පාලන හා පුහුණු අංශය
   i. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒකකය
4. පළාත් සභා අංශය
5. පළාත් පාලන අංශය
6. සංවර්ධන අංශය
7. ව්‍යාපෘති අධීක්ෂණ අංශය
8. ක්‍රමසම්පාදන අංශය
9. නීති අංශය
10. මූල්‍ය අංශය
11. වියදම් විමංසන අංශය
12. අභ්‍යන්තර විගණන අංශය
13. ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානය
14. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය
15. දේශීය ණය සහ සංවර්ධන අරමුදල

## 1.6. අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මකවන සංවර්ධන ව්‍යාපෘති සඳහා අරමුදල් සපයන ආයතන/ රටවල්

1. ශ්‍රී ලංකා රජය (GOSL)
2. ලෝක බැංකුව (WB)
3. ආසියානු සංවර්ධන බැංකුව (ADB)
4. යුරෝපා සංගමය (EU)
5. යුරෝපීය ආයෝජන බැංකුව (EIB)
6. ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය (JICA)
7. එක්සත් රාජධානිය
8. නෙදර්ලන්තය

## 1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල මූලික තොරතුරු

2023 වර්ෂය තුළදී විදේශ ආධාර ව්‍යාපෘති 09 ක් ක්‍රියාත්මක වූ අතර ඒවායේ මූලික තොරතුරු පහත සඳහන් පරිදි වේ.

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | දායක නියෝජිතායතනය | ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුදල (රු.මි.) | ව්‍යාපෘති කාලය |
|---|---|---|---|---|
| 1 | මහකොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය (GCWWMP) | දේශීය අරමුදල් | 6,700.00 | 2023 ජූනි - 2025 දෙසැම්බර් |
| 2 | මහකොළඹ අපජල කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන (GCWWMIIP) 2 කොටස | ආසියානු සංවර්ධන බැංකුව (ADB) | 1,227.00 | 2016 සැප්තැම්බර් - 2022 ඔක්තෝම්බර් |
| 3 | මහකොළඹ අපජල කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන (GCWWMIIP) 3 කොටස | දේශීය අරමුදල් යුරෝපීය ආයෝජන බැංකුව (EIB) | 5,900.00 | 2023 ජූලි - 2025 දෙසැම්බර් |
| 4 | පළාත් පාලන ආයතන නඟාසිටුවීමේ ආංශික ව්‍යාපෘතිය (පුරනැගුම) – අතිරේක මූල්‍යායනය | ආසියානු සංවර්ධන බැංකුව (ADB) | 13,790.00 | 2017 අප්‍රේල් - 2023 මාර්තු |
| 5 | ග්‍රාමීය පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය - අදියර 5 | නෙදර්ලන්තය | 13,300.00 | 2021 ජූලි - 2024 ජූලි |
| 6 | ප්‍රාථමික සෞඛ්‍ය සවිබලගැන්වීමේ ව්‍යාපෘතිය (PSSP) | ලෝක බැංකුව (WB) | 28,050.15 | 2018 ජූනි - 2024 ජූනි |
| 7 | සාමාන්‍ය අධ්‍යාපන නව්‍යකරණ ව්‍යාපෘතිය (GEM) | ලෝක බැංකුව (WB) | 15,505.00 | 2018 අප්‍රේල් - 2024 ජූනි |
| 8 | නැගී එන ප්‍රදේශවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය (RIDEP) | ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය (JICA) | 20,622.00 | 2017 ජූලි - 2023 දෙසැම්බර් |
| 9 | ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය - පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය (TCAMP- PRDP) | ලෝක බැංකුව (WB) | 15,020.00 | 2019 මැයි - 2023 මාර්තු |
| 10 | ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය (LDSP) | ලෝක බැංකුව (WB) | 18,522.90 | 2019 ජූනි - 2024 සැප්තැම්බර් |

## 02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

### 2.1. විශේෂ ජයග්‍රහණ

සැලසුම්ගත ඉලක්කය අනුව 2023 දෙසැම්බර් මස 31 දිනට සමස්ත මූල්‍ය ප්‍රගතියෙහි ප්‍රතිශතය

| | | |
|---|---|---|
| 2023 වර්ෂය සඳහා මුළු ප්‍රතිපාදන | = | රු. 31,575,000,000.00 |
| 2023 වර්ෂය සඳහා සත්‍ය වියදම | = | රු. 23,463,000,000.00 |
| මූල්‍ය ජයග්‍රහණයෙහි ප්‍රතිශතයක් ලෙස | = | 74.30% |

**2023 වර්ෂයේදී දේශීය ආධාර ව්‍යාපෘතිවල ප්‍රගතිය**

| අංකය | ව්‍යාපෘතියේ නම | මූල්‍ය ඉලක්කය 2023 (රු.) | මූල්‍ය ප්‍රගතිය (රු.) | භෞතික ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| 1 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන | 300,000,000.00 | 10,348,055.60 | 100% |
| 2 | 2021 වසරේ ක්‍රියාත්මක කළ අපද්‍රව්‍ය කළමනාකරණය - ප්‍රාදේශීය සභා (අයවැය යෝජනා 36) | 125,000,000.00 | 106,332,262.56 | 90% |
| 3 | බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රධාන සැලැස්ම සකස් කිරීම - නියමු ව්‍යාපෘතිය | 50,000,000.00 | 18,565,150.60 | 100% |
| 4 | පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන (ප්‍රාග්ධන) | 185,626,853.46 | 86,866,361.75 | 65% |
| 5 | ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන (පුනරාවර්තන) | 27,797,840.61 | 22,524,342.46 | 87% |
| 6 | පුස්තකාල සංවර්ධන වැඩසටහන | 3,304,642.97 | 2,334,023.08 | 75% |
| 7 | ප්‍රාදේශීය සභා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන (2021 අයවැය යෝජනා - 36) | 135,882,289.20 | 129,345,913.29 | 98% |
| 8 | බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ හිඟ බිල්පත් නිරවුල් කිරීම | 1,500,000,000.00 | 1,500,000,000.00 | 100% |

### 2.2. මහජන දුක් ගැනවිලි කළමනාකරණය

දිවයිනෙහි ඕනෑම පළාත් පාලන ආයතනයක් විසින් සපයනු ලබන සේවාවන් පිළිබඳව සෑහීමකට පත් නොවන අවස්ථාවකදී, මහජනතාවගෙන් ලැබී ඇති එබඳු පැමිණිලි යොමු කිරීම සඳහා පළාත් පාලන අංශයට අනුයුක්තව විමර්ශන ඒකකයක් ස්ථාපිත කර ඇත. 2023 වර්ෂයේදී ජනතාවගෙන් ලද පැමිණිලි 5266 ක් අදාළ පළාත් වෙත යොමු කොට සුදුසු පරිදි විසඳුම් ලබා දෙන ලදී. තවද, පෙත්සම් 06ක් මහජන පෙත්සම් කාරක සභාව වෙත ඉදිරිපත් වී ඇති අතර, පෙත්සම් 03ක් කාරක සභාව වෙත යොමු කර ඇත. පෙත්සම් 01ක් උපදේශක කාරක සභාව වෙත යොමු කර ඇත.

### 2.3. පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය (SLILG) පළාත් සභා සහ පළාත් පාලන නිලධාරීන් සඳහා දේශීය පුහුණු/ වැඩමුළු 170 ක් පවත්වා ඇති අතර එම පුහුණු/ වැඩමුළු සඳහා නිලධාරීන් 6,833 දෙනෙකු සහභාගී වී තිබේ. මීට අමතරව, අමාත්‍යාංශයේ විවිධ මට්ටම් නියෝජනය කරන නිලධාරීන් සඳහා දේශීය පුහුණු/ වැඩමුළු 24 ක් පවත්වා ඇති අතර එම පුහුණු/ වැඩමුළු සඳහා නිලධාරීන් 423 දෙනෙකු සහභාගී වී ඇත. විදේශීය පුහුණු 7 ක් පවත්වා ඇති අතර එම පුහුණු සඳහා නිලධාරීන් 16 දෙනෙකු සහභාගී වී ඇත.

***2023 වර්ෂයේදී විදේශ ආධාර ව්‍යාපෘතිවල ප්‍රගතිය***

| අංකය | ව්‍යාපෘතියේ නම | වර්ෂය තුළ මූල්‍ය ඉලක්කය 2023 (රු.මිලියන) | වර්ෂය තුළ මූල්‍ය ප්‍රගතිය (රු.මිලියන) | ව්‍යාපෘතියේ සමුච්චිත භෞතික ප්‍රගතියය (%) |
|---|---|---|---|---|
| 1 | මහකොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය (GCWWMP) | 1,000.00 | 448.40 | 96% |
| 2 | මහකොළඹ අපජල කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන (GCWWMIIP) 2 කොටස | 597.00 | 120.00 | 57% |
| 3 | මහකොළඹ අපජල කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන (GCWWMIIP) 3 කොටස | 3,720.00 | 470.00 | 19% |
| 4 | පළාත් පාලන ආයතන නඟාසිටුවීමේ ආංශික ව්‍යාපෘතිය (පූරනැගුම) – අතිරේක මූල්‍යයනය | 2,000.00 | 2,291.02 | 99.6% |
| 5 | ග්‍රාමීය පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය (අදියර 5) | 5,000.00 | 4,960.57 | 49.50% |
| 6 | ප්‍රථමික සෞඛ්‍ය සවිබලගැන්වීමේ ව්‍යාපෘතිය (PSSP) | 13,000.00 | 12,356.00 | 95% |
| 7 | සාමාන්‍ය අධ්‍යාපනය නවීකරණ ව්‍යාපෘතිය (GEM) | 4,000.00 | 3,619.69 | Goods- 84%<br>Works- 95% |
| 8 | නැගී එන ප්‍රදේශවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය ( (RIDEP) | 2,619.00 | 367.50 | 50.8% |
| 9 | ප්‍රවාහන සම්බන්ධක සහ වත්කම් ව්‍යාපෘතිය - පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය (TCAMP-PRDP) | 6,000.00 | 5,216.00 | 97% |
| 10 | ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය (LDSP) | 6,000.00 | 3,460.00 | 66% |

**2.4 අභියෝග**

I. 2020-2021 වර්ෂවල කොවිඩ් වසංගත තත්ත්වය නිසා ඉදිකිරීම් ක්ෂේත්‍රය තුළ පුද්ගලික අංශයේ ශක්‍යතාවය අඩුවීම.

II. විදේශ විනිමය අර්බුදය නිසා ඇතිවූ ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාළ අමුද්‍රව්‍ය විශේෂයෙන් සිමෙන්ති, යකඩ වැනි ද්‍රව්‍යවල හිඟකම සහ මිල ගණන් අධික ලෙස ඉහළ යාම.

III. කොවිඩ් වසංගත කාලය තුළ කළමනාකරණ සේවා ඉටු කිරීමට නොහැකිව අපතේ ගිය කාල සීමාව.

IV. ඉදිකිරීම් ක්ෂේත්‍රයේ භාණ්ඩවල මිල නිරන්තරයෙන් වැඩිවීම නිසා නැවත ඇස්තමේන්තු සකස් කිරීමට සිදුවීම.

V. ආනයනික භාණ්ඩවල මිල ඉහළ යාම හා හිඟ වීම.

VI. රටේ පවතින ආර්ථික අර්බුදය නිසා ප්‍රමාණවත් ලෙස අයැවය ප්‍රතිපාදන නොලැබීම සහ රාජ්‍ය ආයතනවල වියදම් සීමා කිරීමේ රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලව කටයුතු කිරීමට සිදුවීම.

### 2.5 ඉදිරි ඉලක්ක

1. පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මඟින් පළාත් පාලන ආයතනවල සේවා සැපයීමේ කාර්යක්ෂමතාවය හා ඵලදායීතාව වැඩිදියුණු කිරීම.
2. පළාත් පාලන ආයතන පුස්තකාල සංවර්ධනය කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමෙන් නවීන දැනුම ළඟා කර ගැනීම වැඩි දියුණු කිරීම.
3. පළාත් පාලන ආයතනවල ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ධාරිතාවය ශක්තිමත් කිරීම.
4. KOICA ආධාර යටතේ වව්නියාව සහ බදුල්ල දිස්ත්‍රික්ක කේන්ද්‍ර කරගනිමින් ක්‍රියාත්මක කිරීමට නියමිත ඒකාබද්ධ කසළ කළමනාකරණ ව්‍යාපෘතියෙහි කටයුතු ආරම්භ කිරීම.
5. දිවයිනේ සියලුම පළාත් පාලන ආයතනවල අපද්‍රව්‍ය කළමනාකරණය ශ්‍රේණිගත කිරීමේ ක්‍රමවේදය සකස් කිරීම.
6. සියලුම පළාත් පාලන ආයතනවල අපද්‍රව්‍ය කළමනාකරණය විධිමත් කිරීම සඳහා මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කිරීම
7. පළාත් සඳහා වඩාත් ඵලදායි හා කාර්යක්ෂම අයුරින් ක්‍රියාත්මකවීමට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සහ අවශ්‍ය අවස්ථාවලදී උපදෙස් ලබා දීමට කටයුතු කිරීම.
8. පළාත් ආණ්ඩුකාර සමුළුව කාර්තුවකට එක බැගින් පැවැත්වීම.
9. මධ්‍යම රජය හා පළාත් සභා අතර විධිමත් සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් ගොඩනැගීම සඳහා පළාත් ප්‍රධාන ලේකම්වරුන් හා මධ්‍යම රජයේ ආයතන සම්බන්ධ කර ගනිමින් අන්තර් පළාත් විෂය සම්බන්ධීකරණ සමුළුව මාස දෙකකට වරක් පැවැත්වීම සහ සමුළුවේදී මතුවන ගැටළු සඳහා පළාත් නවයටම අදාල වන ඒකීය ක්‍රම හඳුන්වා දීම.
10. පළාත් පාලන ආයතන අයවැය සම්පාදනය කිරීමේ ක්‍රියාවලියට අදාළ රීති, රෙගුලාසි හා අතුරු ව්‍යවස්ථා යාවත්කාලීන කිරිම.
11. රජය විසින් ගනුලබන ප්‍රතිපත්තිමය තීරණ පරිදි පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් පනත සංශෝධනය කිරීම.
12. රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ පරිදි පළාත් සභා ඡන්ද විමසීම් පනත සංශෝධනය කිරීම.
13. රජයේ ප්‍රතිපත්තිමය තීරණ මත නව පළාත් පාලන ආයතන සංස්ථාපන යෝජනා සලකා බැලීම සහ ගැසට් නිවේදන නිකුත්කිරීම.
14. නව පළාත් පාලන ආයතන සංස්ථාපන අනුව කොට්ඨාස සීමා නිර්ණය කිරීම සහ ගැසට් නිවේදන නිකුත් කිරීම.
15. රජය විසින් ගනු ලබන ප්‍රමඛතා පදනම් කොට ගෙන පළාත් පාලන පාලන ව්‍යවස්ථාවල හඳුනා ගනු ලබන සංශෝධන සිදුකිරීම.
16. සංචාරකයින්ගේ ආකර්ෂණයට ලක්ව ඇති ප්‍රදේශයක කණ්ඩලම සංචාරක බංගලාව පිහිටා ඇති නිසා එය වැඩිදියුණු කොට මෙම අංශයේ ආදායම් උත්පාදන මාර්ගයක් බවට පත්කිරීම.
17. Empowering Local Government - A Comprehensive Digitalization Project for Local Government ව්‍යාපෘතියේ ඉදිරි මෘදුකාංග සංවර්ධන කටයුතු සිදු කිරීම. සියලුම පළාත් සභා සඳහා මෙම මෘදුකාංග පද්ධතිය හඳුන්වා දීම හා පළාත් පාලන ආයතන 150 මෙම මෘදුකාංග පද්ධතිය ස්ථාපනය කිරිම. එම පළාත් පාලන ආයතන වල නිලධාරින් පුහුණු කිරිම.
18. එක් එක් ව්‍යාපෘතීන්ට අදාළව ජාතික මෙහෙයුම් කමිටු (NSC) රැස්වීම් 06ක් පැවැත්වීම හා ඒ තුළින් පැන නගින ගැටලු නිරාකරණය කිරීම
19. ව්‍යාපෘති ප්‍රගතිය පසුවිපරම් කිරීම හා මාසික ප්‍රගති වාර්තා සකස් කිරීම
20. කිරුළපන ජල පෝෂක ප්‍රදේශය සඳහා නව ගුරුත්වාකර්ෂණ කාණු, බල ප්‍රධාන මාර්ග සහ පොම්පාගාර සැපයීම
21. ***a) DLI 1*** - ඉලක්කගත පාසල් 500ක අවම වශයෙන් 80%ක සිසුන්ගේ ඉංග්‍රීසි භාෂා ඉගෙනීමේ ප්‍රතිඵල වැඩිදියුණු කිරීම.

    ***b) DLI 2*** ඉලක්කගත පාසල් 500ක අවම වශයෙන් 80%ක සිසුන්ගේ ගණිත භාෂා ඉගෙනීමේ ප්‍රතිඵල වැඩිදියුණු කිරීම

    ***c) DLI 3*** අමතර වෘත්තිය සුදුසුකම් ලත් ගුරුවරුන් 20,000ක් ඇති කිරීම (ඔවුන්ගෙන් අවම වශයෙන් 50%ක් කාන්තාවන් වීම)

    ***d) DLI 4*** පාසල් මට්ටමින් සනීපාරක්ෂක පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම ඇතුළුව වැඩි දියුණු කරන ලද පාසල් සෞඛ්‍ය හා පෝෂණවැඩසටහන අවම වශයෙන් පාසල්

1,250ක නිශ්චිත මට්ටම් දක්වා ප්‍රගුණ කිරීම22. දේශීය ණය සහ සංවර්ධන අරමුදල යටතේ ණය ලබාදීම සඳහා පමණක් සීමා නොවී ඉන් ඔබ්බට කාර්යයන් කිරීමට හැකි ආයතනයක් බවට පත්කිරීම.

23. දේශීය ණය සහ සංවර්ධන අරමුදල යටතේ ණය ලබාදීමේ ක්‍රියාවළිය විධිමත් සහ කාර්යක්ෂම කිරීම සඳහා යහපත් යාන්ත්‍රණයක් සැකසීම.

24. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය යටතේ යහපාලන පළාත් සභා හා පළාත් පාලන ක්‍රමයක් උදෙසා එම ක්ෂේත්‍රයන්හි මහජන නියෝජිතවරුන් හා නිළධාරීන්ගේ ධාරිතා වර්ධනය.

25. පළාත් සභා හා පළාත් පාලන ක්ෂේත්‍රයේ පර්යේෂණ සිදුකිරීම හා තොරතුරු බෙදා හැරීම.

26. තෝරාගත් පළාත් පාලන ආයතනවල නිලධාරීන් සහ නියෝජිතයින් සඳහා උපදේශන මාර්ගෝපදේශන අත්පොත සකස් කිරීම

27. ඌව, රජරට සහ සබරගමුව විශ්ව විද්‍යාල සමග ඒකාබද්ධව සහතික පත්‍ර පාඨමාලා ආරම්භ කිරීම

28. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය සමග එක්ව පළාත් පාලනය පිළිබඳ බාහිර උපාධි පාඨමාලාවක් ආරම්භ කිරීම

## 2.6. දේශීය අරමුදල් මත ක්‍රියාත්මකවන වැඩසටහන් හා ව්‍යාපෘතිවල කාර්යසාධනය

### 2.6.1. සංවර්ධන අංශය

### 1. අරමුණ

පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල ජීවත් වන ප්‍රජාවන්ට එම ආයතනවලින් ප්‍රතිලාභ සැලසෙන පරිදි යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා දේශීය අරමුදල් යෙදවීම මගින් මහජන සේවා සම්පාදනය කාර්යක්ෂම හා ඵලදායී කිරීම සහ ඒ මඟින් අන්තර් පළාත් විෂමතා අවම කිරීමට දායකත්වය ලබා දීම.

### 2. 2023 වර්ෂයේ සිව්වන කාර්තුව අවසානය දක්වා ප්‍රගතිය

<u>සංවර්ධන අංශයේ සමස්ත ප්‍රගතිය</u>

| අ.අ. | වැඩසටහන | 2023 ප්‍රතිපාදන ( රු.) | 2023 වර්ෂය සඳහා අනුමත මුදල (රු.) | 2023.12.31 දිනට වියදම (රු.) | මූල්‍ය ප්‍රගතිය | භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|
| 1 | පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන (ප්‍රාග්ධන) | 200,000,000.00 | 185,626,853.46 | 86,866,361.75 | 47% | 65% |
| 2 | ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන (පුනරාවර්තන) (අයවැය චක්‍රලේඛ 01/2023 අනුව 6% ක් කපා හැරීමෙන් පසු ඉතිරි වන ප්‍රතිපාදන ප්‍රමාණය) | 51,700,000.00 | 27,797,840.61 | 22,524,342.46 | 81% | 87% |
| 3 | පුස්තකාල සංවර්ධන වැඩසටහන | 15,000,000.00 | 3,304,642.97 | 2,334,023.08 | 70% | 75% |
| 4 | ප්‍රාදේශීය සභා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන (2021 අයවැය යෝජනා - 36) | 202,104,000.00 | 135,882,289.20 | 129,345,913.29 | 95% | 98% |
| 5 | බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ හිඟ බිල්පත් නිරවුල් කිරීම | 1,500,000,000.00 | 1,500,000,000.00 | 1,500,000,000.00 | 100% | 100% |
| | එකතුව | **1,968,804,000.00** | **1,852,611,626.24** | **1,741,070,640.58** | **78%** | **85%** |

2023 වර්ෂය සඳහා සංවර්ධන අංශය වෙත පහත සඳහන් වැඩසටහන් යටතේ රු. 1,968,804,000.00 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් වී ඇති අතර 2023.12.31 වන විට රු. 1,741,070,640.58 ක මුදලක් වැඩ අවසන් ව්‍යාපෘතිවල අතැති බිල්පත් නිරවුල් කිරීම සඳහා යොදා ගෙන ඇත. එක් එක් ප්‍රධාන සංවර්ධන වැඩසටහන් යටතේ 2023.12.31 දින වන විට ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

## 1. පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන (ප්‍රාග්ධන)

2023 වර්ෂය සඳහා වෙන් වූ රු. 200,000,000.00 ක ප්‍රතිපාදන මඟින් 2021 වර්ෂයේ අනුමත කර ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 08 කට අදාල අතැති බිල්පත් පියවීම සඳහා ප්‍රමුඛතාවය ලබා දෙන ලදී.

ඉතිරි වන ප්‍රතිපාදන මඟින් 2021 වර්ෂයේ ආරම්භ කර අර්ධ වශයෙන් නිම කර ඇති ව්‍යාපෘති අතරින් ආදාහනාගාර හා පොදු වැසිකිළි වලට අදාළ ව්‍යාපෘතිවල ඉතිරි වැඩ කොටස් සම්පූර්ණ කිරීම සඳහා පමණක් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් 2023.09.18 දිනැති ලිපිය මඟින් එකඟතාවය ලබා දී ඇත. ඒ අනුව 2023 වර්ෂය සඳහා ව්‍යාපෘති 10 ක් අනුමත කල අතර ඉන් ව්‍යාපෘති 3 ක වැඩ 2023.12.31 දින වන විට අවසන් කිරීමට හැකි විය.

ආදාහනාගාර ඉදි කිරීමේ ව්‍යාපෘති 2023 වර්ෂයේ ඉතිරි වී තිබූ කාල සීමාව තුල අවසන් කිරීමේදි කාලය ප්‍රමාණවත් නොවීම හා වසර අග භාගයේදි රටෙහි පැවති අයහපත් කාලගුණික තත්වය (අධික වර්ෂාව) නිසා ඉදි කිරීමේ කටයුතු නිසි පරිදි සිදු කිරීමට නොහැකි වීම යන හේතුන් නිසා මෙම වැඩසටහන යටතේ ක්‍රියාත්මක කල ව්‍යාපෘතිවල ප්‍රගතිය පහත පරිදි වේ.

| | |
|---|---|
| 2023 ප්‍රතිපාදන (රු.) | 200,000,000.00 |
| අනුමත ව්‍යාපෘති ගණන | 18 |
| අනුමත මුදල (රු.) | 185,626,853.46 |
| 2023.12.31 දිනට මුළු වියදම (රු.) | 86,866,361.75 |
| 2023.12.31 දිනට වැඩ අවසන් කල ව්‍යාපෘති ගණන | 11 |
| මූල්‍ය ප්‍රගතිය | 47% |
| භෞතික ප්‍රගතිය | 65% |



රක්වාන නගරයේ පොදු වැසිකිළි පද්ධතියක් ඉදි කිරීම
ගොඩකවෙල ප්‍රාදේශීය සභාව - සබරගමුව පළාත



හබරණ නගරයේ පොදු වැසිකිළි පහසුකම් ඇති කිරීම
කැකිරාව ප්‍රාදේශීය සභාව - උතුරු මැද පළාත

## 2. ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන (පුනරාවර්තන)

2023 වර්ෂය සඳහා වෙන් වූ රු. 51,700,000.00 ක ප්‍රතිපාදන 2021 වර්ෂයේ අනුමත කර ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 24 කට අදාලව අතැති බිල්පත් පියවීම සඳහා ප්‍රමුඛතාවය ලබා දෙන ලදී.

අතැති බිල්පත් පියවීමෙන් පසු ඉතිරි වන ප්‍රතිපාදන මඟින් වර්ෂයේ ඉතිරි වී තිබූ කාල සීමාව තුල ප්‍රාදේශීය සභාවල දෛනික රාජකාරි කටයුතු කාර්යක්ෂමව හා ඵලදායී ලෙස පවත්වා ගෙන යාමට අවශ්‍ය කරන අළුත්වැඩියා හා නඩත්තු

කටයුතු සිදු කිරීම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් මගින් එකඟතාවය ලබා දෙන ලදී.

ඒ අනුව, 2023 වර්ෂයේ පුනරාවර්තන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ඇස්තමේන්තු කැඳවීම සිදු කල අතර ලැබුණු යෝජනා අතරින් මෙම අවස්ථාවේදී ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු අත්‍යවශ්‍ය අළුත්වැඩියා හා නඩත්තු යෝජනා තෝරා ගෙන ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලදී.

| | |
|---|---|
| 2023 ප්‍රතිපාදන (රු.) | 51,700,000.00 |
| අනුමත ව්‍යාපෘති ගණන | 62 |
| අනුමත මුදල (රු.) | 27,797,840.61 |
| 2023.12.31 දිනට මුළු වියදම (රු.) | 22,524,342.46 |
| 2023.12.31 දිනට වැඩ අවසන් කල ව්‍යාපෘති ගණන | 54 |
| මූල්‍ය ප්‍රගතිය | 81% |
| භෞතික ප්‍රගතිය | 87% |

### 3. පුස්තකාල සංවර්ධන වැඩසටහන

මෙම වැඩසටහන සඳහා අයවැය චක්‍රලේඛ අංක 02/2023 මගින් ලබා දුන් උපදෙස් පරිදි 2023 වර්ෂය සඳහා වෙන් වූ ප්‍රතිපාදන වලින් නව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමක් තුන්වන කාර්තුව දක්වා සිදු නොකරන ලදී.

පසුව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් 2023.08.18 දිනැති ලිපිය මගින් ලබා දුන් උපදෙස් පරිදි පුස්තකාලවල අත්‍යවශ්‍ය අළුත්වැඩියා කටයුතු සඳහා යෝජනා කැඳවීම කටයුතු කරන ලදී.

තවද මෙම වැය ශීර්ෂය සඳහා 2024 වර්ෂයේදී ප්‍රතිපාදන වෙන් නොවීම හේතුවෙන් 2023 වර්ෂයේ අවසාන මාස 02 තුල අවසන් කිරීමට හැකියාවක්

දෙපාර්තමේන්තුව විසින් 2023.08.18 දිනැති ලිපිය ඇස්තමේන්තු සකස් කර එවීමට ප්‍රමාණවත් කාලයක් වසර අග නොතිබුණු බැවින් මෙම වැඩසටහන සඳහා වෙන් වූ ප්‍රතිපාදන සීමාව තුල ව්‍යාපෘති අනුමත කිරීමට නොහැකි විය.

රටෙහි පැවති අයහපත් කාලගුණික තත්වය (අධික වර්ෂාව) නිසා අනුමත කරන ලද ව්‍යාපෘති සඳහා කොන්ත්‍රාත්කරුවන් ව්‍යාපෘති ඉටු කිරීමට ඉදිරිපත් නොවුණි.



අයගම සතිපොළ අසල බහුකාර්යය ගොඩනැඟිල්ලේ වහලය අළුත්වැඩියා කිරීම
අයගම ප්‍රාදේශීය සභාව - සබරගමුව පළාත
වැය කල වටිනාකම - රු. 404,286.97



ප්‍රගති උයන ප්‍රජා ශාලාව සංවර්ධනය කිරීම
බද්දේගම ප්‍රාදේශීය සභාව - දකුණු පළාත
වැය කල වටිනාකම - රු.171,636.32

පවතින ව්‍යාපෘති පමණක් තෝරා ක්‍රියාත්මක කිරීමට සිදු විය.

| | |
|---|---|
| 2023 ප්‍රතිපාදන (රු.) | 15,000,000.00 |
| අනුමත ව්‍යාපෘති ගණන | 08 |
| අනුමත මුදල (රු.) | 3,304,642.97 |
| 2023.12.31 දිනට මුළු වියදම (රු.) | 2,334,023.08 |
| 2023.12.31 දිනට වැඩ අවසන් කල ව්‍යාපෘති ගණන | 06 |
| මූල්‍ය ප්‍රගතිය | 70% |
| භෞතික ප්‍රගතිය | 75% |



බද්දේගම මහජන පුස්තකාලය සඳහා ඉදිරිපස වහලක් සකස් කිරීම
බද්දේගම ප්‍රාදේශීය සභාව - දකුණු පළාත
වැය කල වටිනාකම - රු. 250,000.00



කොට්ට්‍රාමුල්ල මහජන පුස්තකාලය අලුත්වැඩියා කිරීම
නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව - වයඹ පළාත
වැය කල වටිනාකම - රු. 290,879.15

**4. ප්‍රාදේශීය සභා යටිතල පහසුකම්සංවර්ධනය කිරීමේ වැඩසටහන (2021 අයවැය යෝජනා - 36)**

මෙම වැය විෂය යටතේ 2023 වර්ෂය සඳහා ප්‍රතිපාදන වෙන් වී තිබුණද 2021 වර්ෂයේ ආරම්භ කර වැඩ අවසන් ව්‍යාපෘතිවල අතැති බිල්පත් නිරවුල් කිරීමට හා දැනට අර්ධ වශයෙන් නිම වී ඇති ව්‍යාපෘතිවල වැඩ කොටස් නිම කිරීම වැනි කාර්යයන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙන ලදී.

2021 වර්ෂයේ මෙම වැඩසටහන යටතේ ක්‍රියාත්මක කර අර්ධ වශයෙන් නිම කර ඇති ව්‍යාපෘති අතරින් අත්‍යවශ්‍ය ආදාහනාගාර හා පොදු වැසිකිළි වලට අදාළ ව්‍යාපෘති පමණක් තෝරා පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන (ප්‍රාග්ධන) වැය විෂය යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් 2023.09.18 දිනැති ලිපිය මඟින් එකඟතාවය පල කර ඇත.

එබැවින් ඉහත සඳහන් කල පරිදි මෙම වැය ශීර්ෂය යටතේ අතැති බිල්පත් හා ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවල බිල්පත් පියවීම පමණක් සිදු කර ඇත.

| | |
|---|---|
| 2023 ප්‍රතිපාදන (රු.) | 202,104,000.00 |
| අනුමත ව්‍යාපෘති ගණන | 140 |
| අනුමත මුදල (රු.) | 135,882,289.20 |
| 2023.12.31 දිනට මුළු වියදම (රු.) | 129,345,913.29 |
| 2023.12.31 දිනට වැඩ අවසන් කල ව්‍යාපෘති ගණන | 137 |
| මූල්‍ය ප්‍රගතිය | 95% |
| භෞතික ප්‍රගතිය | 98% |



උකුවෙල පොදු වෙළඳපොළ ඉදි කිරීම
උකුවෙල ප්‍රාදේශීය සභාව - මධ්‍යම පළාත
වැය කල වටිනාකම - රු. 10,656,763.54



මාවතගම ප්‍රධාන සතිපොළ සංවර්ධනය කිරීම
මාවතගම ප්‍රාදේශීය සභාව - වයඹ පළාත
වැය කල වටිනාකම - රු. 6,457,187.67

### 2.6.2. ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානය

### 1. අරමුණ

පළාත් පාලන ආයතනයන්හි අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම ඵලදායී ලෙස ඉටු කර ගැනීම සඳහා සහය වන තාක්ෂණික හස්තය වශයෙන් ක්‍රියාත්මක වෙමින් සාර්ථක ක්‍රම පිළිබඳව තොරතුරු විසුරුවා හැරීමත්, විශේෂිත ස්ථාන සඳහා සුදුසු කසළ කළමනාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ මග පෙන්වීම.

### 2. 2023 වර්ෂයේ සිව්වන කාර්තුව අවසානය දක්වා ප්‍රගතිය

2023 වර්ෂය සඳහා ජාතික ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානය වෙත ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන් වෙනුවෙන් පහත වැය විෂයන් යටතේ ප්‍රතිපාදන වෙන් කර ඇත.

| | | |
|---|---|---|
| -ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති (130-2-21-016-2504) | - | රු. 300,000,000 |
| -අපද්‍රව්‍ය කළමනාකරණය සහ ප්‍රාදේශීය සභාවල යටිතල පහසුකම් සංවර්ධනය (130-2-21-024-2504) | - | රු. 125,000,000 |
| -බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රධාන සැලැස්ම සකස් කිරීම - නියමු ව්‍යාපෘතිය (130-2-21-027-2509) | - | රු. 50,000,000 |
| -Waste to Value ව්‍යාපෘතිය (130-2-21-027-2509) | - | රු. 275,000,000 |

ඉහත වැඩසටහන් යටතේ පළාත් පාලන ආයතනවල ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතු වැඩිදියුණු කිරීමේ අරමුණෙන් පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සිදු කරන ලදී.

01.කොම්පෝස්ට් අංගනවල යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම
02. අලි වැට ඉදිකිරීම
03. කසල කළමනාකරණ උපාංග ලබා දීම
04.මළ අපද්‍රව්‍ය ප්‍රතිකර්ම පද්ධති ඉදිකිරීම
05.ජීව වායු ඒකක ඉදිකිරීම

ඒ අනුව, 2023.12.31 දින වන විට ඉහත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිලිබඳ තොරතුරු පහත පරිදි වේ.

| වැඩසටහන | ප්‍රතිපාදන (රු.) | ව්‍යාපෘතියේ ස්වභාවය | භෞතික ප්‍රගතිය (%) | මූල්‍ය ප්‍රගතිය (%) | 2023.12.31දින ට වියදම (රු.) |
|---|---|---|---|---|---|
| ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන (ප්‍රාග්ධන) | 300,000,000.00 | 2021 වර්ෂයේ ව්‍යාපෘති සඳහා බිල්පත් පියවීම | 100 % | 80 % | 10,348,055.60 |
| 2021 වසරේ ක්‍රියාත්මක කළ අපද්‍රව්‍ය කළමනාකරණය - ප්‍රාදේශීය සභා (අයවැය යෝජනා 36) | 125,000,000.00 | 2021 වර්ෂයේ ව්‍යාපෘති සඳහා බිල්පත් පියවීම | 90% | 85% | 106,332,262.56 |
| බස්නාහිර පළාත් අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රධාන සැලැස්ම සකස් කිරීම - නියමු ව්‍යාපෘතිය | 50,000,000.00 | නියමු ව්‍යාපෘතියට අදාළ දේශීය බදු මුදල් නිරාකරණය කිරීම | 100% | 0.98% | 18,565,150.60 |



ගල්නෑව ගලි ප්‍රතිකර්ම



පොතුවිල් කොම්පෝස්ට්



කළුතර පොහොරවත්ත අපද්‍රව්‍ය හුවමාරු මධ්‍යස්ථානය

## 2.6.3. පළාත් පාලන අංශය

### 1. අරමුණ

ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන පද්ධතියේ කාර්ය සාධනය කළමනාකරණය කිරීම හා එහි කටයුතු නව තාක්ෂණයත් සමඟ එක් කිරීම මගින් සීඝ්‍ර සංවර්ධන දිශානතියකට යොමු කර වඩාත් මහජන හිතකාමී කාර්යක්ෂම පළාත් පාලන ආයතනයක් බිහිකිරීමට කටයුතු කිරීම.

### 2. 2023 වර්ෂයේ සිව්වන කාර්තුව අවසානය දක්වා ප්‍රගතිය

- **නව පළාත් පාලන ආයතන සංස්ථාපනය කිරීම.**

පළාත් පාලන ආයතන සංස්ථාපනය සඳහා ලකුණු දීමේ පටිපාටියක් (නිර්ණායක ඇතුළත් දිස්ත්‍රික් කමිටු වාර්තාවක්) සඳහා අංක අමප/17/1521/744/015 හා 2017.07.25 දිනැතිව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇති අතර,ඒ අනුව නව ආයතන සංස්ථාපනය හෝ පළාත් පාලන ආයතන වල සීමා මායිම් නිශ්චය කරනු ලබයි.

**ප්‍රගතිය :-**

ශ්‍රී ලංකාවේ පරිපාලන දිස්ත්‍රික්ක 25ට අයත් ප්‍රධාන අගනගර මහා නගර සභා බවට පත් කිරීම සම්බන්ධ ප්‍රතිපත්තිමය තීරණයට අනුව, ඊට අදාළව අංක අමප/22/1094/605/002 හා 2022.08.16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව මහා නගර සභා ස්ථාපිත කර නොමැති දිස්ත්‍රික්ක 07ක අග නගර සඳහා පවතින නගර සභා මහ නගර සභා බවට සංස්ථාපනය කිරීමේ කටයුතු සිදු කරන ලද අතර, මේවන විට කෑගල්ල,පුත්තලම, කළුතර,වව්නියාව සහ ත්‍රිකුණාමලය යන නගර සභා 05 මහා නගර සභා බවට සංස්ථාපනය කර ගැසට් නිවේදන නිකුත් කරන ලදී. අම්පාර හා මන්නාරම නගර සභා මහ නගර සභා බවට සංස්ථාපනය කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අමප/22/2003/605/002-II අමාත්‍ය මණ්ඩල තීරණය ලැබී ඇති අතර,එම දිස්ත්‍රික් කමිටු වාර්තා මේ වන විට ලැබී ඇති අතර එය ඉදිරි කටයුතු සඳහා ඉදිරිපත් කර ඇත.

- **සහෝදර නගර/ මිතුරු නගර සංකල්පය යටතේ විදේශ රාජ්‍යයන් සමඟ ගිවිසුම්වලට එළඹීම.**

ඇතැම් පළාත් පාලන ආයතන පළාත් සභා සහ පළාත් පාලන කටයුතු අමාත්‍යාංශයෙන් හෝ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ හෝ විදේශ කටයුතු අමාත්‍යාංශයේ හෝ අනුදැනුමකින් තොරව විදේශයන්හි පළාත් පාලන ආයතන සමඟ ගිවිසුම් ගත වීම හේතුවෙන් ඒ හරහා මෙරටට ලැබෙන මුදල් නිවැරදිව උපයෝජනය නොවූ අවස්ථා වාර්තා වූ බැවින් යථෝක්ත කාරණයට අදාළව “සහෝදර නගර/ මිතුරු නගර සංකල්පය යටතේ ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන හා විදේශ රටවල පළාත් පාලන ආයතන අතර ගිවිසුම්/ අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම” මැයෙන් අමාත්‍ය මණ්ඩල සංදේශයට ලද තීරණය ප්‍රකාරව අංක අමප/18/2679/913/001 හා 2018.11.28 දිනැතිව ලද අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ඒ සඳහා විද්වත් කමිටුවක් පත්කොට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය මඟින් පළාත් සභා වෙත පවරා ඇති විෂය පථය තුළ සහෝදර නගර/ මිතුරු නගර සංකල්පය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ක්‍රියා පටිපාටි, මාර්ගෝපදේශ සම්පාදනය සහ චක්‍රලේඛ නිකුත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කළ යුතු විය.

**ප්‍රගතිය :-**

සහෝදර නගර/ මිතුරු නගර සංකල්පය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන්නා වූ මාර්ගෝපදේශය සකස් කිරීම සඳහා සියලු කමිටු සාමාජිකයින්ගෙන් නිරීක්ෂණ සහ ඊට ඇතුළත් විය යුතු කරුණු පිළිබඳ අදහස් කැඳවා අවසන් කෙටුම්පත් මාර්ගෝපදේශය සකස් කර ඇත.එම මාර්ගෝපදේශය කාලීන අවශ්‍යතාවය මත සංශෝධනය කිරීම සඳහා කමිටුවක් පත් කර ඇත.

- **රාජ්‍ය ගිණුම් කාරක සභා කටයුතු සඳහා පළාත් පාලන ආයතන සම්බන්ධීකරණය කිරීම.**

පළාත් පාලන ආයතනවල විගණන කටයුතු සම්බන්ධයෙන් නිසි මහපෙන්වීමක් සිදු කරනු ලබයි.

**ප්‍රගතිය :-**

2021 වර්ෂයේ කුරුණෑගල මහ නගර සභාවට අදාළව පැවැති රැස්වීමේදී ලබා දුන් නියෝග පරිදි මේ වනවිට සියලුම පළාත් පාලන ආයතන සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශයක් සැකසීම වෙනුවෙන් සාමාජිකයින් 07 දෙනෙකුගෙන් යුත් කමිටුවක් පත් කර ඇති අතර, ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව විසින් ප්‍රකාශයට පත්කරන ලද 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශය හා ප්‍රසම්පාදන අත්පොත අදාල කර ගනිමින් එහි අවසන් කෙටුම්පත සකස් කර ප්‍රසම්පාදන කොමිෂන් සභාව වෙත යොමු කර ඇත.

❖ **පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හා මහජනතාව විසින් පාර්ලිමේන්තුව වෙත යොමු කරනු ලබන ගැටලු**

**පාර්ලිමේන්තු ප්‍රශ්න**

පළාත් සභා සහ පළාත් පාලන විෂය භාර ගරු අමාත්‍යතුමන් වෙතින් පිළිතුරු අපේක්ෂාවෙන් යොමු කරනු ලබන ගැටලු අදාළ පළාතේ ප්‍රධාන ලේකම් වෙත යොමු කර පළාත් වලින් ලබා ගන්නා නිරීක්ෂණ මත අදාළ පිළිතුරු පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ. 2023 වර්ෂය සඳහා ඉදිරිපත්වූ පාර්ලිමේන්තු ප්‍රශ්න ගණන 06ක් වන අතර, එම ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයා ඇත.

| පළාත | ප්‍රශ්න සංඛ්‍යාව |
|---|---|
| උතුරු මැද | 02 |
| නැගෙනහිර | 01 |
| දකුණ | 02 |
| බස්නාහිර | 01 |

- **මහජන පෙත්සම් කාරක සභාව/ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව**

පළාත් පාලන ආයතන වෙතින් තම අවශ්‍යතා ඉටු කර ගැනීමට නොහැකි වන ඇතැම් පුද්ගලයන් හා කණ්ඩායම් විසින් මහජන පෙත්සම් කාරක සභාව සහ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව මඟින් ඉදිරිපත් කරනු ලබන පෙත්සම් සඳහා අදාල පළාත් වෙතින් තොරතුරු ලබාගෙන එම පුද්ගලයන්ට සහන සැලසිය හැකි පරිදි මැදිහත්කරුවෙකු ලෙස කටයුතු කරනු ලබයි.

**ප්‍රගතිය**

2023 වර්ෂය සඳහා මහජන පෙත්සම් කාරක සභාව වෙතින් පෙත්සම් 04 ක් මෙම අංශය වෙත යොමු කර ඇති අතර එම පෙත්සම් 04ට අදාල පිළිතුරු මහජන පෙත්සම් කාරක සභා කාර්යාංශය වෙත යොමු කර ඇත.උපදේශක කාරක සභාව වෙතින් යෝජනා 12ක් ඉදිරිපත් වී ඇති අතර, එම යෝජනා අතුරින් 11ක් සඳහා පිළිතුරු උපදේශක කාරක සභාව වෙත යොමු කර ඇත.

- **මහජන පැමිණිලි විමර්ශනය කිරීම.**

මහ නගර සභා 24,නගර සභා 41 හා ප්‍රාදේශීය සභා 276 ක් ලෙස පිහිටුවා ඇති පළාත් පාලන ආයතනවලින් මහජනතාව හා විවිධ ආයතන වෙත සපයන සේවා සම්බන්ධයෙන් අතෘප්තියට පත් වුවහොත් එවැනි අවස්ථාවක ඒ සම්බන්ධව මෙම අමාත්‍යාංශය වෙත මහජනතාව හා විවිධ ආයතන විසින් පැමිණිලි යොමු කරනු ලැබේ. එලෙස යොමු කරනු ලබන පැමිණිලි සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ලබාදීම සඳහා අවස්ථාවෝචිත පරිදි අදාළ පළාත් ප්‍රධාන ලේකම් / පළාත් පාලන කොමසාරිස් / පළාත් පාලන ආයතන ප්‍රධානීන් වෙත යොමු කරනු ලැබේ.

| පළාත | ලැබූ පැමිණිලි සංඛ්‍යාව | ගත් ක්‍රියා මාර්ගය |
|---|---|---|
| බස්නාහිර | 2050 | පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කර ඇත. |
| මධ්‍යම | 1502 | |
| දකුණු | 105 | |
| උතුරු | 72 | |
| නැගෙනහිර | 215 | |
| වයඹ | 350 | |
| උතුරු මැද | 203 | |
| ඌව | 418 | |
| සබරගමුව | 302 | |
| පොදු | 115 | අදාළ ආයතනවලට යොමු කිරීම. |

- **පළාත් පාලන ආයතන සපයනු ලබන සේවාවන් සඳහා තොරතුරු තාක්ෂණ විසඳුම් ලබාදීම.**

2021 අංක 30 දරණ විසර්ජන පනත සංශෝධනය කිරීම යටතේ 2022 අගෝස්තු 30 වන දින ඉදිරිපත් කරන ලද අතුරු අයවැය යෝජනා අනුව එහි 10.4 වගන්තිය ප්‍රකාරව මහජනයා වෙත ලබා දෙන සේවා වඩාත් විධිමත්ව,කාර්යක්ෂම කිරීම හා ආදායම් කඩිනමින් එක්රැස් කර ගැනීම සඳහා මාර්ගගත ක්‍රමවේදයක් හඳුන්වා දීමට සියලුම පළාත් පාලන ආයතන විසින් ක්‍රියාකලයුතු බවට යෝජනා වී ඇත.

ඒ අනුව වයඹ පළාත් සභාව යටතේ පිහිටුවා ඇති වයඹ සංවර්ධන අධිකාරිය මගින් හඳුන්වා දෙනු ලබන CAT 2020 තොරතුරු තාක්ෂණ පද්ධතිය පළාත් පාලන ආයතනවල මාර්ගගත ක්‍රමවේද ඔස්සේ ගෙවීම් කටයුතු සිදු කිරීමටත් අවසන් ගිණුම සකස් කිරීමට සහ ආයතනය අභ්‍යන්තරයේ පවතින කාර්යය සුමට කිරීම සඳහා උපයෝගී කර ගත හැකි නවීන තාක්ෂණ විසඳුම් අදාල කර ගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇත.

**ප්‍රගතිය**

වයඹ සංවර්ධන අධිකාරිය මගින් හඳුන්වා දෙනු ලබන CAT 2020 තොරතුරු තාක්ෂණ පද්ධතිය ලබා ගැනීමට මේ වන විට පළාත් පාලන ආයතන 341 න් එකඟතාවය පළ කරන ලද පළාත් පාලන ආයතන ගණන 254 ක් වන අතර, මූලික පුහුණුව හා වරිපනම් දත්ත ඇතුලත් කිරීම ආයතන 148 ක් සිදුකර ඇත.

- **පළාත් පාලන ආයතන සඳහා කාර්ය සාධන මෙවලම හඳුන්වාදී ඒ අනුව ස්වර්ණපුරවර සම්මාන උළෙල පැවැත්වීම.**

පළාත් පාලන ආයතනවල කාර්යය සාධනය ඉහළ නැංවීමේ අරමුණින් පළාත් සභා පළාත් පාලන අමාත්‍යාංශය විසින් වසර කිහිපයක සිට පළාත් පාලන ආයතන වාර්ෂිකව ඇගයීමට ලක් කිරීම_ස්වර්ණපුරවර සම්මාන උළෙල මගින් සිදුකර ඇත.

2022 වසරේ ද පළාත් පාලන ආයතන කාර්ය සාධනය තරඟය හා ස්වර්ණපුරවර සම්මාන උළෙල පැවැත්වීමට සියලු කටයුතු සූදානම් කළ ද, එවකට රටතුළ උද්ගතවී පැවති ආර්ථික හා දේශපාලනික තත්වයන් මත හා වරින්වර නිකුත් කරන ලද වියදම් පාලන චක්‍රලේඛ පරිදි මෙම සම්මාන උළෙල පැවැත්වීමට නොහැකි විය.

නමුත් 2023 වසරේ පළාත් පාළන ආයතනවල කාර්ය සාධන තරඟය සහ ස්වර්ණපුරවර සම්මාන උළෙල පැවැත්වීමට මේ වන විට කටයුතු සම්පාදනය කරමින් පවතී.

**ප්‍රගතිය**

ආසියානු සංවර්ධන පදනමේ අනුග්‍රහයෙන් මෙම කාර්ය සාධන මෙවලම වර්තමානයට ගැලපෙන පරිදි සංශෝධනය කර, එය පළාත් මට්ටමින් සියළුම පළාත් පාලන ආයතන වෙත හඳුන්වාදීමේ පුහුණු වැඩසටහන් මාලාව ආසියානු සංවර්ධන පදනම සමඟ එක්ව අමාත්‍යාංශ නිලධාරීන් විසින් 2023.09.27 වන දින වනවිට සම්පූර්ණ කරන ලදී. සියලුම

පළාත් පාලන ආයතන තම ස්වයං ඇගයීම සිදුකරන අතර ඉන් අනතුරුව පළාත් මට්ටමින් විනිශ්චය කටයුතු සිදුකර අවසන්ව ඇති අතර මේ වනවිට ජාතික මට්ටමේ විනිශ්චය මණ්ඩලය විසින් විනිශ්චය කටයුතු සිදුකිරීම අවසන් අදියරේ පවතී.

## 2.6.4. පළාත් සභා අංශය

### 1. අරමුණ

පළාත් සභාවල ක්‍රියාකාරිත්වයට පහසුකම් සැලසීම, මධ්‍යම රජය හා පළාත් සභා අතර සම්බන්ධීකරණය හා පළාත් සභාවල මානව සම්පත් සංවර්ධනය මගින් ඵලදායී හා කාර්යක්ෂම පළාත් සභා ක්‍රමයක් ඇති කිරීම.

### 2. 2023 වර්ෂයේ සිදුවන කාර්තුව අවසානය දක්වා ප්‍රගතිය

a) ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පළාත් ආණ්ඩුකාරවරුන් සමඟ 2023 වසරේ සාකච්ඡා වාර 06ක් පවත්වා ඇත.

b) ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් රටේ පවතින කාලීන ගැටළු පිළිබඳව පළාත් ප්‍රධාන ලේකම්වරුන් සමඟ සාකච්ඡා වාර 06ක් පවත්වා ඇත.

c) ඉඩම් අත්කර ගැනීමට අදාලව සියළුම පළාත් වෙතින් ඉල්ලීම් 41ක් මෙම අමාත්‍යාංශය වෙත පළාත් ප්‍රධාන ලේකම්වරුන්ගේ නිර්දේශය සහිතව යොමු කර ඇති අතර, නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 31ක් (2022 වර්ෂයේ ලද යෝජනාවක් ද ඇතුලත්ව) ඉදිරි කටයුතු සඳහා ඉඩම් අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. අඩුපාඩු සහිතව යොමු කර ඇති අයදුම්පත් 11ක් අඩුපාඩු සකස් කර නැවත යොමු කරන ලෙස පළාත් ප්‍රධාන ලේකම්වරුන් වෙත දැනුම් දී ඇත.

04 වන වගන්තිය ප්‍රකාරව විරෝධතා පරීක්ෂණ පැවැත්වීම සඳහා පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශ සහිතව නිලධාරීන් 07 දෙනෙකු පත් කිරීමද, විරෝධතා නොමැති බවට වූ නිර්දේශ 05ක් ඉඩම් අමාත්‍යාංශයට යොමු කිරීම ද, 2022 වර්ෂයේ ලද යෝජනා 5ක් ද ඇතුලත්ව පරීක්ෂණ වාර්තා අනුව නිර්දේශ 12ක් ඉඩම් අමාත්‍යාංශය වෙත යොමු කිරීම ද, ඉඩම් අත්පත් අරමුණු සංශෝධනය කිරීම් 04ක් සඳහා නිර්දේශ ඉඩම් අමාත්‍යාංශය වෙත යොමු කිරීම ද, 38(අ) අතුරු විධානය යටතේ ඉඩම් අත්කර ගැනීමට අදාලව ඉඩම් අමාත්‍යාංශයට නිර්දේශ 11ක් ඉදිරිපත් කිරීමද 50(1) වගන්තිය යටතේ අත්හැරීම් 06ක් ද සිදු කර ඇත.

d) පළාත් සභා සඳහා අවශ්‍ය වන අමාත්‍ය මණ්ඩල සංදේශ 03ක් සකස් කර අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.

- පළාත් පාලන ආයතනවල මාර්ග සිතියම්ගත කිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා වන අමාත්‍ය මණ්ඩල සංදේශය.
- පළාත් පාලන ආයතනවල සේවය කරන තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් සේවකයින් ස්ථිර කිරීම සඳහා වන අමාත්‍ය මණ්ඩල සංදේශය.
- සබරගමුව පළාතේ ඉංග්‍රීසි ගුරුවරුන් පුහුණු කිරීමේ නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා වන අමාත්‍ය මණ්ඩල සංදේශය.

e) පළාත් පාලන ආයතන සතු දේපල වල තක්සේරු කටයුතු විධිමත් කිරීම මඟින් පළාත් පාලන ආයතන වෙත ලැබිය යුතු ආදායම් ඉහළ නැංවීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව හා පළාත් පාලන කොමසාරිස්වරුන් සම්බන්ධීකරණය කරමින් පළාත් පාලන ආයතන සතු දේපල වල තක්සේරු කටයුතු කඩිනම් කිරීමට ක්‍රමවේදයක් සකස් කර ඇත.

CDLG ව්‍යාපෘතිය සමඟ සම්බන්ධවී උතුර, නැගෙනහිර, උතුරු මැද හා ඌව යන

පළාත්වල පළාත් පාලන ආයතන සතු දේපළ හා වරිපනම් තක්සේරු කිරීම කඩිනම් කිරීම සඳහා කටයුතු ආරම්භ කර ඇති අතර එහි පසුවිපරම් කටයුතු සිදු කිරීම සඳහා පළාත් පාලන කොමසාරිස්වරුන් සම්බන්ධකර ගනිමින් වරින්වර රැස්වීම් පවත්වනු ලැබේ.

f) පළාත් රාජ්‍ය සේවයේ වයස අවුරුදු 45 ඉක්මවා පත්වීම් ලබා දී ඇති නිලධාරින් සඳහා විශ්‍රාම වැටුප් හිමිකම ලබා දීම සඳහා සකස් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය ගරු අග්‍රාමාත්‍ය, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගේ අත්සනට ඉදිරිපත් කර ඇත.

g) සංශෝධිත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99 යටතේ පළාත් සභාවල විශ්‍රාමික නිලධාරීන් වෙත වාහන බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධව පළාත් වලින් ලද අයදුම්පත් 109 අතරින් අඩුපාඩු සහිත අයදුම්පත් 16ක් නැවත පළාත් වෙත යොමු කල අතර නිවැරදි ලෙස යොමු කර ඇති අයදුම්පත් 94ක් (2022 වර්ෂයේ ලද අයදුම් පත් 01 ද ඇතුලත්ව) නිර්දේශ කර වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

h) පළාත් පාලන ආයතනවල විගණන කටයුතු ශක්තිමත් කිරීම සඳහා අභ්‍යන්තර විගණන ඒකක පිහිටුවීමට අදාලව පළාත් වෙතින් යෝජනා ගෙන්වා ගෙන ඇති අතර, එම ඒකකයන් පිහිටුවීම සඳහා අවශ්‍ය තනතුරු ඇති කිරීම පිළිබඳව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව සමඟ ද සාකච්ඡා කර ඇත. මේ වන විට යටපත් කල යුතු තනතුරු හඳුනා ගෙන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

i) පාර්ලිමේන්තුවෙන් යොමු කර ඇති පාර්ලිමේන්තු ප්‍රශ්න 04න් පාර්ලිමේන්තු ප්‍රශ්න 03ක් සඳහා පළාත් ප්‍රධාන ලේකම්වරුන්ගෙන් තොරතුරු ලබා ගෙන පිළිතුරු පාර්ලිමේන්තුව වෙත යොමු කර ඇති අතර, 2024 වසරේ පිළිතුරු දීමට යෝජිත ප්‍රශ්නයක් සඳහා පළාත් ප්‍රධාන ලේකම්වරුන්ගෙන් තොරතුරු කැඳවා ඇත.

j) 2023 වසරේ උපදේශක කාරක සභා වෙත ඉදිරිපත් කර ඇති යෝජනා 04ක් සම්බන්ධව හා 2022 වසරේ උපදේශක කාරක සභා වෙත ඉදිරිපත් කර ඇති යෝජනාවක් සම්බන්ධව පළාත් ප්‍රධාන ලේකම්වරුන්ගෙන් තොරතුරු කැඳවා උපදේශක කාරක සභාව වෙත පිළිතුරු යොමු කර ඇත.

k) මහජන පෙත්සම් කාරක සභා ව විසින් එවා ඇති මහජන පෙත්සම් 10න් පෙත්සම් 05කට මෙම අමාත්‍යාංශයේ නිර්දේශය මහජන පෙත්සම් කාරක සභාව වෙත යොමු කර ඇති අතර, අනිකුත් මහජන පෙත්සම් සඳහා පළාත් ප්‍රධාන ලේකම්වරුන් වෙතින් නිරීක්ෂණ හා නිර්දේශ කැඳවා ඇත.

l) පළාත් සභාවන්වල කටයුතුවලට අදාලව ජනාධිපති කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, අනෙකුත් අමාත්‍යාංශ ආයතන සහ මහජනතාව විසින් යොමු කරනු ලැබූ පැමිණිලි හා අභියාචනා 185ක් සම්බන්ධව අදාල පාර්ශව දැනුවත් කිරීමට කටයුතු කිරීම.

m) පළාත් සභා ධූරධාරීන් හා නිලධාරීන් සම්බන්ධ කරගත හැකි තොරතුරු කාර්තුමය වශයෙන් යාවත්කාලීන කිරීම සිදු කර ඇත.

## 2.6.5. නීති අංශය

### 1. අරමුණ

රටේ සමස්ථ ජනතාවගේ පොදු අපේක්ෂාවන් මුදුන් පත්වන ආකාරයට, ඵලදායීවූද , කාර්යක්ෂමවූද ජනතාවාදී ප්‍රාදේශීය ආණ්ඩුකරණයක් ශ්‍රී ලංකාව තුළ පවත්වා ගෙනයාම සහතික කරලීම සඳහාත්, සමානාත්මතාවයෙන් යුතු තිරසර මානව සංවර්ධනයක් ලබා කර ගැනීම සඳහාත්, පහසුකම් සළසාලීම සහ උපදෙස් ලබා දීම

පිණිස අමාත්‍යාංශයේ නීති අංශය ස්ථාපිත කර ඇත.

## 2. 2023 වර්ෂයේ සිව්වන කාර්තුව අවසානය දක්වා ප්‍රගතිය

**a) රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණය මත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනත සංශෝධනය කිරීම.**

පළාත් පාලන ආයතනවල තරුණ නියෝජනය සහතික කරනු වස් නාමයෝජනා පත්‍ර තුළ 25%ක තරුණ නියෝජනයක් අනිවාර්ය වන ආකාරයට ඉදිරිපත් වී තිබූ පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් දෙකක් සහ මැතිවරණ සහ ඡන්ද විමසීම් ව්‍යුහයේ සහ නීතිරීතිවල ප්‍රතිසංස්කරණ හඳුනා ගැනීමටත්, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවේ නිර්දේශ ද (පිටුව 11) පදනම් කොටගෙන නීති කෙටුම්පත් කිරීම සඳහා කටයුතු කර ඇත. අදාළ පනත් කෙටුම්පත මේ වනවිට පාර්ලිමේන්තුවේ සම්මත කර ඇත.

**b) පළාත් පාලන ආයතන වල ස්වයං උත්පාදන ආදායමෙන් වැඩි ප්‍රතිශතයක් ආවරණය කරන උසාවි දඩ මුදල්, මුද්දර ගාස්තු සෘජුවම පළාත් පාලන ආයතනයේ ගිණුමට යොමුවන පරිදි පළාත් සභා පනතේ ඉදිරි සංශෝධන කටයුතු අවසන් කිරීම.**

මෙම පනතේ සංශෝධන කටයුතු අවසන් කර මේ වන විට පළාත් සභා නොමැති බැවින් සෘජුව පාර්ලිමේන්තුව වෙත යොමු කිරීමේ හැකියාව පිළිබඳව නීතිපතිගේ උපදෙස් ලබා ගැනීම සඳහා අනුමැතිය පතමින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් හා අමාත්‍ය මණ්ඩල සටහනක් ඉදිරිපත් කර ඇත. දැනට පළාත් සභා විසිරී ඇති බැවින් පළාත් සභා සංස්ථාපනය වන තුරු අවසන් කිරීම පිළිබඳව ගැටළුවක් පවතී. කෙසේවෙතත් මේ පිළිබඳව ගතහැකි යම් ක්‍රියා මාර්ගයක් වේද යන්න පිළිබඳව නීතිපති විමසා 2023.11.02 දින ලිපියක් යොමු කර ඇති අතර එකී ලිපිය සම්බන්ධයෙන් පිළිතුරු නොලද හෙයින් නැවත 2024.01.19 දින නැවතත් සිහි කැඳවීම් ලිපියක් යොමු කර ඇත.

**c) පළාත් පාලන ආයතන සඳහා හඳුන්වා දී ඇති නව ගිණුම් ක්‍රමයට අදාල රීති සකස් කිරීමේ වැඩසටහන.**

පළාත් පාලන ආයතන සඳහා ඒකාකාරී නව ගිණුම් ක්‍රමයක් හඳුන්වා දීමත් සමඟ එම ආයතනවල පවත්නා රීති, රෙගුලාසි හා අතුරු ව්‍යවස්ථා එකී ගිණුම් සඳහා පළාත් සභා සතු තාක්ෂණික දැනුම අවම වීම හේතු කොටගෙන බස්නාහිර හා උතුරු මැද පළාත් සභා සඳහා පමණක් අදාළ යාවත්කාලීන කිරීම් සිදු කර තිබුණි. කෙසේවෙතත් එම රීතීන් වල වූ යම් යම් දෝෂ පිළිබඳව පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවේදී කරන ලද ප්‍රශ්න කිරීම් සැලකිල්ලට ගෙන අමාත්‍යාංශයේ නීති අංශය මැදිහත් වී අදාළ රීති, රෙගුලාසි හා අතුරු ව්‍යවස්ථා යාවත්කාලීනකිරීමේ කටයුතු අවසන් කර අදාළ වාර්තාව 2023.12.20 දින අමාත්‍යාංශයේ ලේකම්තුමා වෙත භාර දී ඇත.



**d) පළාත් පාලන ආයතනවල අතුරු ව්‍යවස්ථා යාවත්කාලීන කිරීමේ වැඩසටහන**

UNDP ආයතනයේ ආධාර මත CDLG ව්‍යාපෘතිය යටතේ හඳුනාගන්නා ලද ක්ෂේත්‍ර ගණනාවක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා සකස් කිරීමේ කාර්යය අමාත්‍යාංශයේ නීති අංශයේ මූලිකත්වය ගෙන ආරම්භ කර ඇත. එකී කටයුත්ත අවසන් කර අදාළ වාර්තාව 2023.12.20 දින අමාත්‍යාංශයේ ලේකම්තුමා වෙත භාර දී ඇත.



**e) රජයේ අයවැය යෝජනා අනුව යෝජිත නව පළාත් පාලන ආයතන සංස්ථාපනයට අදාල ගැසට් නිවේදන පිළියෙල කිරීම.**

2023 වර්ෂයේ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා නාමයෝජනා ඉදිරිපත් කළ හැකි වන පරිදි වවුනියාව, කළුතර, කෑගල්ල, පුත්තලම, ත්‍රිකුණාමලය යන ප්‍රධාන නගර සඳහා නව මහා නගර සභා 5 ක්ද, කළුතර , ත්‍රිකුණාමලය නගර හා කඩවත්සතර යන ප්‍රදේශ සඳහා ප්‍රාදේශීය සභා 2 ක්ද අළුතින් සංස්ථාපනය කිරීමට අදාළ ගැසට් නිවේදන නිකුත් කර ඇත.

**f) නව පළාත් පාලන ආයතන සංස්ථාපනය කිරීමෙන් අනතුරුව කොට්ඨාස සීමා නිර්ණය කිරීමට අදාල කටයුතු.**

අළුතින් සංස්ථාපනය කරන ලද පළාත් පාලන ආයතන 7 සඳහා කොට්ඨාස සීමා නිර්ණය කිරීමේ කටයුතු අමාත්‍යවරයා විසින් පත්කරන ලද කමිටුවක් මඟින් සිදු කර අවසන් කර ඇත.

**g) ජලහීතිකා ආඥා පනතේ සංශෝධන කටයුතු අවසන් කිරීම.**

අවසන් පනත් කෙටුම්පත සකස් කිරීම සඳහා 2023.09.08 දින නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඇති අතර නීති කෙටුම්පත් සම්පාදක විසින් සකස් කරන ලද පනත් කෙටුම්පත 2024.01.24 දින අමාත්‍යාංශය වෙත ලැබී ඇත.

❖ **නීති අංශය විසින් ඉටු කරන ලද අනෙකුත් ප්‍රමුඛ රාජකාරි**

1. රජයේ ප්‍රතිපත්තිමය තීරණ මත පළාත් පාලන ආයතන කොට්ඨාස සීමා නිර්ණය කිරීම සඳහා පත්කරනලද ජාතික කමිටුවේ කටයුතු සම්බන්ධීකරණය.
2. පළාත් පාලන ආයතන මැතිවරණය කල් යාම හේතුවෙන් අපහසුතාවයට පත් වූ රාජ්‍ය නිලධාරින්ට සහන සලසනු වස් ඔවුන් වෙනත් සේවා ස්ථාන වෙත යොමු කොට නැවත රාජකාරියට වාර්තා කිරීමට පහසුකම් සලසා දීම.



## 2.6.6. පාලන හා පුහුණු අංශය

### 1. අරමුණ

මානව සම්පත කලමනාකරණය හා ධාරිතාවන් සංවර්ධන කිරීමට කුසලතාවයන් සපිරි නිලධාරි පිරිසක් බිහි කිරීම සහ පවත්නා භෞතික සම්පත් උපරිම ඵලදායිතාවයෙන් යොදා ගනිමින් පළාත් සභා හා පළාත් පාලන අංශයේ අපේක්ෂිත ඉලක්ක ලඟා කර ගැනීමට සම්පත් මෙහෙයවීම.

## 2. 2023 වර්ෂයේ සිවිවන කාර්තුව අවසානය දක්වා ප්‍රගතිය

| අනු අංකය | කාර්යය / වියදම | ශුද්ධ ප්‍රතිපාදන (රු.) | වැයකල මුදල (රු.) | ප්‍රගතිය (%) |
|---|---|---|---|---|
| 01 | යන්ත්‍රෝපකරණ නඩත්තුව (රාජ්‍ය අමාත්‍ය කාර්යාලය සහ අමාත්‍යාංශය) | 3,470,000.00 | 3,359,187.25 | 96% |
| 02 | වාහන නඩත්තුව (රාජ්‍ය අමාත්‍ය කාර්යාලය සහ අමාත්‍යාංශය) | 29,640,445.00 | 19,101,752.91 | 80% |
| 03 | දේශීය හා විදේශීය පුහුණු (රාජ්‍ය අමාත්‍ය කාර්යාලය සහ අමාත්‍යාංශය) | 500,000.00 | 496,982.00 | 99% |
| 04 | ඉන්ධන ලබාදීම් (රාජ්‍ය අමාත්‍ය කාර්යාලය සහ අමාත්‍යාංශය) | 29,280,000.00 | 27,865,251.57 | 98% |
| 05 | ගොඩනැගිලි නඩත්තුව (රාජ්‍ය අමාත්‍ය කාර්යාලය සහ අමාත්‍යාංශය) | 4,841,000.00 | 390,635.00 | 8% |
| 06 | ජල හා විදුලි බිල්පත් ගෙවීම් (රාජ්‍ය අමාත්‍ය කාර්යාලය සහ අමාත්‍යාංශය) | 14,510,000.00 | 13,610,480.04 | 93% |
| 07 | තැපැල් හා සන්නිවේදන ගාස්තු (රාජ්‍ය අමාත්‍ය කාර්යාලය සහ අමාත්‍යාංශය) | 6,206,000.00 | 4,780,179.53 | 77% |
| 08 | බාහිර සේවා ලබාගැනීම්<br>සනීපාරක්ෂක සේවා →<br>ආරක්ෂක සේවා → | පොදු වැය ශීර්ෂයක් මගින් ගෙවීම් කටයුතු සිදුකරනු ලබයි. | 8,164,410.92<br>3,982,039.50 | පොදු වැය ශීර්ෂයක් මගින් ගෙවීම් කටයුතු සිදුකරනු ලබයි. |
| 09 | කාර්යය මණ්ඩලයේ වැටුප් වර්ධක ගෙවීම්, උසස් කිරීම්/ විශ්‍රාම ගැන්වීම් කටයුතු | - | - | 100% |
| 10 | කාර්ය මණ්ඩල වලට අදාල රාජකාරී | - | - | ස්ථානමාරුවීම් ලැබීගිය නිලධාරීන් සංඛ්‍යාව = 22<br><br>ස්ථානමාරුවීම් ලැබී පැමිණි සංඛ්‍යාව = 21 |
| 12 | අමාත්‍ය කාර්ය මණ්ඩල පත්කිරීම් හා අදාල කටයුතු | - | - | 100% |
| 12 | නිලධාරීන්ගේ පෞද්ගලික සුභසාධනය හා දුක්ගැනවිලි කළමනාකරණය සම්බන්ධ කටයුතු | - | - | පවතින සීමාවන් තුල හැකි උපරිම අන්දමින් ඉටුකර ඇත. |
| 13 | පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම | - | - | 100% |
| 14 | අමාත්‍ය මණ්ඩල සංදේශ පිලිබඳ කටයුතු | - | - | 100% |

## ❖ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය

### 1. අරමුණ

පළාත් පාලන ආයතන වලින් සපයන මහජන සේවාවන් මාර්ගගත ක්‍රමය ඔස්සේ සපයමින් මහජනතාවගේ ජීවන තත්වය උසස් කිරීමට කටයුතු කිරීම හා තොරතුරු තාක්ෂණය භාවිතයෙන් අමාත්‍යාංශයේ රාජකාරී කටයුතු පහසු කිරීමට සහය වෙමින් කඩදාසි වලින් තොර පරිසරයක් පවත්වාගෙන යාමට කටයුතු කිරීම.

### 2. 2023 වර්ෂයේ සිච්චන කාර්තුව අවසානය දක්වා ප්‍රගතිය

**a) පළාත් පාලන ආයතන සපයන සේවා සඳහා තොරතුරු තාක්ෂණික විසඳුම් ලබාදීමට සකස් කරන ලද Empowering Local Government - A Comprehensive Digitalization Project for Local Government ව්‍යාපෘතිය**

පළාත් පාලන ආයතන සපයන සේවා සඳහා තොරතුරු තාක්ෂණික විසඳුම් ලබාදීමේ වැඩසටහන යටතේ මධ්‍යම පළාතේ සියළුම පළාත් පාලන ආයතන සඳහා මාර්ගස්ථ ක්‍රමය ඔස්සේ ගෙවීම් සිදුකිරීමේ මෘදුකාංගය එළිදැක්වීමේ සමාරම්භක උත්සවය, රාජ්‍ය අමාත්‍ය ගරු ජානක වක්කුඹුර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2023.12.23 දින අකුරණ ප්‍රාදේශීය සභා පරිශ්‍රයේදී සිදු කෙරිනි.

සබරගමු පළාතේ සියලුම පළාත් පාලන ආයතන වල, පළාත් පාලන ආයතන සපයන සේවා සඳහා තොරතුරු තාක්ෂණික විසඳුම් ලබාදීමේ වැඩසටහන යටතේ මාර්ගස්ථ ක්‍රමය ඔස්සේ ගෙවීම් සිදු කිරිම හඳුන්වාදීමේ වැඩසටහන 2023-12-29 දිනරාජ්‍ය අමාත්‍ය ගරු ජානක වක්කුඹුර මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් රත්නපුර නගර සභා ශාලාවේදී පැවැත්විණි.

**b) දෘඩාංග සහ මෘදුකාංග ගැටළු ඇතුළු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආශ්‍රිත කරුණු සඳහා සහය වීම**

දෘඩාංග සහ මෘදුකාංග ගැටළු සහිත නඩත්තුගත පරිගණක සංඛ්‍යාව හා නඩත්තුගත printers සංඛ්‍යාව 100 ක් වන අතර, එමගින් රජයට ඉතිරි කර දුන් මුදල රු.1,081,800.00 කි.

**c) අමාත්‍යාංශයේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම**

තොරතුරු තාක්ෂණ අංශයට එවා ඇති සියලුම තොරතුරු දින පදනම මත යාවත්කාලීන කර ඇත.




**d) අමාත්‍යාංශය ෆේස්බුක්පිටුව යාවත්කාලීන කිරීම**

තොරතුරු තාක්ෂණ අංශයට එවා ඇති සියලුම තොරතුරු දින පදනම මත යාවත්කාලීන කර ඇත.



**e) අමාත්‍යාංශයේ ICTA හි LGN 2.0 ව්‍යාපෘති කටයුතු සම්බන්ධීකරණය සහ අධීක්ෂණය.**

LGN 2.0 හි උඩුගත කිරීමේ සහ බාගත කිරීමේ වේගය 10 mbps සිට 20 mbps දක්වා වැඩි කිරීම

**f) අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ දැනුම වර්ධනය සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන් පැවැත්වීම.**

2023.08.11 දින හා 2023.09.22 දින කාර්ය මණ්ඩලයේ නිලධරයන් සඳහා කාර්යාල වැඩ පහසු කිරීමට තොරතුරු තාක්ෂණ භාවිතය හා අන්තර්ජාල භාවිතය පිලිබඳ වැඩමුලුවක් SLIDA ආයතනයේදී පැවැත්විය.

**g) අමාත්‍යාංශය තුළ කඩදාසි භාවිතයෙන් තොර පරිසරයක් පවත්වා ගැනීම**

ලේඛණාගාරය සඳහා මෘදුකාංග පද්ධතියක් සකස් කර ඉදිරි කටයුතු සඳහා පාලන අංශය වෙත භාර දීම.

**h) Zoom රැස්වීම් සඳහා යොමු සකස් කිරීමහා තාක්ෂණික සහය ලබා දීම.**

සකස් කරන ලද zoom යොමු ගණන = 196
සහභාගී වූ zoom/ භෞතිකරැස්වීම් ගණන = 201

### 2.6.7. මූල්‍ය අංශය

### 1. අරමුණ

පළාත් සභා සහ පළාත් පාලන අංශයේ දැක්ම හා මෙහෙවර සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය මූල්‍යමය පහසුකම් සපයාදීම සහ දේශීය සහ විදේශීය අරමුදල් ඵලදායීව හා කාර්යක්ෂමව යොදාගනිමින් මහජන මුදල් පිළිබඳව විනිවිද භාවයකින් යුතුව කටයුතු කිරීම

## 2. 2023 වර්ෂයේ සිව්වන කාර්තුව අවසානය දක්වා ප්‍රගතිය

<u>මූල්‍ය කාර්ය සාධනය -2023</u>

රු.මි.

| වැඩසටහන | 2023 සංශෝධිත අයවැය ඇස්තමේන්තුව | මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | **385.0** | **285.3** |
| පුද්ගල පඩිනඩි | 171.0 | 140.9 |
| වෙනත් පුනරාවර්තන වියදම් | | |
| මෙහෙයුම් | 159.0 | 121.9 |
| සංවර්ධන | 55.0 | 22.5 |
| **ප්‍රාග්ධන වියදම්** | **31,190.0** | **23,177.7** |
| **මෙහෙයුම්** | 65.0 | 24.6 |
| **සංවර්ධන** | | |
| වෙනත් ප්‍රාග්ධන වියදම් | 1,555.0 | 1,500.0 |
| දේශීය සංවර්ධන ව්‍යාපෘති | 842.1 | 335.1 |
| විදේශීය ආධාර ලබන සංවර්ධන ව්‍යාපෘති | 28,727.9 | 21,318.1 |
| **මුළු එකතුව** | **31,575.0** | **23,463.0** |

**පළාත් සභා සඳහා දායකත්වය**

රු.මි.

| වැඩසටහන | 2023 සංශෝධිත අයවැය ඇස්තමේන්තුව | මූල්‍ය ප්‍රගතිය |
|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | **379,250** | **346,870** |
| පුද්ගල පඩිනඩි හා වෙනත් | 379,250 | 346,870 |
| **ප්‍රාග්ධන වියදම්** | **17,000** | **15,958** |
| විදේශීය ආධාර ලබන සංවර්ධන ව්‍යාපෘති | 17,000.00 | 15,957.77 |
| **මුළු එකතුව** | **396,250** | **362,828** |

## 2.6.8. වියදම් විමංසන අංශය

### 1. අරමුණ

පළාත් සභා හා පළාත් පාලන ආයතනවල මූල්‍ය කටයුතු සම්බන්ධීකරණය හා විමංසනය කිරීම

### 2. 2023 වර්ෂයේ සිව්වන කාර්තුව අවසානය දක්වා ප්‍රගතිය

a) ඒ අනුව 2023 වර්ෂය තුළදී ද මධ්‍යම රජය විසින් දෙනු ලබන ප්‍රදානයන් හා පළාත් සභා ආදායම් ඇස්තමේන්තුගත වියදම් සීමාවන්ට යටත්ව එම ආයතන විසින් වියදම් කරනු ලබන ආකාරය පිළිබඳව අඛණ්ඩ ඇගයීමක් කරගෙන යනු ලබයි. ඒ අනුව 2023 ඔක්තෝබර් මාසය දක්වා මාසික පළාත් සභා මූල්‍ය කාර්යය සාධන වාර්තා සකස් කර අවසන් අතර, 2023 තෙවන කාර්තුව දක්වා පළාත් සභා මූල්‍ය කාර්යය සාධන කාර්තු වාර්තා සකස් කර ඇත.

b) පළාත් සභා හා පළාත් පාලන ආයතනවල සේවක සංඛ්‍යා සම්බන්ධයෙන් පවත්වා ගෙන යනු ලබන දත්ත පදනම 2023 වර්ෂය සඳහා යාවත්කාලීන කර ඇත.

c) පළාත් පාලන ආයතනයන්හි වර්ෂයේ ආදායම් හා වියදම් පිළිබඳ තොරතුරු ඇතුළත් දත්ත පදනම 2023 වර්ෂයට අදාලව වාර්ෂිකව යාවත්කාලීන කරන ලද අතර, එම තොරතුරු විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව පළාත් පාලන ආයතනවල මූල්‍ය කාර්යය සාධනය සම්බන්ධ 2022 වාර්ෂික වාර්තාව සහ 2023 අර්ධ වාර්ෂික වාර්තාවක් සකස් කර සියලුම පළාත් පාලන කොමසාරිස්වරුන් වෙත යවා ඇත. පළාත් පාලන ආයතන වන මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා වල පොදු පහසුකම් පිළිබඳ තොරතුරු රැස්කර එම තොරතුරු අදාළ වාර්තාවට ඇතුළත් කිරීමට කටයුතු කර ඇත.




**පළාත් පාලන ආයතනවල 2023 (අර්ධ වාර්ෂික) සත්‍ය ආදායම හා සත්‍ය වියදම -පළාත් වශයෙන්**

රු.මිලියන

| පළාත | සත්‍ය ආදායම | සත්‍ය වියදම | ප්‍රතිශතය |
|---|---|---|---|
| බස්නාහිර | 20,474 | 12,914 | 63% |
| මධ්‍යම | 4,137 | 3,408 | 82% |
| දකුණ | 3,526 | 2,763 | 78% |
| උතුර | 2,751 | 1,623 | 59% |
| වයඹ | 3,437 | 2,566 | 75% |
| උතුරු මැද | 1,180 | 1,075 | 91% |
| ඌව | 1,451 | 1,294 | 89% |
| සබරගමුව | 1,670 | 1,371 | 82% |
| නැගනහිර | 2,352 | 1,964 | 83% |
| **එකතුව** | **40,978** | **28,978** | **71%** |




d) මෙම අමාත්‍යාංශයේ මෙහෙයවීම යටතේ ක්‍රියාත්මක වන විදේශාධාර ව්‍යාපෘතීන්හි මූල්‍ය කාර්ය සාධනය හා සම්බන්ධ තොරතුරු මාසිකව ලබා ගෙන එම තොරතුරු පළාත් සභා මූල්‍ය කාර්ය සාධන වාර්තාවට ඇතුළත් කිරීමට කටයුතු කර ඇත.

e) පළාත් සභාවන්හි මූල්‍ය කටයුතු විමංසනය කිරීමේ අරමුණින් විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම, විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම, බැංකු සැසඳුම් පිළියෙළ කිරීම, අත්තිකාරම් ගිණුම් සැසඳීම, අග්‍රිම ගිණුම් සැසඳීම යනා දී කටයුතු සම්බන්ධයෙන් විශේෂයෙන් සකසා යවනු ලැබූ ආකෘති පත්‍ර මඟින් 2023 වර්ෂයේ තෙවන කාර්තුව දක්වා කාර්තු වාර්තා සකස් කර ඇත.

f) සියළුම පළාත් සභා වල රාජ්‍ය සේවක වැටුප් ගෙවීම් කටයුතු සිදු කිරීම සඳහා පළාත් සභා මට්ටමින් මාසිකව ඇස්තමේන්තු ලබා ගෙන අවශ්‍ය නිර්දේශ මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කර 2023 දෙසැම්බර් මස දක්වා වැටුප් ගෙවීම සිදු කරයි.

g) පළාත් සභා මට්ටමින් ක්‍රියාත්මක පාසල් පෝෂණ වැඩසටහන සඳහා පළාත් සභා සහ මහා භාණ්ඩාගාරය සම්බන්ධීකරණය කර ගෙවීම් කටයුතු සිදු කිරීම

h) පළාත් පාලන ආයතනවල මූල්‍ය හා භෞතික තොරතුරු සම්බන්ධ කළමනාකරණ තොරතුරු පද්ධතිය, දත්ත විශ්ලේෂණ හා දෘශ්‍යකරණ ඒකකය හා ඒකාබද්ධව විමංසනය කිරීම.

## 2.6.9. අභ්‍යන්තර විගණන අංශය

### 1. අරමුණ

අමාත්‍යාංශයේ අපේක්ෂිත අරමුණු ළඟා කර ගැනීමේදී භෞතික හා මානව සම්පත් කාර්යක්ෂම සහ ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා වන සාර්ථක අභ්‍යන්තර පාලන ක්‍රම පවතින්නේද යන්න ඇගයීම හා එම පාලන ක්‍රමයන්වල අගය එකතු කිරීම වැඩිදියුණු කිරීම සඳහා වන මාර්ගෝපදේශ සැපයීම.

### 2. 2023 වර්ෂයේ සිව්වන කාර්තුව අවසානය දක්වා ප්‍රගතිය

- මූලික වාර්තාව ඉදිරිපත් කිරීම.
- සංශෝධිත විගණන සැලැස්ම ඉදිරිපත් කිරීම.
- වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව 2023.12.31 දක්වා මාසික ප්‍රගතිය වාර්තා කිරීම.
- කළමනාකරණ විගණන කමිටු රැස්වීම් 03 ක් පැවැත්වීම.
- ව්‍යාපෘති අභ්‍යන්තර විගණන සමාලෝචන කමිටු රැස්වීම් වාර 03 ක් පැවැත්වීම.
- අමාත්‍යාංශයේ සහ විදේශීය ව්‍යාපෘති සම්බන්ධයෙන් කාර්තු වාර්තා ඉදිරිපත් කිරීම (I, II සහ III වන)
- අමාත්‍යාංශ ලේකම් විසින් පවරන ලද විශේෂ විගණන 01 ක් සිදු කිරීම. (පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය සම්බන්ධයෙන්)
- අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව විගණනයන් සිදු කිරීම

| විගණන ක්ෂේත්‍රය | ප්‍රගතිය % |
|---|---|
| 1. අමාත්‍යාංශයේ වාහන පරිපාලනය සම්බන්ධ විගණනය | 100 |
| 2. පළාත් පාලන ආයතන සතු ග්‍රාමීය පුස්තකාල සංවර්ධනය කිරීම හා නූතන තොරතුරු තාක්ෂණය යොදා ගනිමින් පවතින පුස්තකාල විද්‍යුත් පුස්තකාල බවට පරිවර්තනය කිරීම පිළිබඳ විගණනය | 100 |
| 3. රාජ්‍ය ගිණුම් කාරක සභා කටයුතු සඳහා පළාත් පාලන ආයතන සමඟ පෙනී සිටීම හා සම්බන්ධීකරණය කිරීම සම්බන්ධ විගණනය | 100 |
| 4. වැටුප් ගෙවීම් කටයුතු පිළිබඳ අභ්‍යන්තර විගණනය | 100 |
| 5. ගෙවීම් වවුචර් කළමනාකරණය විගණනය (ජනවාරි - අප්‍රේල්) | 100 |
| 6. ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ නවීන තාක්ෂණික සහාය හා 3R ක්‍රමවේදය පළාත් පාලන ආයතන වෙත හඳුන්වාදීම හා භාවිතය සඳහා සහාය වීම, පුහුණු වැඩමුළු සංවිධානය පිළිබඳ විගණනය | 100 |
| 7. පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය අභ්‍යන්තර විගණනය | 100 |
| 8. පුරනැගුම ව්‍යාපෘතිය අභ්‍යන්තර විගණනය | 100 |
| 9. ලේඛනාගාර නඩත්තුව සම්බන්ධ විගණනය | 100 |
| 10. අඩු ආදායම් ලබන පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමට අදාළව ආදායම් ඉහළ දැමීම සඳහා ව්‍යාපෘතීන් හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම පිළිබඳ විගණනය<br>අඩු ආදායම් ලබන පළාත් පාලන ආයතන වල දෛනික මහජන සේවා සැපයීමේදී බාධාවන් වී ඇති පැරණි ගෙඩනැගිලි අළුත්වැඩියාවන් හා නඩත්තු කටයුතු සඳහා පුනරාවර්තන වියදම් සිදු කිරීම පිළිබඳ විගණනය | 100 |
| 11. පළාත් පාලන ආයතන සඳහා නව ගිණුම් ක්‍රමයක් හඳුන්වාදීම හා පළාත් සභා හා පළාත් පාලන ආයතන වෙත ලබාදී ඇති වාහන පැවරීම/අනතුරු හා සම්බන්ධ අදාළ කටයුතු පිළිබඳ විගණනය | 100 |
| 12. මුදල් කළමනාකරණය සම්බන්ධ විගණනය | 100 |
| 13. ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය විගණනය | 100 |
| 14. සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය විගණනය | 100 |
| 15. ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය විගණනය | 100 |

| විගණන ක්ෂේත්‍රය | ප්‍රගතිය % |
|---|---|
| 16. ගොඩනැගිලි නඩත්තු සංවර්ධන ක්‍රියාකාරකම් පිළිබඳ විගණනය | 100 |
| 17. කාර්යාලීය උපකරණ හා පරිභෝජන ද්‍රව්‍ය මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයන් සම්බන්ධ විගණනය | 100 |
| 18. ගෙවීම් වවුචර් කළමනාකරණය පිළිබඳ විගණනය (මැයි - අගෝස්තු) | 100 |
| 19. රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් බී විෂය ක්‍රියාකාරකම් සම්බන්ධ විගණනය | 100 |
| 20. දේශීය ණය සහ සංවර්ධන අරමුදල පිළිබඳ විගණනය | 100 |
| 21. ආරක්ෂක සේවා හා පිරිසුදු කිරීමේ සේවා සම්බන්ධ විගණනය | 100 |
| 22. අන්තර් පළාත් විෂය සම්බන්ධීකරණ සමුළුව පැවැත්වීම, පළාත් සභාවල විශ්‍රාමික නිලධාරීන් වෙත වාහන බලපත්‍ර ලබාදීම හා මහජනතාව විසින් යොමු කරනු ලවන පැමිණිලි සම්බන්ධ අදාළ කාර්යයන් ඉටුකිරීම පිළිබඳ විගණනය | 100 |
| 23. පුරනැගුම ව්‍යාපෘතිය විගණනය | 100 |
| 24. පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය විගණනය | 100 |
| 25. ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය විගණනය | 100 |
| 26. විධිමත් විනය පරීක්ෂණ කටයුතු සම්බන්ධ විගණනය<br>*2020- 2023 වර්ෂයන්හිදී විධිමත් විනය පරීක්ෂණ කටයුතු සිදුකර නොමැති බැවින් විගණනය සිදු කර නොමැත. | * |
| 27. සේවක කළමනාකරණය යටතේ රාජ්‍ය නිලධාරීන් පත්කිරීම්/උසස් කිරීම හා නිලධාරීන් වෙත රාජකාරී ලැයිස්තු නිකුත් කිරීම සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 100 |
| 28. රිය අනතුරු හා වාහන අපහරණය පිළිබඳ විගණනය | 100 |
| 29. ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය විගණනය | 100 |
| 30. සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය විගණනය | 100 |
| 31. ගෙවීම් වවුචර් කළමනාකරණය පිළිබඳ විගණනය (සැප්තැම්බර්-දෙසැම්බර්) | 100 |
| 32. රාජ්‍ය නොවන සංවිධාන හා මූල්‍ය ආයතනයන්ගෙන් තාක්ෂණික හා මූල්‍යමය සහාය ලබා ගැනීමට සහායවීම හා ඝණ අපද්‍රව්‍ය කළමනාකරණයේ දේශීය හා විදේශීය අත්දැකීම් හුවමාරු කර ගැනීමෙහිලා පළාත් පාලන ආයතන දිරිගැන්වීම සම්බන්ධ අභ්‍යන්තර විගණනය | 99 |

### 2.6.10. ක්‍රමසම්පාදන අංශය

#### 1. අරමුණ

අමාත්‍යාංශයේ අරමුණු සාක්ෂාත් කරගැනීමට අදාළ සැලසුම්, මාර්ගෝපදේශ හා ක්‍රමෝපායන් සකස් කිරීම, ඒවා ක්‍රියාත්මක කිරීම මෙන්ම සමාජ ආර්ථික සංවර්ධනයට ඉවහල් වන්නා වූ ප්‍රතිපත්ති/ උපායමාර්ග/ සැලසුම්/ වැඩසටහන්/ ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම හා ඇගයීම හා ඊට අදාළ සෙසු කාර්යයන් ඉටු කිරීම සඳහා අමාත්‍යාංශයේ සෙසු අංශවලට අවශ්‍ය සහයෝගය ලබා දීම.

#### 2. 2023 වර්ෂයේ සිව්වන කාර්තුව අවසානය දක්වා කාර්යසාධනය

| | කාර්යය | ප්‍රගතිය |
|---|---|---|
| 1. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සැකසීම | අමාත්‍යාංශයේ 2023 වසරට අදාළ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර එය අවශ්‍ය පරිදි යාවත්කාලීන කර ඇත. |
| | | • ක්‍රියාකාරී සැලැස්මට අනුව ඒ ඒ අංශ හා ආයතනවල මූල්‍ය හා භෞතික ප්‍රගතිය මාසිකව ලබා ගැනීම හා එම වාර්තා අදාළ ආයතනවලට ඉදිරිපත් කර ඇත. |

| කාර්යය | ප්‍රගතිය |
|---|---|
| 2. කාර්යසාධන වාර්තාව සැකසීම | අමාත්‍යාංශයේ 2022 වසරට අදාළ කාර්යසාධන වාර්තාව සකස් කර අදාළ ආයතනවලට ඉදිරිපත් කර ඇත. |
| **3.** 2024 අයවැය කාරක සභා අවස්ථාව සඳහා ප්‍රගති වාර්තාව සැකසීම | 2024 වර්ෂයේ අයවැය කාරක සභා අවස්ථාව සඳහා අමාත්‍යාංශයේ ප්‍රගතිය සහ ඉදිරි සැලසුම් ඇතුළත් වාර්තාව සකස් කර නියමිත වේලාවට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත. |
| 4. ආයතනික ප්‍රතිඵල රාමුව සකස් කිරීම | අමාත්‍යාංශයේ ආයතනික ප්‍රතිඵල රාමුව සකස් කර අවසන්ව ඇත. |
| 5. තිරසර සංවර්ධන අරමුණුවලට අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීම | අමාත්‍යාංශයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව තිරසර සංවර්ධන අභිමතාර්ථ හඳුනාගෙන අදාළ ආයතනවලට ඉදිරිපත් කර ඇත. |
| 6. CDLG ව්‍යාපෘතිය යටතේ UNDP සහ ආසියානු පදනමේ තාක්ෂණික හා මූල්‍ය ආධාර මත සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | • සැලසුම් ඒකකය යටතේ සාක්ෂි පදනම් කරගත් ප්‍රතිපත්ති සම්පාදනය සඳහා දත්ත විශ්ලේෂණ සහ දෘශ්‍යකරණ ඒකකයක් පිහිටුවීම සහ ඊට අදාළ කටයුතු සිදු කරමින් පවතී.<br>• අමාත්‍යාංශය මඟින් සිදු කරන ලද ව්‍යාපෘති පිළිබඳ පශ්චාත් ඇගයීමක් සිදු කිරීම.<br>• ජපන් භාෂා පුහුණු වැඩසටහන් මාලාවක් සිදු කිරීම |
| 7. නව විදේශීය ව්‍යාපෘතිවල ප්‍රාරම්භක කටයුතු සිදු කිරීම | • Urban Project Preparatory Facility Project (UPPF)<br>• Capacity Building for Sustainable Management of Rural Water Supply Schemes under PS Managing Model (CapWass)<br>• SEMAUL Project |

### 2.6.11. ව්‍යාපෘති අධීක්ෂණ අංශය

**1. අරමුණ**

විවිධ ජාත්‍යන්තර මූල්‍ය ආයතන මඟින් ලබාදෙන ණය හා ප්‍රදාන යටතේ ක්‍රියාත්මක විදේශාධාර ව්‍යාපෘති මනා අධීක්ෂණයකින් යුක්තවත් ව්‍යාපෘති අරමුණු සාක්ෂාත් කරගැනීමට හැකිවන ලෙසත් මෙහෙයවීම සිදු කිරීම.

**2. 2023 වර්ෂයේ සිව්වන කාර්තුව අවසානය දක්වා කාර්යසාධනය**

1. 2023 වර්ෂයේ විදේශාධාර ව්‍යාපෘති සඳහා වෙන් වූ රු.මිලියන 44,526.00 ක ප්‍රතිපාදන ඒ ඒ ව්‍යාපෘතියේ සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මෙහෙයවා ඇති අතර දෙසැම්බර් මස අවසානය වන විට රු.මිලියන 33,309.62 ක මුදලක් උපයෝජනය කර ඇත.

2. පහත සඳහන් සියළුම ව්‍යාපෘතිවලට අදාළව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සහ ව්‍යාපෘති අධීක්ෂණ කාර්යයන් සම්බන්ධීකරණය කිරීම සිදු කර ඇත.

a) පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය (පුරනැගුම)
b) ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය- අදියර 5
c) * මහ කොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය
 * මහ කොළඹ ජල සහ අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීම ආයෝජන වැඩසටහන (කොටස 2)
 * මහ කොළඹ ජල සහ අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීම ආයෝජන වැඩසටහන (කොටස 3)
d) පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය
e) නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය
f) ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධති සවිබලගැන්වීමේ ව්‍යාපෘතිය
g) සාමාන්‍ය අධ්‍යාපන නව්‍යකරණ ව්‍යාපෘතිය
h) ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය

3. ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධති සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය හා සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය යන ව්‍යාපෘති වල පළාත් සංරචකයන්ට අදාල සියළු ව්‍යාපෘති කාර්යයන් සම්බන්ධීකරණය කිරීම සිදු කර ඇත.

4. විදේශාධාර ව්‍යාපෘතිවල බඳවා ගැනීම, සේවා දිගු ලබා දීම ඇතුළු අනෙකුත් ව්‍යාපෘති පරිපාලනමය කාර්යයන් ඉටු කර ඇත. ඒ අනුව, 2023 වර්ෂයේ බඳවා ගැනීම් සඳහා සම්මුඛ පරීක්ෂණ 3 ක් පමණ පවත්වා ඇත. ඒ අතර පුරප්පාඩු තනතුරු 46 ක් සඳහා නව බඳවා *ගැනීම් සිදුකර ඇත. එමෙන්ම සේවා කාලය සම්පූර්ණ වී ඇති තනතුරු සඳහා සේවා දිගු 375 ක් ලබාදී ඇත. තනතුරු 51 ක පමණ සේවය අත්හිටුවා ඇත.

5. මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විදේශ ආධාර ව්‍යාපෘති වලට අදාල ප්‍රගතිය විශ්ලේෂණය හා පැන නැගී ඇති ගැටළු විසඳීම ඉලක්ක කර ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම් 23 ක් මෙම වසර තුළ පවත්වා ඇත. එමඟින් ව්‍යාපෘතිවල ගැටලු නිරාකරණය සඳහා අදාළ මැදිහත්වීම් සිදු කර ඇත.

6. “පුරනැගුම ව්‍යාපෘතිය, ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය, මහා කොළඹ අපජල කළමණාකරණ ව්‍යාපෘතිය, නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය හා පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය හා සෙමාවුල් උන්දොන් ව්‍යාපෘතිය” යන ව්‍යාපෘති සඳහා කැබිනට් පත්‍රිකා 09 ක් සකස් කර ඇති අතර එම කැබිනට් පත්‍රිකා 09 සඳහා කැබිනට් මණ්ඩල අනුමැතිය ද ලැබී ඇත.

7. 2023 වසරේ දෙසැම්බර් මස දක්වා දූත මණ්ඩල රැස්වීම් 23 ක් සඳහා අනුමැතිය (Mission Clearance) ලබා දීමට කටයුතු කර ඇත.

8. එමෙන්ම මෙම වසර තුල විදේශාධාර ව්‍යාපෘති වල කාර්ය මණ්ඩල වල සේවය කරන විවිධ නිලධාරින් හා ඔවුන්ගේ යැපෙන්නන් 46 ක් සඳහා වීසා ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය කර ඇත.

## 2.6.12. විදේශීය අරමුදල් මත ක්‍රියාත්මකවන ව්‍යාපෘතිවල ප්‍රගතිය

### 2.6.12.1. පුරනැඟුම (අතිරේක ප්‍රතිපාදන) / පළාත් පාලන ආයතන වැඩිදියුණු කිරීමේ ආංශික ව්‍යාපෘතිය

| | | |
|---|---|---|
| 1 | සමස්ත ආයෝජනය (රු.මි.) | 13,790 (USD 67.84 Mn) |
| 2 | ණය ආධාර සපයන ආයතන සහ මුදල් ප්‍රමාණයන් (රු.මි.) | ආසියානු සංවර්ධන බැංකුව - 12,190 – (USD 60 Mn) |
| 3 | 3.1 ව්‍යාපෘති කාල සීමාව (අවුරුදු) | අවුරුදු 6 |
| | 3.2 ආරම්භක වසර / අවසාන වසර | 2017 / 2023 |
| 4 | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ප්‍රදේශ (පළාත්/ දිස්ත්‍රික්ක/ පළාත් පාලන ආයතන/ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස /ග්‍රාම නිලධාරී වසම්/ ගම්) | බස්නාහිර, වයඹ, දකුණු, ඌව, මධ්‍යම, උතුරු මැද පළාත් |

**5. ව්‍යාපෘතියේ අරමුණ**

ව්‍යාපෘතියේ ප්‍රතිලාභීන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම.

### 6. 2023.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු.මිලියන)

| A | B | B/A | C | D | D/C | B+D | (B+D)/A |
|---|---|---|---|---|---|---|---|
| සමස්ත ආයෝජනය | 2022.12.31ට සමස්ත මූල්‍ය ප්‍රගතිය | ප්‍රතිශතය (%) | 2023 ප්‍රතිපාදන | 2023.12.31) ට ප්‍රගතිය | ප්‍රතිශතය (%) | සමුච්චිත ප්‍රගතිය | ප්‍රතිශතය (%) |
| 13,790 | 10,816.32 | 64.57% | 2,575.10 | 2,496.01 | 97% | 13,312,33 | 97% |

### 7. 2023.12.31 දිනට භෞතික ප්‍රගතිය

| 2022.12.31 දිනට සමුච්චිත භෞතික ප්‍රගතිය (A) | වර්ෂය තුළ ප්‍රගතිය (2023.01.01 සිට 2023.12.31 දක්වා) (B) | 2023.12.31 දිනට සමුච්චිත ප්‍රගතිය (A+B) |
|---|---|---|
| 90% | 10% | 100% |

### 2.6.12.2. ග්‍රාමීය පාලම් ව්‍යාපෘතිය

| | | |
|---|---|---|
| 1 | සමස්ත ආයෝජනය (රු.මි.) | රු.මි 14,534 (අදියර V) |
| 2 | ණය ආධාර සපයන ආයතන සහ මුදල් ප්‍රමාණයන් (රු.මි.) | නෙදර්ලන්තය රු.මි 14,534 (අදියර V) |
| 3 | 3.1 ව්‍යාපෘති කාල සීමාව (අවුරුදු) | අවුරුදු 3 (අදියර V) |
| | 3.2 ආරම්භක වසර / අවසාන වසර | ජූලි 2021 සිට ජූලි 2024 |
| 4 | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ප්‍රදේශ (පළාත්/ දිස්ත්‍රික්ක/ පළාත් පාලන ආයතන/ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස /ග්‍රාම නිලධාරී වසම්/ ගම්) | දිවයින පුරා |

### 5. ව්‍යාපෘතියේ අරමුණු

1. ජාතික ආර්ථික වර්ධනය අරමුණු කර ගනිමින් ග්‍රාමීය ජනතාවගේ ගමනාගමන පහසුව සහ ජීවන තත්වයේ ගුණාත්මකභාවය වර්ධනය කර ගැනීම
2. ග්‍රාමීය ජනතාවගේ පොදු සුරක්ෂිත බව වර්ධනය කිරීම
3. ග්‍රාමීය ප්‍රදේශවල මෙතෙක් භාවිතයට නොගත් සම්පත් උපරිම ලෙස ප්‍රයෝජනයට ගැනීම
4. පහසු ප්‍රවේශ සැපයීම තුළින් හුදෙකලා ප්‍රදේශවල සංවර්ධනය ඉහළ නැංවීම

### 6. 2023.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු.මිලියන)

| A | B | B/A | C | D | D/C | B+D | (B+D)/A |
|---|---|---|---|---|---|---|---|
| සමස්ත ආයෝජනය | 2022.12.31ට සමස්ත මූල්‍ය ප්‍රගතිය | ප්‍රතිශතය (%) | 2023 ප්‍රතිපාදන | 2023.12.31) ට ප්‍රගතිය | ප්‍රතිශතය (%) | සමුච්චිත ප්‍රගතිය | ප්‍රතිශතය (%) |
| 14,534 | 2,753.57 | 19% | 4,500 | 6,772.96 | 150% | 9,526.54 | 65% |

### 7. 2023.12.31 දිනට භෞතික ප්‍රගතිය

| 2022.12.31 දිනට සමුච්චිත භෞතික ප්‍රගතිය (A) | වර්ෂය තුළ ප්‍රගතිය (2023.01.01 සිට 2023.12.31 දක්වා) (B) | 2023.12.31 දිනට සමුච්චිත ප්‍රගතිය (A+B) |
|---|---|---|
| තනි මංතීරු පාලම් 40 ක සහ ද්විත්ව මංතීරු පාලම් 2 ක මූලික සැලසුම්කරණ කටයුතු සිදුකර ඇත. | තනි මංතීරු පාලම් 75 ක සහ ද්විත්ව මංතීරු පාලම් 43 ක මූලික සැලසුම්කරණ කටයුතු සිදුකර ඇති අතර, තනි මංතීරු පාලම් 53 ක සහ ද්විත්ව මංතීරු පාලම් 4 ක ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතී. | තනි මංතීරු පාලම් 115 ක සහ ද්විත්ව මංතීරු පාලම් 45 ක මූලික සැලසුම්කරණ කටයුතු සිදුකර ඇති අතර, තනි මංතීරු පාලම් 53 ක සහ ද්විත්ව මංතීරු පාලම් 4 ක ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතී. |



පාලම් අංක 5028,



පාලම් අංක 5013+5014,
මාතලේ රත්තොට
නාරංගොල්ල පාලම ඉදිකිරීම

## 2.6.12.3. මහකොළඹ අපජල කළමනාකරණ ව්‍යාපෘතිය ( GCWMP)

| | | |
|---|---|---|
| 1 | සමස්ත ආයෝජනය (රු.මි.) | 14,331 |
| 2 | ණය ආධාර සපයන ආයතන සහ මුදල් ප්‍රමාණයන් (රු.මි.) | ආසියානු සංවර්ධන බැංකුව (ADB) – රු.මි. 12,268 |
| 3 | 3.1 ව්‍යාපෘති කාල සීමාව (අවුරුදු) | අවුරුදු - 12 |
| | 3.2 ආරම්භක වසර / අවසාන වසර | අප්‍රේල් 2010 - අගෝස්තු 2023 |
| 4 | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ප්‍රදේශ (පළාත්/ දිස්ත්‍රික්ක/ පළාත් පාලන ආයතන/ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස /ග්‍රාම නිලධාරී වසම්/ ගම්) | • බස්නාහිර පළාත<br>• කොළඹ දිස්ත්‍රික්කය<br>• කොළඹ මහ නගර සභා බල ප්‍රදේශය |

### 5. ව්‍යාපෘතියේ අරමුණු

1. මලාපවහන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.
2. කොළඹ මහ නගර සභාවේ ආයතනික සහ මෙහෙයුම් ධාරිතාව ශක්තිමත් කිරීම
3. කොළඹ මහනගර සභාවේ ව්‍යාපෘති කළමනාකරණය සහ ක්‍රියාත්මක කිරීමේ හැකියාව වැඩිදියුණු කිරීම.

### 6. 2023.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු.මිලියන)

| A | B | B/A | C | D | D/C | B+D | (B+D)/A |
|---|---|---|---|---|---|---|---|
| සමස්ත ආයෝජනය | 2022.12.31ට සමස්ත මූල්‍ය ප්‍රගතිය | ප්‍රතිශතය (%) | 2023 ප්‍රතිපාදන | 2023.12.31) ට ප්‍රගතිය | ප්‍රතිශතය (%) | සමුච්චිත ප්‍රගතිය | ප්‍රතිශතය (%) |
| 14,331 | 14,480 | 94% | 1000 | 846.9 | 84.69% | 15,326.9 | * |

* විනිමය අනුපාතිකය රු:130/= ලෙස යෙදීම හේතුවෙන් ඇස්තමේන්තුගත පිරිවැයට සාපේක්ෂව සමුච්චිත වියදම ඉක්මවා ඇත.

### 7. 2023.12.31 දිනට භෞතික ප්‍රගතිය

| 2022.12.31 දිනට සමුච්චිත භෞතික ප්‍රගතිය (A) | වර්ෂය තුළ ප්‍රගතිය (2023.01.01 සිට 2023.12.31 දක්වා) (B) | 2023.12.31 දිනට සමුච්චිත ප්‍රගතිය (A+B) |
|---|---|---|
| 94% | 2% | 96% |

### 2.6.12.4. මහකොළඹ අපජල කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන (GCWWMIIP) (2 හා 3 කොටස)

| | | |
|---|---|---|
| 1 | සමස්ත ආයෝජනය (රු.මි.) | 28180 |
| 2 | ණය ආධාර සපයන ආයතන සහ මුදල් ප්‍රමාණයන් (රු.මි.) | ආසියානු සංවර්ධන බැංකුව (ADB) - 14,225<br>යුරෝපීය ආයෝජන බැංකුව (EIB) - 8750 |
| 3 | 3.1 ව්‍යාපෘති කාල සීමාව (අවුරුදු) | අවුරුදු 06 |
| | 3.2 ආරම්භක වසර / අවසාන වසර | සැප්තැම්බර් 2016 - ඔක්තෝබර් 2022 |
| 4 | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ප්‍රදේශ (පළාත්/ දිස්ත්‍රික්ක/ පළාත් පාලන ආයතන/ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස /ග්‍රාම නිලධාරී වසම්/ ගම්) | • බස්නාහිර පළාත<br>• කොළඹ දිස්ත්‍රික්කය<br>• කොළඹ මහ නගර සභා බල ප්‍රදේශය |

**5. ව්‍යාපෘතියේ අරමුණු**

1. කොළඹ නගරයේ දකුණු ජල පෝෂක ප්‍රදේශයේ අපජල පද්ධතිය පුනරුත්ථාපනය කර පුළුල් කිරීම
2. කොළඹ නගරයේ දකුණු ජල පෝෂක ප්‍රදේශයේ ඉදිකරන ලද ද්විතියික අපජල පවිත්‍රාගාරය.
3. සේවා සපයන්නාගේ ආයතනික ව්‍යුහය සහ ධාරිතාව ශක්තිමත් කිරීම.

**6. 2023.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු.මිලියන)**

| A | B | B/A | C | D | D/C | B+D | (B+D)/A |
|---|---|---|---|---|---|---|---|
| සමස්ත ආයෝජනය | 2022.12.31ට සමස්ත මූල්‍ය ප්‍රගතිය | ප්‍රතිශතය (%) | 2023 ප්‍රතිපාදන | 2023.12.31) ට ප්‍රගතිය | ප්‍රතිශතය (%) | සමුච්චිත ප්‍රගතිය | ප්‍රතිශතය (%) |
| **GCWWMIIP (අදියර 02)**<br>1,227 | 1,626.55 | * | 125 | 124.9 | 0.99% | 1,751.45 | * |
| **GCWWMIIP (අදියර 03)**<br>26,953 | 5,859.04 | 21.0% | 640.7 | 618 | 96.56% | 6,477 | 24.03% |

- විනිමය අනුපාතිකය රු:130/= ලෙස යෙදීම හේතුවෙන් ඇස්තමේන්තුගත පිරිවැයට සාපේක්ෂව සමුච්චිත වියදම ඉක්මවා ඇත.

**6. 2023.12.31 දිනට භෞතික ප්‍රගතිය**

| 2022.12.31 දිනට සමුච්චිත භෞතික ප්‍රගතිය | 2023.12.31 දිනට සමුච්චිත ප්‍රගතිය |
|---|---|
| GCWWMIIP (Tranche 02) – 57.27%<br>GCWWMIIP (Tranche 03) – 19.25% | GCWWMIIP (Tranche 02) – 57.27%<br>GCWWMIIP (Tranche 03) – 19.25% |

**2.6.12.5. නැඟී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය (RIDEP)**

| | | |
|---|---|---|
| **1** | සමස්ත ආයෝජනය (රු.මි.) | දේශීය = රු.මි. 3,474<br>විදේශීය = යෙන්.මි. 12,957<br>**එකතුව = රු.මි. 20,622**<br>(ණය ගිවිසුම අත්සන් කරන අවස්ථාවේ රු. 1= 0.706 යෙන් අනුව) |
| **2** | ණය ආධාර සපයන ආයතන සහ මුදල් ප්‍රමාණයන් (රු.මි.) | 12,957 JPY |
| **3** | 3.1 ව්‍යාපෘති කාල සීමාව (අවුරුදු) | අවු. 07 |
| | 3.2 ආරම්භක වසර / අවසාන වසර | 2017-2024 |
| **4** | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ප්‍රදේශ (පළාත්/ දිස්ත්‍රික්ක/ පළාත් පාලන ආයතන/ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස /ග්‍රාම නිලධාරී වසම්/ ගම්) | උතුරු පළාත, නැගෙනහිර පළාත, උතුරු මැද පළාත, ඌව පළාත |

**5. ව්‍යාපෘතියේ අරමුණු**

1. ඍජුවම දරිද්‍රතාව පිටු දැකීමේ අරමුණ පාදක කර හෝ ඊට අදාළ මූලික නිර්ණායක වන එම ප්‍රදේශවල පදිංචි පවුල්වල ආරම්භක ජීවන තත්වය වර්ධනය කිරීම.
2. වී අස්වනු හා අනෙකුත් කෘෂි නිෂ්පාදන ප්‍රවාහනයට අවශ්‍ය ග්‍රාමීය මාර්ග සංවර්ධනය කිරීම
3. ප්‍රධාන වශයෙන් වී අස්වැන්න වැඩිකිරීම පිණිස දැනට අක්‍රිය තත්වයේ ඇති කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ වාරිමාර්ග සංවර්ධනය කිරීම
4. වකුගඩු ආශ්‍රිත රෝග නිවාරණය කිරීම සඳහා ඉහළ ගුණාත්මකභාවයෙන් යුක්ත පානීය ජලය ලබා දීම.

**6 . 2023.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු.මිලියන)**

| A | B | B/A | C | D | D/C | B+D | (B+D)/ A |
|---|---|---|---|---|---|---|---|
| **සමස්ත ආයෝජනය** | **2022.12.31 ට සමස්ත මූල්‍ය ප්‍රගතිය** | **ප්‍රතිශතය (%)** | **2023 ප්‍රතිපාදන** | **2023.12.31 ) ට ප්‍රගතිය** | **ප්‍රතිශතය (%)** | **සමුච්චිත ප්‍රගතිය** | **ප්‍රතිශතය (%)** |
| 20,622.00 | 5,646.35 | 27.38% | 1,971.77 (සංශෝධිත ) | 367.50 (මෙම වර්ෂය තුළ විදේශාධාර FA ලැබී නොමැති අතර දේශීය මුදල් මි. 217.96 සිවිල් වැඩ සඳහා JICA අරමුදල් ලැබුනු පසු ප්‍රතිපූර්ණ කිරීමේ පදනම මත යොදා ගැනුනි) | 18.63% | 6,013.85 | 29.16% |

වාර්ෂික මූල්‍ය ප්‍රගතිය මුදල් පදනම මත වේ.

**7. 2023.12.31 දිනට භෞතික ප්‍රගතිය**

| 2022.12.31 දිනට සමුච්චිත භෞතික ප්‍රගතිය (A) | වර්ෂය තුළ ප්‍රගතිය (2023.01.01 සිට 2023.12.31 දක්වා) (B) | 2023.12.31 දිනට සමුච්චිත ප්‍රගතිය (A+B) |
|---|---|---|
| 47.4% | 47.4% සිට 50.8% දක්වා (ප්‍රතිපාදන 2022 අප්‍රේල් සිට නවතා දමා ඇත.) | 47.4% + (50.8 – 47.4) = 50.8% |

## 2.6.12.6. ප්‍රවාහන සම්බන්ධතා සහ වත්කම් කළමනාකරණ ව්‍යාපෘතිය - පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය (TCAMP- PRDP)

| | | |
|---|---|---|
| 1 | සමස්ත ආයෝජනය (රු.මි.) | 16,424/- |
| 2 | ණය ආධාර සපයන ආයතන සහ මුදල් ප්‍රමාණයන් (රු.මි.) | ලෝක බැංකුව<br>16,424/-<br>ශ්‍රී ලංකා රජය<br>200/- |
| 3 | 3.1 ව්‍යාපෘති කාල සීමාව (අවුරුදු) | අවුරුදු 4 1/2 |
| | 3.2 ආරම්භක වසර / අවසාන වසර | 2019- 2024 |
| 4 | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ප්‍රදේශ (පළාත්/ දිස්ත්‍රික්ක/ පළාත් පාලන ආයතන/ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස /ග්‍රාම නිලධාරී වසම්/ ගම්) | පළාත් නවයම (09 ) ආවරණය වන පරිදි |

**5. ව්‍යාපෘතියේ අරමුණු**

1. පළාත් 09 යෙහි මාර්ග කි.මී. 400 කාපට් අතුරා (asphalt) සංවර්ධන කිරීම.
2. පළාත් මාර්ග අධිකාරි / දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලවල හැකියාව වර්ධනය.
3. සියලුම පළාත් කාර්යය මණ්ඩලවලට ප්‍රයෝජන ගත හැකි වන පරිදි බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අනුබද්ධව නිර්මාණ හා සැලසුම් පුහුණු ආයතනය (Design Centre) කිරීම හා අවශ්‍ය දත්ත පද්ධතියට ගබඩා කිරීම

**6. 2023.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු.මිලියන)**

| A | B | B/A | C | D | D/C | B+D | (B+D)/A |
|---|---|---|---|---|---|---|---|
| සමස්ත ආයෝජනය | 2022.12.31ට සමස්ත මූල්‍ය ප්‍රගතිය | ප්‍රතිශතය (%) | 2023 ප්‍රතිපාදන | 2023.12.31) ට ප්‍රගතිය | ප්‍රතිශතය (%) | සමුච්චිත ප්‍රගතිය | ප්‍රතිශතය (%) |
| FA 16,224 | 9170 | 56.2 % | 5950 | 5216 | 87.9% | 14,386 | 88.6% |
| DF 200 | 115.5 | 57.5 % | 59.89 | 53.2 | 88.8% | 168.2 | 84.1 % |

**7. 2023.12.31 දිනට භෞතික ප්‍රගතිය**

| 2022.12.31 දිනට සමුච්චිත භෞතික ප්‍රගතිය (A) | වර්ෂය තුළ ප්‍රගතිය (2023.01.01 සිට 2023.12.31 දක්වා) (B) | 2023.12.31 දිනට සමුච්චිත ප්‍රගතිය (A+B) |
|---|---|---|
| 71% | 26% | 97% |



මොරහෙල අමුපිටිය මාර්ගය




කරින්ග්නන්පිටිය මාර්ගය

### 2.6.12.7. ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධති සවිබල ගැන්වීමේ - පළාත් සංරචකය (PSSP)

| | | |
|---|---|---|
| 1 | සමස්ත ආයෝජනය (රු.මි.) | රු.මි 28,050.15<br>ඇ.ඩො.මි 134 |
| 2 | ණය ආධාර සපයන ආයතන සහ මුදල් ප්‍රමාණයන් (රු.මි.) | ලෝක බැංකුව<br>ඇ.ඩො.මි 200<br>(ඇ.ඩො.මි 09 ක මුදලක් CERC අරමුදල සඳහා ලබා ගන්නා ලදී) |
| 3 | 3.1 ව්‍යාපෘති කාල සීමාව (අවුරුදු) | 05 |
| | 3.2 ආරම්භක වසර / අවසාන වසර | 2018-2024 |
| 4 | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ප්‍රදේශ<br>(පළාත්/ දිස්ත්‍රික්ක/ පළාත් පාලන ආයතන/ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස /ග්‍රාම නිලධාරී වසම්/ ගම්) | ශ්‍රී ලංකාවේ සියළුම දිස්ත්‍රික්ක හා පළාත් ආවරණය වන පරිදි ක්‍රියාත්මක වේ. |

**5. ව්‍යාපෘතියේ අරමුණ**

ශ්‍රී ලංකාවේ ප්‍රාථමික සෞඛ්‍ය සේවාවේ ගුණාත්මකබව වර්ධනය කරමින් බෝ නොවන රෝග අවදානම ඇති පුරවැසියන් හඳුනාගෙන එම රෝග පාලනය කිරීම හා කළමණාකරණය කිරිම.

**6. 2023.12.31 දිනට මුල්‍ය ප්‍රගතිය (රු.මිලියන)**

| A | B | B/A | C | D | D/C | B+D | (B+D)/A |
|---|---|---|---|---|---|---|---|
| සමස්ත ආයෝජනය | 2022.12.31ට සමස්ත මූල්‍ය ප්‍රගතිය | ප්‍රතිශතය (%) | 2023 ප්‍රතිපාදන | 2023.12.31) ට ප්‍රගතිය | ප්‍රතිශතය (%) | සමුච්චිත ප්‍රගතිය | ප්‍රතිශතය (%) |
| 24,450.15<br>*1 | 10,997.40 | 45% | 13,000.00 | 12,356.00 | 95% | 23,353.40 | 96%<br>*2 |

**7. 2023.12.31 දිනට භෞතික ප්‍රගතිය**

| 2022.12.31 දිනට සමුච්චිත භෞතික ප්‍රගතිය (A) | වර්ෂය තුළ ප්‍රගතිය (2023.01.01 සිට 2023.12.31 දක්වා) (B) | 2023.12.31 දිනට සමුච්චිත ප්‍රගතිය (A+B) |
|---|---|---|
| 69% | 26% | 95% |

*1. 2019 සිට 2023 වර්ෂය දක්වා රු. මිලියන 24,450.15 ක ප්‍රතිපාදන ලැබී ඇති අතර 2024 වර්ෂය සඳහා රු. මිලියන 3,600 ක් ලැබී ඇත. ඒ අනුව සමස්ථ ආයෝජනය රු. මිලියන 28,050.15 කි.

*2. 2019 සිට 2023.12.31 දින දක්වා ව්‍යාපෘතියට ලබාදුන් ප්‍රතිපාදන ප්‍රමාණය (ආයෝජනය කරන ලද මුදල) රු. මිලියන 24,450.00 ක් වන අතර වියදම් කරන ලද මුදල රු. මිලියන 23,353.40 කි. ඒ අනුව 2023.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය 96% කි.

### 2.6.12.8. ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතිය (LDSP)

| | | |
|---|---|---|
| 1 | සමස්ත ආයෝජනය (රු.මි.) | 100.84 |
| 2 | ණය ආධාර සපයන ආයතන සහ මුදල් ප්‍රමාණයන් (රු.මි.) | ලෝක බැංකුව - 69.42<br>යුරෝපා සංගමය - 24.42<br>ශ්‍රී ලංකා රජය - 7.00 Us |
| 3 | 3.1 ව්‍යාපෘති කාල සීමාව (අවුරුදු) | අවුරුදු 3.5 |
| | 3.2 ආරම්භක වසර / අවසාන වසර | 2019.06.30 – 2024.09.30 |
| 4 | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ප්‍රදේශ<br>(පළාත්/ දිස්ත්‍රික්ක/ පළාත් පාලන ආයතන/ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස /ග්‍රාම නිලධාරී වසම්/ ගම්) | උතුරු, නැගෙනහිර, උතුරු මැද හා ඌව පළාත් |

**4. ව්‍යාපෘතියේ අරමුණ**

පළාත් පාලන ආයතනවල හැකියාවන් ශක්තිමත් කිරීම හා එම ප්‍රදේශවල ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම මගින් වගකීමෙන් හා වගවීමෙන් යුතු පළාත් පාලන සේවාවක් මහජනයාට සැපයීම.

**6. 2023.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු.මිලියන)**

| A | B | B/A | C | D | D/C | B+D | (B+D)/ A |
|---|---|---|---|---|---|---|---|
| **සමස්ත ආයෝජනය** | **2022.12.31 ට සමස්ත මූල්‍ය ප්‍රගතිය** | **ප්‍රතිශතය (%)** | **2023 ප්‍රතිපාදන** | **2023.12.31 ) ට ප්‍රගතිය** | **ප්‍රතිශතය (%)** | **සමුච්චිත ප්‍රගතිය** | **ප්‍රතිශතය (%)** |
| 17,749.85 | 3,482.39 | 30% | 6,000.00 | 3,460.00 | 57% | 6,943.15 | 61.56% |

**7. 2023.12.31 දිනට භෞතික ප්‍රගතිය**

| 2022.12.31 දිනට සමුච්චිත භෞතික ප්‍රගතිය (A) | වර්ෂය තුළ ප්‍රගතිය (2023.01.01 සිට 2023.12.31 දක්වා) (B) | 2023.12.31 දිනට සමුච්චිත ප්‍රගතිය (A+B) |
|---|---|---|
| $BT_1$ -100%<br>$BT_2$, $BT_3$ -99%<br>PPT - 100%<br>$PT_1$ -100%<br>$PT_2$ අදියර 1 - 86%<br>$PT_2$ අදියර 2,3 - ලෝක බැංකු අනුමැතිය 2023.12.23 දින ලබා දෙන ලදී. | 14% | 79% |
| $PT_3$ - තවමත් ආරම්භ කර නොමැත.<br>$BT_4$- තවමත් ආරම්භ කර නොමැත. | $PT_3$ හා $BT_4$ යටතේ නව ව්‍යාපෘති හඳුනා ගැනීමේ ක්‍රියාවලිය සිදු කරමින් පවතී | $PT_3$ හා $BT_4$ යටතේ නව ව්‍යාපෘති හඳුනා ගැනීමේ ක්‍රියාවලිය සිදු කරමින් පවතී |

### 2.6.12.9. සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ (GEM) ව්‍යාපෘතිය

| | | |
|---|---|---|
| **1** | සමස්ත ආයෝජනය (රු.මි.) | ඇමරිකානු ඩොලර් මිලියන 100 |
| **2** | ණය ආධාර සපයන ආයතන සහ මුදල් ප්‍රමාණයන් (රු.මි.) | ලෝක බැංකුව විසින් අරමුදල් සපයයි |
| **3** | 3.1 ව්‍යාපෘති කාල සීමාව (අවුරුදු) | 05 |
| | 3.2 ආරම්භක වසර / අවසාන වසර | 2018/2019 - 2024 |
| **4** | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ප්‍රදේශ (පළාත්/ දිස්ත්‍රික්ක/ පළාත් පාලන ආයතන/ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස /ග්‍රාම නිලධාරී වසම්/ ගම්) | සියලුම පළාත් |

**5. ව්‍යාපෘතියේ අරමුණ**

ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ හාරකාරත්වය ශක්තිමත් කිරීම

### 6. 2023.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු.මිලියන)

| A | B | B/A | C | D | D/C | B+D | (B+D)/A |
|---|---|---|---|---|---|---|---|
| සමස්ත ආයෝජනය | 2022.12.31ට සමස්ත මූල්‍ය ප්‍රගතිය | ප්‍රතිශතය (%) | 2023 ප්‍රතිපාදන | 2023.12.31) ට ප්‍රගතිය | ප්‍රතිශතය (%) | සමුච්චිත ප්‍රගතිය | ප්‍රතිශතය (%) |
| 8,699.11 | 5,085.42 | 58% | 4015 | 3,613.69 | 90% | 8,699.11 | 100% |

### 7. 2023.12.31 දිනට භෞතික ප්‍රගතිය

**DLI 1 - ඉංග්‍රීසි භාෂා ඉගෙනීමේ ප්‍රතිඵල වැඩිදියුණු කිරීම**

ඉලක්කගත පාසල් 500 ක සිසුන්ගෙන් අවම වශයෙන් 80% ක ඉංග්‍රීසි භාෂා ඉගෙනීමේ ප්‍රතිඵල වැඩිදියුණු විය. ඉංග්‍රීසි භාෂා ඉගෙනීමේ ප්‍රතිඵල වැඩිදියුණු කිරීම සඳහා ඉංග්‍රීසි භාෂා ඉගෙනුම් වැඩිදියුණු කිරීමේ (ELLE) වැඩසටහන යටතේ අවම වශයෙන් පාසල් 500ක සිසුන්ට සෘජු මැදිහත්වීම්වලින් ප්‍රතිලාභ ලබාදීම.

**DLI 2 - ගණිතය ඉගෙනීමේ ප්‍රතිඵල වැඩිදියුණු කිරීම**

ඉලක්කගත පාසල් 500 ක අවම වශයෙන් 80% ක සිසුන්ගේ ගණිත භාෂා ඉගෙනීමේ ප්‍රතිඵල වැඩිදියුණු විය. අවම වශයෙන් පාසල් 500 ක සිසුන් ගණිත භාෂා ඉගෙනුම් ප්‍රතිඵල වැඩිදියුණු කිරීම සඳහා ගණිත ඉගෙනුම් වැඩිදියුණු කිරීමේ (MLE) වැඩසටහන යටතේ සෘජු මැදිහත්වීම්වලින් ප්‍රතිලාභ ලබාදීම.

**DLI 5 - වෘත්තීයමය වශයෙන් සුදුසුකම් ලත් නව ගුරුවරුන්ගේ සංඛ්‍යාව වැඩි කිරීම**

ගුරුවරුන් 20,000 කට (කාන්තාවන් 50%) අතිරේක වෘත්තීය සුදුසුකම් ලබාදීම

**DLI 9 - පුළුල් කරන ලද පාසල් සෞඛ්‍ය හා පෝෂණ වැඩසටහන සංවර්ධනය කර ක්‍රියාත්මක කර ප්‍රතිඵල ලබා ගැනීම.**

පාසල් සෞඛ්‍ය හා පෝෂණ වැඩසටහන පුළුල් කර සංවර්ධනය කර ක්‍රියාත්මක කර ප්‍රතිඵල ලබා ඇත - COVID-19 වසංගතය වැළැක්වීම සහ සනීපාරක්‍ෂක පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම ඇතුළු පාසල් සෞඛ්‍ය හා පෝෂණ වැඩ සටහන සෑම අධ්‍යාපන කලාපයකටම හඳුන්වා දී ඇත.

## 2.6.13. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය (SLILG)

1999 අංක 31 දරණ පාර්ලිමේන්තු පනත මගින් ස්ථාපිත කර ඇති පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ කටයුතු පරිපාලනය සහ කළමනාකරණය කිරීම සඳහා පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ ලේකම් ඇතුළු නිල බලයෙන් පත්වන සාමාජිකයන් 8 දෙනෙකු සහ අමාත්‍යාංශයේ ගරු ඇමතිතුමා විසින් පත්කරනු ලබන සාමාජිකයන් 5 දෙනෙකු ඇතුළත් අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කර ඇති අතර ආයතනයේ පරිපාලන කටයුතු ප්‍රධාන විධායක නිලධාරියා වන අධ්‍යක්ෂකවරයා විසින් සිදුකරනු ලැබේ.

- **2023 වර්ෂයේ සිව්වන කාර්තුව අවසානය දක්වා ප්‍රගතිය**

| අංශය | අපේක්ෂිත වැඩමුළු ගණන | පවත්වන ලද වැඩමුළු ගණන | පුහුණුලාභීන් ගණන |
|---|---|---|---|
| ඉංජිනේරු | 19 | 14 | 614 |
| පොදු කළමනාකරණ සහ මානව සම්පත් සංවර්ධන | 28 | 26 | 1,065 |
| භෞතික සැලසුම් සහ පරිසර | 28 | 28 | 1,094 |
| පර්යේෂණ | 21 | 20 | 730 |
| පුහුණු | 07 | 05 | 200 |
| පරිගණක | 29 | 23 | 794 |
| මූල්‍ය කළමණාකරණ අංශය | 30 | 30 | 1,360 |
| නීති අංශය | 28 | 14 | 632 |
| මාධ්‍ය අංශය | 11 | 10 | 344 |
| **එකතුව** | **201** | **170** | **6,833** |

- UNDP/ CDLG ව්‍යාපෘතිය විපරම් වැඩසටහන් 28 ක් උතුර, උතුරු මැද, ඌව සහ නැගෙනහිර පළාත් සඳහා දිස්ත්‍රික්කයට එක බැගින් පහත මාතෘකා දෙක යටතේ පවත්වන ලදී.

| වැඩමුළුවේ නම | පවත්වන ලද වැඩමුළු ගණන | පුහුණුලාභීන් ගණන |
|---|---|---|
| ලිපිගොණුකරණය සහ ගොණු කළමනාකරණය | 14 | 490 |
| සමාජ හා පරිසර ආරක්ෂණ කළමනාකරණය | 14 | 448 |
| තෝරාගත් පළාත් පාලන ආයතනවල නිලධාරීන් සහ නියෝජිතයින් සඳහා උපදේශන මාර්ගෝපදේශන අත්පොත සකස් කිරීම | 53 | ආරම්භ කර ඇත |







## 2.6.14. දේශීය ණය සහ සංවර්ධන අරමුදල (LLDF)

### 1. අරමුණ

නීතියෙන් බලය ලැබී ඇති පරිදි පළාත් පාලන ආයතනවලට මහජන උපයෝගීතා සේවා පවත්වාගෙන යාම සඳහා සහනදායී පොළියකට මූල්‍ය පහසුකම් සැපයීම සහ අනුබල ලබාදීම.

### 2. ප්‍රධාන කාර්යයන්

දැනට ශ්‍රී ලංකාව තුළ සංස්ථාපනය කර ඇති මහා නගර සභා 23, නගර සභා 42 සහ ප්‍රාදේශීය සභා 276 ද ඇතුළුව පළාත් පාලන ආයතන 341 සඳහා අවශ්‍ය දිගුකාලීන මූල්‍ය පහසුකම් සහනදායී පොළී අනුපාතයක් යටතේ සැපයීම අරමුදලේ මූලික කාර්ය භාරය වේ.

| කාරණය | ඇස්තමේන්තු ගත මුදල (රු.මි) 2023.12.31 | 2023.12.31 දිනට සත්‍ය අගය (රු.මි) | ප්‍රගතිය |
|---|---|---|---|
| ණය මුදල් නිකුත් කිරීම | 750 | 389 | 52% |
| ණය අය කිරීම | 955 | 706 | 74% |
| භාණ්ඩාගාරයට ගෙවීම (2023.12.31 දිනට) | 367 | 367 | 100% |

## 3. 2023 හතරවන කාර්තුව දක්වා කාර්ය සාධනය - ණය අනුමත කිරීම සහ ණය නිකුත් කිරීම්.

### ණය අනුමත කිරීම - 2023.12.31 දිනට

| අනු අංකය | පළාත් පාලන ආයතනය | | ව්‍යාපෘතිය | වටිනාකම (රු) |
|---|---|---|---|---|
| 01 | වෙන්නප්පුව | ප්‍රා.ස | සෝලා පද්ධතියක් සවිකිරීම | 28,800,000.00 |
| 02 | නින්දවූර් | ප්‍රා.ස | සෝලා පද්ධතියක් සවිකිරීම | 22,000,000.00 |
| 03 | හක්මන | ප්‍රා.ස | සෝලා පද්ධතියක් සවිකිරීම | 8,000,000.00 |
| 04 | ගල්ගමුව | ප්‍රා.ස | සෝලා පද්ධතියක් සවිකිරීම | 30,000,000.00 |
| 05 | කොටපොල | ප්‍රා.ස | සතිපොල සංවර්ධනය කිරීම | 10,000,000.00 |
| 06 | අකුරැස්ස | ප්‍රා.ස | සෝලා පද්ධතියක් සවිකිරීම | 5,600,000.00 |
| 07 | ගහඉහල කෝරලේ | ප්‍රා.ස | කුරුඳුවත්ත වෙළඳ සංකීර්ණය | 30,000,000.00 |
| | **එකතුව** | | | **134,400,000.00** |

### ණය නිකුත් කිරීම් - 2023.12.31 දිනට

| අනු අංකය | පළාත් පාලන ආයතනය | | ව්‍යාපෘතිය | වටිනාකම (රු) |
|---|---|---|---|---|
| 1 | පුත්තලම | න.ස | පොදු වෙළඳ සංකීර්ණය ඉදි කිරීම | 96,570,000 |
| 2 | පොළොන්නරුව | ම.න.ස | වෙළඳ සංකීර්ණය ඉදි කිරීම | 5,300,000 |
| 3 | උඩුබද්දාව | ප්‍රා.ස | වෙළඳ සංකීර්ණය ඉදි කිරීම | 1,500,000 |
| 4 | වැලිවිටිය දිවිතුර | ප්‍රා.ස | ආදාහනාගාරය ඉදි කිරීම | 14,315,000 |
| 5 | මීගමුව | ම.න.ස | පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම | 52,801,194 |
| 6 | කුලියාපිටිය | න.ස | පොදු වෙළඳ සංකීර්ණය ඉදි කිරීම | 13,471,000 |
| 7 | කුරුණෑගල | ම.න.ස | පොදු වෙළඳ සංකීර්ණය ඉදි කිරීම | 91,792,000 |
| 8 | නුවරඑළිය | ම.න.ස | පොදු වෙළඳ සංකීර්ණය ඉදි කිරීම | 71,375,000 |
| 9 | අයගම | ප්‍රා.ස | වෙළඳ සංකීර්ණය ඉදි කිරීම | 7,012,000 |
| 10 | කැකිරාව | ප්‍රා.ස | පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම | 18,722,000 |
| 11 | මීගමුව | ම.න.ස | වෙළඳ සංකීර්ණය ඉදි කිරීම | 16,100,000 |
| | **එකතුව** | | | **388,958,194** |



ප්‍රදීප් යසරත්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය

## 03. පරිච්ඡේදය - වසරේ සමස්ථ මූල්‍ය කාර්සාධනය

**3.1.** මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

**3.2.** අග්‍රිම ගැලපුම් ප්‍රකාශය

**3.3.** මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

**3.4.** මුදල් ප්‍රවාහ ප්‍රකාශය

**3.5.** මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

**3.6.** ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| වත්කම් කේතය | කේත විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | රැස් කළ ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | සංශෝධිත ඇස්තමේන්තුව | මුදල (රු.) | සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව % ලෙස |
| – | – | – | – | – | – |

**3.7.** වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්යසාධනය

Rs. ,000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | සත්‍ය විදම | උපයෝගී කරගනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| පුනරාවර්තන | 385,000 | 385,000 | 285,271 | 74% |
| ප්‍රාග්ධන | 29,385,000 | 31,190,000 | 23,177,673 | 74% |

**3.8.** මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

රු. ,000

| වත්කම් කේතය | කේත විස්තරය | 2023.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 2023.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතියය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | 10,000 | | | 100% |
| 9152 | යන්ත්‍රෝපකරණ | 492,299.7 | | | 100% |
| 9153 | ඉඩම් | 7,000 | | | 100% |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | | - | | |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | | - | | |
| 9160 | කෙරීගෙන යන වැඩ | | - | | |
| 9180 | බදු දෙන ලද වත්කම් | 95,000 | | | 100% |

**3.9.** විගණකාධිපතිවරයාගේ වාර්තාව

## 04. පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක

| අනු අංකය | විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය නිමැවුම | | |
|---|---|---|---|---|
| | | **100%- 90%** | **75%-89%** | **50%- 74%** |
| 1 | පළාත් සභා හා පළාත් පාලන මට්ටමෙන් පවත්වන ලද ධාරිතා සංවර්ධන වැඩසටහන් සංඛ්‍යාව | | **85** | |
| 2 | පළාත් පාලන සේවා වැඩිදියුණුකිරීම සඳහා අමාත්‍යාංශ අයවැය මඟින් ප්‍රදාන ලද පළාත් පාලන ආයතන සංඛ්‍යාව (පළාත් පාලන ප්‍රදේශ) | | | **40** |
| 3 | අමාත්‍යාංශය මඟින් ලද වාර්ෂික ප්‍රතිපාදන උපයෝගීකිරීමේ ප්‍රතිශතය | | | **74.30** |
| 4 | “ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ වාර්ෂික සැලසුම්“ සකස් කර ක්‍රියාත්මක කරන ලද පළාත් පාලන ආයතන සංඛ්‍යාව (අපද්‍රව්‍ය රැස් කිරීම / කොම්පෝස්ට්කරණය/ ප්‍රතිචක්‍රීකරණ......) | | | **60** |
| 5 | දුක්ගැනවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණය ස්ථාපනය කර ක්‍රියාත්මක කරනු ලබන පළාත් පාලන ආයතන සංඛ්‍යාව | **100** | | |
| 6 | පවත්වන ලද පළාත් ප්‍රධාන ලේකම්වරුන්ගේ සමුළු සංඛ්‍යාව | **100** | _ | _ |
| 7 | විදේශ ආධාර ව්‍යාපෘති සඳහා පවත්වන ලද ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම් සංඛ්‍යාව | _ | _ | _ |
| 8 | සිදු කරන ලද පර්යේෂන / අධ්‍යයන සංඛ්‍යාව සහ පවත්වන ලද ඇගයීම් සංඛ්‍යාව | _ | _ | _ |

# 05. පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

## 5.1. හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු

ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මඟින් ප්‍රකාශයට පත් කර තිබෙන "ශ්‍රීලංකාවේ තිරසාර සංවර්ධන ඉලක්ක නිර්ණායක - 2017" වාර්තාව පදනම් කරගෙන අදාළ ඉලක්ක සහ නිර්ණායකවල අංක පහත වගුවට ඇතුළත් කර ඇති බව කාරුණිකව සලකන්න.

| අ.අ. | අරමුණු | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | **0% - 49%** | **50% - 74%** | **75% - 100%** |
| 1 | **ඉලක්ක අංක . 1**<br>සියලුම ස්ථාන ආවරණය කරමින් සියලු ආකාරයේ දුගීභාවය දුරලීම | 1.5 | 1.1.1<br>1.2.1 | | | |
| 2 | **ඉලක්ක අංක . 2**<br>සාගින්න අවසන් කර ආහාර සුරක්ෂිතතාවය සහ වැඩිදියුණු කළ පෝෂණය සාක්ෂාත් කිරීම සහ තිරසාර කෘෂිකර්මය සඳහා අනුබල දීම | 2.1<br>2.2<br>2.3<br>2.4<br>2.a | 8.3.1 | | | |
| 3 | **ඉලක්ක අංක 3**<br>නිරෝගී ජීවිත තහවුරු කිරීම සහ සියලුම වයස් කාණ්ඩවල සියලු දෙනාගේ යහපැවැත්ම ඉහළ නැංවීම | 3.4<br>3.8<br>3.9<br>3.b | 2.2.1<br>3.1.1 | | | |
| 4 | **ඉලක්ක අංක 4**<br>සියල්ල ඇතුළත් සහ සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලීන ඉගෙනුම් අවස්ථා ප්‍රවර්ධනය කිරීම | 4.1<br>4.a<br>4.c | 4.1.1<br>4.a.1<br>4.c.1 | | | |
| 5 | **ඉලක්ක අංක 5**<br>ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ඇති කිරීම සහ සියලුම කාන්තාවන් සහ ගැහැණු ළමුන් බලගැන්වීම | 5.5<br>5.c | | | | |
| 6 | **ඉලක්ක අංක 6**<br>සියලු දෙනාට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් පැවතීම සහතික වීම | 6.1<br>6.3<br>6.b | 6.1.1 | | | |
| 7 | **ඉලක්ක අංක 9**<br>ඔරොත්තු දීමේ හැකියාව සහිත යටිතල පහසුකම් ගොඩනැගීම, සියල්ල ඇතුළත් සහ තිරසාර කාර්මිකකරණය ප්‍රවර්ධනය කිරීම සහ නවෝත්පාදන කෙරෙහි උනන්දු කරවීම | 9.1<br>9.c | | | | |

| අ.අ. | අරමුණු | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50% - 74% | 75% - 100% |
| 8 | **ඉලක්ක අංක 10**<br>රටවල් තුළ සහ රටවල් අතර අසමානාත්මතාවය අවම කිරීම. | 10.2 | 1.4.1 | | | |
| 9 | **ඉලක්ක අංක 11**<br>නගර සහ මානව ජනාවාස සියල්ල ඇතුළත්ව, ආරක්ෂිත, ඔරොත්තු දෙන සහ තිරසාර බවට පත්කිරීම. | 11.2<br>11.6<br>11.7<br>11.a | 10.7.2<br>12.4.2 | | | |
| 10 | **ඉලක්ක අංක 12**<br>තිරසාර පරිභෝජනය සහ නිෂ්පාදන රටා තහවුරු කිරීම | 12.4<br>12.5 | 1.5.3 | | | |

### 5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ සහ අභියෝග

ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන ඉලක්ක නිර්ණායක - 2017 වාර්තාව අනුව තිරසර සංවර්ධන අභිමතාර්ථ හා ඉලක්ක සමස්ථ රටම එක ඒකකයක් ලෙස සැලකීමට ලක් කොට සකස් කර ඇත. එම නිසා ශ්‍රී ලංකාවේ පවතින ඒ ඒ අමාත්‍යාංශ, ආයතන හෝ දෙපාර්තමේන්තුවලට වෙන් වෙන්ව තිරසර සංවර්ධන අභිමතාර්ථ හෝ ඉලක්ක සකස් කිරීමක් සිදු කර නොමැත. කෙසේ වෙතත් මෙම කාර්යසාධන වාර්තාවේ ආකෘතිය අනුව තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ සහ අභියෝග පිළිබඳ විස්තර ඉදිරිපත් කළ යුතු වේ.

මෙම අමාත්‍යාංශය යටතේ විවිධ ක්ෂේත්‍රවල සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක වන අතර පළාත් පාලන ක්ෂේත්‍රයට අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීම සම්බන්ධව ජාතික මට්ටමෙන් කටයුතු කරයි. එම සංවර්ධන ව්‍යාපෘතිවල, වැඩසටහන්වල අරමුණු හා විෂය පථය අනුව මෙම අමාත්‍යාංශයට අදාළ තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන ඇත. එම ඉලක්ක ළඟා කර ගැනීම සඳහා මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති, වැඩසටහන් මඟින් යම් දායකත්වයක් ලැබෙන අතර ඒ ඒ තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා වන දායකත්වය මැනීම අසීරු කරුණක් වී ඇත. විශේෂයෙන් පදනම් දත්ත නොතිබීම, ඉලක්ක ළඟා කර ගැනීමට මෙම අමාත්‍යාංශයේ දායකත්වය සමස්ථ රටේ දායකත්වයෙන් කොපමණ පංගුවක්ද යන්න ගණනය කිරීමට නොහැකිවීම ඉහත අසීරුතාවයට මූලික හේතු වී තිබේ.

අධ්‍යාපන, සෞඛ්‍යය, වාරි මාර්ග, මහා මාර්ග, සනීපාරක්ෂක සේවා, පානීය ජල සැපයුම්, ප්‍රවාහන සම්බන්ධතා හා පළාත් පාලන ක්ෂේත්‍රවලට අදාළ ව්‍යාපෘති හා වැඩසටහන් මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කිරීම මඟින් තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීම සඳහා යම් දායකත්වයක් ලබා දී ඇති බව ඒ ඒ ක්ෂේත්‍ර යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති හා වැඩසටහන් 2023 වසරේ අත් කරගත් ප්‍රතිඵල හා නිමැවුම් මඟින් පෙනී යයි.

## 06. පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

### 6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

| අ.අ. | තනතුර | අනුමත තනතුරු සංඛ්‍යාව | සිටින සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|
| 01. | ජ්‍යෙෂ්ඨ මට්ටම | 34 | 20 | 15 |
| 02. | තෘතීය මට්ටම | 4 | 1 | 3 |
| 03. | ද්විතීය මට්ටම | 135 | 118 | 17 |
| 04. | ප්‍රාථමික මට්ටම | 46 | 42 | 4 |
| | **එකතුව** | **219** | **181-1** | **39** |

**දෙපාර්තමේන්තු පත්වීම්**

| | | |
|---|---|---|
| 01. | කළමනාකරණ සහකාර | 21 |
| 02. | රියදුරු | 12 |
| 03. | කාර්යාල කාර්ය සේවක | 12 |
| | **එකතුව** | **45** |

### 6.2 **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

මෙම ආයතනය සඳහා අනුමත කාර්ය මණ්ඩලයට අනුව මේ වන විට මාණ්ඩලික නිලධාරි තනතුරු, සංවර්ධන නිලධාරි, කළමනාකරණ සේවා නිලධාරි, රියදුරු මෙන්ම කාර්යාල සේවක සේවයේ තනතුරු පුරප්පාඩු පැවතීම මත ආයතනය මගින් ඉටුවිය යුතු මෙහෙවර සහ අරමුණු කාර්යක්ෂමව සහ කඩිනම්ව සිදුකිරීමට බාධාවක් වී ඇත.ඒ අනුව ආයතනයේ කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා මෙම මානව සම්පත් හිඟය සම්පූර්ණ කිරීම මහඟු පිටුවහලක් වනු ඇත.

### 6.3. මානව සම්පත් සංවර්ධනය

| අ.අ | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය | | වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය) | නිමැනුම / ලබාගත් දැනුම* |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය (රුපියල්) | විදේශීය (ඇ.එ.ජ.ඩොලර් / පවුම්) | | |
| 01. | රියදුරන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන | 12 | 20<br>23.01.19 | 8320.00 | | දේශීය | රථවාහන මාර්ග නීති, රිය ධාවනයේදී අනුගමනය කළ යුතු උපදෙස් හා මාර්ග අනතුරකදී කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව රියදුරන් වෙත දැනුමක් ලබා දුනි. |

| අ.අ | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය | | වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය) | නිමැනුම / ලබාගත් දැනුම* |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය (රුපියල්) | විදේශීය (ඇ.එ.ජ.ඩොලර් / පවුම්) | | |
| 02. | පුද්ගලික ලිපි ගොනුවක් පවත්වාගෙනයාම පිළිබඳ පුහුණු වැඩසටහන | 01 | 2023.03.23 /24 | 9500.00 | - | දේශීය | විධිමත් ලෙස පුද්ගලික ලිපි ගොනුවක් පවත්වාගෙන යාම පිළිබඳව මූලික දැනුම ලබා දුනි. |
| 03. | අභ්‍යන්තර විගණන පරිචය පිළිබඳ පුහුණු වැඩසටහන | 01 | 2023.03.24 | 13,000.00 | - | දේශීය | අභ්‍යන්තර විගණන කටයුතු සිදු වන ආකාරය පිළිබඳව දැනුම ලබාදුනි. |
| 04. | සංවර්ධන නිලධාරීන් සහ කළමනාකරණ සේවා නිලධාරීන් සඳහා විනය, ආකල්ප හා වෘත්තීය දැනුම ඉහළ නැංවීම සඳහා වූ පුහුණු වැඩසටහන | 38 | 2023.03.28 සිට 2023.03.31 දක්වා | 27,307.00 | - | දේශීය | නිලධාරීන්ගේ වෘත්තීය හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා දැනුම ලබාදීම සිදු කරන ලදී. |
| 05. | කාර්යාල කාර්ය සහායක නිලධාරීන් සඳහා විනය හා කාර්යාලීය ආචාර විධි පිළිබඳ පුහුණු වැඩසටහන | 26 | 2023.05.10 | 6155.00 | - | දේශීය | නිලධාරීන්ගේ කාර්යක්ෂමතාව වර්ධනය කිරීමට හා විනය ආකල්ප වර්ධනය කිරීම සඳහා අවශ්‍ය දැනුම ලබා දුනි. |
| 06. | Electronics කෙටිකාලීන පාඨමාලාව | 02 | 2023.05.21 දින සිට (පැය - 150) | 56,000.00 | - | දේශීය | ඉලෙක්ට්‍රොනික විද්‍යාව පිළිබඳව දැනුම ලබා දුනි. |
| 07. | පොත් බැඳුම්කරණ පාඨමාලාව | 01 | මාස 08 | 36,000.00 | - | දේශීය | පොත් බැඳුම් කටයුතු සිදුවන ආකාරය සම්බන්ධව දැනුම ලබා දුනි. |

| අ.අ | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය | | වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය) | නිමැනුම / ලබාගත් දැනුම* |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය (රුපියල්) | විදේශීය (ඇ.එ.ජ.ඩොලර් / පවුම්) | | |
| 09. | ප්‍රවාහන කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන | 01 | 2023.06.20 | 6000.00 | - | දේශීය | වාහන නඩත්තුව සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු පියවර, වාහන නඩත්තුව හා අලුත්වැඩියාව සම්බන්ධයෙන් ලිපිගොනු නඩත්තු කළ යුතු ආකාරය සම්බන්ධයෙන් දැනුමක් ලබා දුනි. |
| 10. | ආයතනික කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන | 04 | 2023.06.27 | 43,200.00 | - | දේශීය | ආයතනික කළමනාකරණය සම්බන්ධව මූලික දැනුම ලබා දීම සිදු කර ඇත. |
| 11. | සංවර්ධන නිලධාරීන් සහ කළමනාකරණ සේවා නිලධාරීන්ගේ වෘත්තීය සංවර්ධනය ඉහළ නැංවීම පිළිබඳ වැඩමුළුව | 01 | 2023.07.26 /27 | 9500.00 | - | දේශීය | නිලධාරීන්ගේ වෘත්තීය හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා දැනුම ලබාදීම සිදු කර ඇත. |
| 12. | කොන්ත්‍රාත් පරිපාලනය, ගෙවීම් කිරීමේ පටිපාටිය සහ කොන්ත්‍රාත් ලිපි ගොනු නඩත්තුව පිළිබඳ වැඩමුළුව | 02 | 2023.09.04 | 12,000.00 | - | දේශීය | ඵලදායී හා කාර්යක්ෂම කොන්ත්‍රාත් පටිපාටිය පිළිබඳ දැනුමක් ලබා දුනි. |
| 13. | දෙමළ භාෂා පුහුණු පාඨමාලාව | 01 | පැය 150 | 10,000.00 | - | දේශීය | භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කිරීමට අදාළ දැනුම ලබා දීම සිදු කර ඇත. |
| 14. | පරිසර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව | 01 | 2021.12.18 සිට (මාස 15) | 151,000.00 | - | දේශීය | පරිසර කළමනාකරණය පිළිබඳ දැනුම ලබාදීම සිදු කර ඇත. |

| අ.අ | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය | | වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය) | නිමැනුම / ලබාගත් දැනුම* |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය (රුපියල්) | විදේශීය (ඇ.එ.ජ.ඩොලර් / පවුම්) | | |
| 15. | පුද්ගලික ලිපි ගොනුවක් පවත්වාගෙනයාම පිළිබඳ පුහුණු වැඩසටහන | 01 | 2023.12.07 / 08 | 9500.00 | - | දේශීය | විධිමත් ලෙස පුද්ගලික ලිපිගොනුවක් පවත්වාගෙන යාම සම්බන්ධව දැනුම ලබා දුනි. |
| 16. | රජයේ වැටුප් ලේඛන පද්ධතිය | 05 | 2023.11.28 / 29 /30 | 90,000.00 | - | දේශීය | රජයේ වැටුප් පද්ධතිය පිළිබඳ මූලික දැනුම ලබා දීම සිදු කර ඇත. |
| 17. | විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිලධාරීන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන | 40 | 2023.07.12 | 75,500.00 | - | දේශීය | විගණන විමසුම් සඳහා පිළිතුරු සපයන ආකාරය සම්බන්ධව මූලික දැනුවත් කිරීමක් සිදුකර ඇත. |
| 18. | ව්‍යාපෘතිවල ගිණුම් පිළියෙල කිරීම පිළිබඳ නිලධාරීන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන | 40 | 2023.08.09 | 75,500.00 | - | දේශීය | ව්‍යාපෘතිවල ගිණුම් පිළියෙල කිරීම සම්බන්ධව මූලික දැනුවත් කිරීමක් සිදු කර ඇත. |
| 19. | තොරතුරු තාක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන - (පළමු වැඩසටහන) | 40 | 2023.08.11 | 126,600.00 | - | දේශීය | තොරතුරු තාක්ෂණය සම්බන්ධව මූලික දැනුම ලබා දීමක් සිදු කර ඇත. |
| 20. | අමාත්‍ය මණ්ඩල සංදේශ පිළියෙළ කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන | 40 | 2023.08.16 | 84,100.00 | - | දේශීය | අමාත්‍ය මණ්ඩල සංදේශ පිළියෙල කිරීම සම්බන්ධව මූලික දැනුම ලබා දීම සිදු කර ඇත. |
| 21. | තොරතුරු තාක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන - (දෙවනවැඩසටහන) | 50 | 2023.09.22 | 143,500.00 | - | දේශීය | තොරතුරු තාක්ෂණය පිළිබඳ මූලික දැනුම ලබාදීමක් සිදු කර ඇත. |

| අ.අ. | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය | | වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය) | නිමැනුම / ලබාගත් දැනුම* |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය (රුපියල්) | විදේශීය (ඇ.එ.ජ.ඩොලර් / පවුම්) | | |
| 22. | රියදුරු සහ කාර්යාල කාර්ය සහායක නිලධාරීන් සඳහා විනය සහ කාර්යාල ආචාර විධි පිළිබඳ පුහුණු වැඩසටහ | 50 | 2023.08.23 /24 | 117,500.00 | - | දේශීය | නිලධාරීන්ගේ කාර්යක්ෂමතාව හා කුසලතා වර්ධනය කිරීමට අවශ්‍ය දැනුම ලබා දීම සිදු කර ඇත. |
| 23. | ප්‍රසම්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන | 40 | 2023.11.28 /29 | 325,177.78 | - | දේශීය | ප්‍රසම්පාදනය පිළිබඳ මූලික දැනුම ලබා දීම සිදු කර ඇත. |
| 24. | රියදුරන් සඳහා විද්‍යුත් වාහන ඇතුළු තාක්ෂණික කරුණු පිළිබඳ හා ආතති කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන | 25 | 2023.12.09 | 120,473.00 | | දේශීය | විද්‍යුත් වාහන සම්බන්ධ නව ප්‍රවණතා හා තාක්ෂණික කරුණු පිළිබඳ දැනුම ලබා දීම සිදු කර ඇත. |
| 25. | "පළාත් පාලන හුවමාරු සහ සහයෝගිතා සම්මන්ත්‍රණය 2022" | 01 | 2022.11.26 සිට 2022.12.03 දක්වා | - | ඇ.එ.ජ.ඩොලර් 280 | විදේශීය | |
| 26. | "කොරියානු සමුහාණ්ඩුවේ පැවැත්වූ සෙමාවුල් 2022 වැඩසටහන සඳහා ශ්‍රී ලංකා රජයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පිරිසකගෙන් සමන්විත නියෝජිත කණ්ඩායමක් සහභාගී වීම" | 02 | 2022.12.18 සිට 2022.12.25 දක්වා | - | ඇ.එ.ජ.ඩොලර් 725 | විදේශීය | |
| 27. | "ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන් සඳහා පාකිස්ථානයේ පැවැත්වූ සති දෙකක විධායක පුහුණු වැඩසටහන" | 04 | 2023.02.06 සිට 2023.02.18 දක්වා | - | ඇ.එ.ජ.ඩොලර් 2,240 | විදේශීය | |

| අ.අ. | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය | | වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය) | නිමැනුම / ලබාගත් දැනුම* |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය (රුපියල්) | විදේශීය (ඇ.එ.ජ.ඩොලර් / පවුම්) | | |
| 28. | "සංවර්ධනය වෙමින් පවතින රටවල දිළිඳුකමට එරෙහි ගැටළු පිළිබඳ උසස් සම්මන්ත්‍රණය" | 01 | 2023.05.25 සිට 2023.06.14 දක්වා | - | ඇ.එ.ජ.ඩොලර් 375 | විදේශීය | |
| 29. | "සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා චක්‍රලේඛ ආර්ථිකය සහ තිරසාර සංවර්ධනය පිළිබඳ තාක්ෂණය පිළිබඳ පුහුණු පාඨමාලාව" | 01 | 2023.05.25 සිට 2023.06.07 දක්වා | - | ඇ.එ.ජ.ඩොලර් 375 ක් සහ පවුම් 75 ක් | විදේශීය | |
| 30. | "සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා පරිසර ආරක්ෂණය සහ තිරසාර සංවර්ධනය පිළිබඳ සම්මන්ත්‍රණය" | 02 | 2023.07.15 සිට 2023.08.05 දක්වා | - | ඇ.එ.ජ.ඩොලර් 750 ක් සහ පවුම් 150 | විදේශීය | |
| 31. | "ශ්‍රී ලංකාව සඳහා සංචාරක කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණය" | 04 | 2023.08.23 සිට 2023.09.05 දක්වා | - | ඇ.එ.ජ.ඩොලර් 1,500 ක් සහ පවුම් 300 ක් | විදේශීය | |
| 32. | "ශ්‍රී ලංකාව සඳහා කාර්මික උද්‍යාන ඉදිකිරීම සහ කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණය" | 03 | 2023.10.13 සිට 2023.10.26 දක්වා | - | ඇ.එ.ජ.ඩොලර් 1,125 ක් සහ පවුම් 225 ක් | විදේශීය | |

**6.4. ආයතනයේ කාර්යසාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේද යන්න කෙටියෙන් පැහැදිළි කරන්න.**

දැනට ආයතනයට අනුයුක්තව සිටින නිලධාරීන් සියලුදෙනා වෙතම විෂයානුබද්ධ හා ආයතනික කාර්යභාරය සම්බන්ධයෙන් පුහුණුවක් ලබාදීම මගින් එම නිලධාරියාගේ කාර්යන්ට නිවැරදි හා අවබෝධාත්මක කාර්යයක් ලබා ගැනීමට ඇති හැකියාව මත ආයතනයේ කාර්ය සාධනය ඉහළ නංවා ගැනීමට අවකාශ ලැබෙනු ඇත.

## 07. පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශන/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ. | - | - |
| 1.2 | රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ. | - | - |
| 1.3 | ව්‍යාපාර හා නිශ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම) | - | - | - |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම | - | - | - |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම | - | - | - |
| 1.6 | වෙනත් | - | - | - |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | - | - |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | - | - |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | - | - |
| 2.4 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ. | - | - |
| 2.5 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | - | - |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | - | - |
| 2.7 | ඉන්වෙන්ට්‍රිගත ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | - | - |
| 2.8 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | - | - |
| 2.9 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | - | - |
| 2.10 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | - | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **03** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මූ.රෙ 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතන තුළ බලතල පවරා දී තිබීම | අනුකූල වේ. | - | - |
| 3.2 | මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ. | - | - |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිළධාරින් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ. | - | - |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ. | - | - |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ. | - | - |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ. | - | - |
| 4.3 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ. | - | - |
| 4.4 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | - | - |
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කර ඇති දිනට සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ. | - | - |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මුදල් රෙගුලාසි 134 (2) ප්‍රකාරව විගණකාධිපතිගෙන් උපදෙස් ලබා ගැනීමෙන් පසුව වර්ෂය ආරම්භයේදී අභ්‍යන්තර විගණන වැඩසටහන පිළියෙල කරන ලදි. | අනුකූල වේ. | - | - |
| 6.2 | සියළු අභ්‍යන්තර විගණන වාර්තාවලට මසක් තුළ පිළිතුරු සපයා ඇත. | අනුකූල වේ. | - | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 6.3 | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (14) උප වගන්තිය ප්‍රකාරව සියළු අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. | අනුකූල වේ. | - | - |
| 6.4 | සියළු අභ්‍යන්තර විගණන වාර්තා මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. | අනුකූල වේ. | - | - |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටුව** | | | |
| 7.1 | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ 1/2019 අනුව වර්ෂය තුළ කළමනාකරණ විගණන කමිටු රැස්වීම් අවම වශයෙන් 04 ක් පවත්වා ඇත. | අනුකූල වේ. (IV වන රැස්වීම 2024.01.26 දින පැවැත්වීමට නියමිතය) | - | - |
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිළදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්රෝමලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | - | - |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිළධාරියෙකු පත්කර එම නිළධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර්ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | අනුකූල වේ. | - | - |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | - | - |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ. | - | - |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ. | - | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | දෛනික ධාවන සටහන් සහ සංචිත වාහන පිළිබඳ මාසික සාරාංශ සකස් කළ අතර නියමිත දිනයේ දී විගණකාධිපති වෙත භාර දෙන ලදී . | අනුකූල වේ. | - | - |
| 9.2 | අභාවිත වාහන එම තත්ත්වයට පත්වී සය මසක් ගතවීමට පෙර අපහරණය කරන ලදී . | අනුකූල වේ. | - | - |
| 9.3 | වාහන ලොග් පොත් යාවත්කාලීන කර පවත්වාගන්නා ලදී . | අනුකූල වේ. | - | - |
| 9.4 | සෑම රිය අනතුරක් සම්බන්ධයෙන් ම මු .රෙ.103,104,109 සහ 110 ප්‍රකාරව පියවර ගන්නා ලදී. | අනුකූල වේ. | - | - |
| 9.5 | 2016.12.29 දිනැති 30/2016 අංක දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන භාවිතය නැවත පරීක්ෂා කරන ලදී. | අනුකූල නොවේ. | කොවිඩ් 19 හා ඉන්ධන හිඟයද මිළද පසුගිය (කාලය තුළ ) වසර වල ඉහළ යාම නිසා ඉටුකිරීමට අපහසු වී ඇත. | මේ වන විට මිළ ඉහළ වුවද ඉන්ධන QR රහිතව සැපයිය හැකි බැවින් 2024 වර්ෂය තුළ ඉටුකිරීමට නියමිතය. |
| 9.6 | කල් බදු පදනම මත මිලදී ගත් වාහන වල ලොග් පොත් වල පූර්ණ අයිතිය කල්බදු කාලසීමාව අවසන් වීමෙන් පසු පවරන ලදී. | අනුකූල වේ. | - | - |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | - | - |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ. | - | - |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ. | - | - |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ. | - | - |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම | අනුකූල වේ. | - | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **12** | **රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්ට අනුකූල වීම | අනුකූල වේ. | - | - |
| 12.2 | හිගහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම | අනුකූල වේ. | - | - |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිගහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල නොවේ. | හිඟ ණය ශේෂ පහත පරිදි වේ<br>1. එම්.ටී.එස්.ගුනවංශ මයා හිඟ ණය ශේෂ - 143,200/- - නීතිපති දෙපාර්තමේන්තුවේ කොළඹ දිසා අධිකරණයේ DMR 4680/2019 අංකය යටතේ නඩු පවරා ඇත.<br>2. බී.ඒ.එස්.කේ.අමරසිංහ මයා - හිඟ ණය ශේෂ - රු.30,994/22 නීතිමය කටයුතු කරන ලෙස නීතිපති දෙපාර්තමේන්තුව වෙත දන්වා යවා ඇත.<br>3. H.P.S.S. පතිරණ මයා මුදල් අයකර ගැනීම සඳහා නෛතික ක්‍රියාමාර්ග ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුව වෙත දන්වා යැවීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී | නඩු තීන්දුවට අනුව ඉදිරි පියවර ගනු ලැබේ |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ. | - | - |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | - | - |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ. | - | - |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ. | - | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර නොතිබීම | අනුකූල වේ. | - | - |
| 14.4 | අග්‍රිම ගිණුම් ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ. | - | - |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබිම | - | - | - |
| 15.2 | රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදයමට බැර කර තිබීම. | - | - | - |
| 15.3 | මු.රෙ. 176 අනුව හිග ආදායම් වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබීම | - | - | - |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත සේවක සංඛ්‍යාව අනුව කාර්ය මණ්ඩලය වෙත ගෙවීම් සිදු කරන ලදී | අනුකූල වේ. | - | - |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියලුම නිලධාරීන් වෙත ලිඛිතව රාජකාරි ලැයිස්තුවක් නිකුත් කරන ලදී | අනුකූල වේ. | - | - |
| 16.3 | 2017.09.20 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ. | - | - |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැනගැනීමේ පනතෙහි රෙගුලාසි අනුව තොරතුරු නිලධාරියෙක් පත්කර ඇති අතර විධිමත් තොරතුරු ලේඛනයක් යාවත් කාලීන කර පවත්වාගෙන යනු ලැබේ | අනුකූල වේ. | - | - |
| 17.2 | වෙබ් අඩවිය මඟින් ආයතනික තොරතුරු මහජනතාව වෙත සපයා ඇති අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා චෝදනා පළකිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ. | - | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍යා තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 17.3 | තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන සහ 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල නොවේ. | 2023 වර්ෂයට අදාල වාර්තාව මේ වනවිට සකස් කරමින් පවතී. | තොරතුරු දැන ගැනීමේ පනතට අදාල වාර්තා වසරකට වරක් ඉදිරිපත් කිරීම මේ වනතෙක් සිදු කරනු ලැබූ අතර ඉදිරියේදී වසරකට දෙවතාවක් වන පරිදි වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | ආයතනය විසින් රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ චක්‍රලේඛ අංක 05 /2008 සහ 05/2008(1) ප්‍රකාරව පුරවැසි ප්‍රඥප්තිය/ පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය සකස් කර ක්‍රියාත්මක කරනු ලැබේ | අනුකූල වේ. | - | - |
| 18.2 | චක්‍රලේඛයෙහි 2.3 ඡේදය ප්‍රකාරව පුරවැසි ප්‍රඥප්තිය/ පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය සැකසීම සහ ක්‍රියාත්මක කිරීම නිරීක්ෂණය සහ ඇගයීම සඳහා ක්‍රමවේදයක් සකස්කර තිබේ | අනුකූල වේ. | - | - |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති අංක 02/2018 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි ඇමුණුම 02 අනුව මානව සම්පත් සැලැස්මක් සකස්කර තිබේ | අනුකූල වේ. | - | - |
| 19.2 | ඉහත මානව සම්පත් සැලැස්මෙහි කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙක් සඳහා ම වසරකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් සලසා තිබේ | අනුකූල වේ. | - | - |
| 19.3 | ඉහත චක්‍රලේඛයේ ඇමුණුම 01 පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්යසාධන අත්සන්කර තිබේ | අනුකූල වේ. | - | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කර ඔහු වෙත මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම සහ නිපුණතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීමේ වගකීම පවරන ලදී | අනුකූල නොවේ. | මානව සම්පත් සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ වගකීම ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන හා පුහුණු) වෙත පවරා තිබුණද ඒ සඳහා ලිඛිතව පත්වීම් ලිපියක් ලබාදී නොමැත. | ඉදිරියේදී මෙම වගකීම පවරන නිලධාරියා වෙත පත්වීමේ ලිපියක් ලබාදීමට කටයුතු කරනු ලැබේ. |
| **20** | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ. | - | - |

## 1.4. අමාත්‍යාංශයීය සංවිධාන සටහන

**ඇමුණුම 01**



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. PAF/B/MPA/02/2023/06

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2024 මැයි 30 දින

ලේකම්

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

**ශීර්ෂය 130 - රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

කේ.ආර්.ටී. මැණිකේ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත : අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } PAF/B/MPA/02/2023/06 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2024 මැයි 30 දින

ලේකම්

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

**ශීර්ෂය 130 - රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 130 - රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය නොවන වත්කම්

(අ) 2013 ජූලි 12 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව සමහර මූල්‍ය නොවන වත්කම් තක්සේරු නොකර විවිධ වටිනාකම් ආරෝපණය කරමින් ගිණුම්ගත කර තිබුණි. රු.100 ක ආරෝපිත නාමික වටිනාකමක් මත අයිතම් 3,812ක් ද තවත් වත්කම් ඒකක 221ක් වටිනාකමක් රහිතවද ගිණුම්ගත කර තිබුණි. තවද 2020 – 2023 කාලපරිච්ඡේදය තුළදී කාර්යාල උපකරණ අබලි ද්‍රව්‍ය ඒකක 5,697ක් අපහරණය කර තිබුණද සිගැස් දත්ත පද්ධතියට අවශ්‍ය ගැළපීම් සිදුකර නොතිබුණි.

(ආ) අමාත්‍යාංශය යටතේ පවතින නිල නිවාස 42ක වටිනාකම රු.746,550,000ක් සිගැස් දත්ත පද්ධතිය තුළ සංචාරක බංගලාවල ගොඩනැගිලි යටතේ ද දියතලාව ඒ හා බී සංචාරක බංගලා දෙකක වටිනාකම රු.14,601,000ක් බණ්ඩාරවෙල සංචාරක ගොඩනැගිලි ගිණුම යටතේ ද ගිණුම්ගත කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

(අ) 20.02.01.01 ආදායම් ශීර්ෂයට අයත් සම්පූර්ණ ගොඩනැගිලි මොනවාද යන්න හඳුනාගැනීම සඳහා වූ දත්ත පද්ධතිය සකස් කිරීම අවසන් කර නොතිබුණි.

(ආ) 2015 ජූලි 20 දිනැති අංක 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 4 (ආ) ඡේදය ප්‍රකාරව ආදායම් ගණන්දීමේ නිලධාරීන් විසින් හිඟ ආදායම් එකතු කර ගැනීමට කටයුතු කිරීම සහ අයවීමට ඇති හිඟ ආදායම් තව තවත් එකතුවීම වැළැක්වීම සඳහා ක්ෂණිකව පියවර ගතයුතු

වුවත්, ආයතන 32 කින් 2023 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ගොඩනැගිලි හිඟ කුලී ආදායම රු.332,724,629ක්වී තිබුණු අතර ඉන් රු. 198,688,576ක් 2020 දෙසැම්බර් 31 දිනට පෙර වර්ෂවල සිට අයවිය යුතුව පැවැතුණි. මෙම හිඟ කුලී මුදලින් සියයට 18ක් හෙවත් රු.59,142,348ක් මෙම අමාත්‍යාංශය යටතේ පාලනය වන රජයේ බංගලා, සංචාරක බංගලා සහ නිල නිවාසවලින් අයවිය යුතුව පැවතුණි.

(i) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඇමතිවරුන් සහ මන්ත්‍රීවරුන් 56 දෙනෙකුගෙන් රු.3,687,360ක හිඟ කුලී මුදලක් අයවිය යුතුව පැවතුන අතර එම ශේෂය තුළ 2015 වර්ෂයේ සිට පැවත එන රු.1,368,920ක් වූ ශේෂ 19ක්ද විය.

(ii) සමුළු නිවාස 35කින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවති මුදලින් රු.2,292,702ක් තවදුරටත් අයවිය යුතුව පැවතුණ අතර එයින් රු.2,025,801 ක් 2012 සිට 2022 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාළව තවදුරටත් අයනොවී පවතින හිඟ ශේෂ විය. තවද ජයවඩනගම නිවාසවල 2012 සිට 2021 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ පදිංචිව සිටි නිලධාරින් 18 දෙනෙකුගෙන් අයවිය යුතුව පැවති මුදලින් රු.8,790,490 ක් අයකර ගෙන නොතිබුණි.

(iii) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත වෙන්කර දී තිබූ බංගලා නිවාසයකින් 2012 වර්ෂයේ සිට අයවිය යුතු රු.28,567,470ක ශේෂයක් හා නිදන්ගත වකුගඩු රෝග වැළැක්වීමේ පර්යේෂණ ලේකම් කාර්යාලයට ලබා දී තිබූ නිවාසයකින් 2015 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාළව අයවිය යුතුව පැවති මුදලින් රු.4,798,387ක ශේෂයක් නිරවුල් කර නොතිබුණි.

## 2.2 වියදම් කළමනාකරණය

මුදල් රෙගුලාසි 50 (II) අනුව ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙල කළ යුතු බවට ගණන්දීමේ නිලධාරියා වගබලා ගත යුතු වුවත් පහත පරිදි ඉතිරි කිරීම් සිදුකර තිබුණි.

(අ) මූලධන වැය විෂයන් 16ක් සඳහා සලසාගෙන තිබුණු රු.112,450,000ක් වූ සමස්ත ඇස්තමේන්තු ප්‍රතිපාදනයම හා පුනරාවර්තන වැය විෂයන් 08ක් සඳහා සලසාගෙන තිබුණු රු.9,320,000ක සමස්ත ඇස්තමේන්තු ප්‍රතිපාදනයම ඉතිරිව තිබුණි.

(ආ) මූලධන වැය විෂයන් 17ක් සඳහා සලසාගෙන තිබුණු එකතුව රු.692,950,000ක් වූ ප්‍රතිපාදනවලින් සියයට 80කට වැඩියෙන් එනම් රු.553,273,789ක් ඉතිරිව තිබුණු අතර එම එක් එක් වැය විෂයන්ගේ ඉතිරිවීම් ප්‍රතිශතය සියයට 50ත් සියයට 94ත් අතර පරාසයක පැවතුණි.

(ඇ) පුනරාවර්තන වැය විෂයන් 09ක් සඳහා මුදල් රෙගුලාසි 66 යටතේ මාරුකර තිබූ එකතුව රු.116,265,000ක ප්‍රතිපාදනවලින් සියයට 25ත් සියයට 100ත් අතර පරාසයක වන පරිදි රු.45,665,861ක් ද, මූලධන වැය විෂයන් 03ක් සඳහා මාරුකර තිබූ එකතුව රු.4,539,000ක ප්‍රතිපාදනවලින් සියයට 35ත් සියයට 79ත් අතර පරාසයක වන පරිදි රු.2,265,722ක් ද උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි.

## 2.3 බැරකම් හා බැරකම්වලට එළඹීම

(අ) රාජ්‍ය පරිපාලන අංශයේ මූලධන වැය විෂයක් ඇතුළුව වැය විෂයන් 10කට අදාළව බැරකම් ප්‍රකාශයේ දක්වා තිබූ බැරකම් ප්‍රමාණය රු.206,179ක් වුවද එම බැරකම්වලට අදාළ 2024 ජනවාරි 01 සිට මාර්තු 31 දක්වා ගෙවීම් වවුචර්වල වියදම රු.1,018,145ක් වූ අතර ස්වදේශ කටයුතු අංශයේ 2024 ජනවාරි - මාර්තු ගෙවා තිබුණු රු.297,826 ක බැරකම්, බැරකම් ප්‍රකාශයේ දක්වා නොතිබුණි.

(ආ) 2020, 2021, 2022 සහ 2023 වර්ෂයන්ට අදාළ "පිබිදෙමු පොළොන්නරුව වැඩසටහන" වෙනුවෙන් පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ලබාදුන් බැරකම්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් ලබාදුන් ප්‍රතිපාදන සමඟ සැසඳීමේදී ආරම්භක ශේෂයන්හි පිළිවෙලින් රු.1,797,528,618ක්, රු.52,102,401ක්, (රු.533,242,982)ක් හා (රු.13,541,087,251)ක් වශයෙන් වෙනස්කම් පැවතුණි.

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 1.1 හා 1.2 වගන්ති | තනතුරු සඳහා නිවාස ඉදිකර, උපලේඛනගත කළ හැකි අතර 2003 ඔක්තෝම්බර් 17 දිනැති අංක 11/2003 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් මෙම අමාත්‍යාංශය සතුව උපලේඛනගත නිවාස නොමැති බවට දක්වා තිබුණි. එසේ |

වුවද ආයතන සංග්‍රහයට හා මෙම චක්‍රලේඛයට පටහැනිව අමාත්‍යවරයාගේ අනුමැතියෙන් පොදු නිවාස 06ක් හා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියෙන් පොදු නිවාස 16ක් උපලේඛනගත කර ලබාදී තිබුණි.

| | | |
|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | මුදල් රෙගුලාසි 104 | (i) අලාභහානිය සිදු වූ දිනයේ සිට තුන් මසක් ඇතුළත දී පූර්ණ වාර්තාව ඉදිරිපත් කළ යුතු වුවත් රාජ්‍ය පරිපාලන අංශයේ වාහන අනතුරු 02ක් සම්බන්ධයෙන් එම වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. |
| | | (ii) දිගින් දිගටම අමාත්‍ය කාර්යාලයේ භාණ්ඩ සමීක්ෂණයේදී ඌනතා ලෙස හඳුනාගෙන තිබුණු වත්කම් අයිතම් ඒකක 257 ක් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | මාස 06කට වරක් වාහනවල ඉන්ධන දහන පරීක්ෂාවන් සිදුකළ යුතු වුවත් අමාත්‍යාංශය සතු වාහනවල එම පරීක්ෂාව සිදු කර නොතිබුණි. |
| (ඈ) | 2022 සැප්තැම්බර් 09 දිනැති අංක 10/22 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | (i) චක්‍රලේඛය ප්‍රකාරව අබලි ද්‍රව්‍ය ඉවත් කර අදාළ ආදායම රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කළ යුතු වුවත් රාජ්‍ය පරිපාලන අංශයේ අපහරණ ද්‍රව්‍ය ලෙස හඳුනාගෙන තිබුණු ස්ථාවර වත්කම් ඒකක 2,832ක් ගජබා රෙජිමේන්තුවේ යුද හමුදා කඳවුරක් වෙත නොමිලේ ලබාදී තිබුණි. |
| | | (ii) එම අංශයේ වසරකට අධික කාලයක් භාවිතයෙන් ඉවත් කර තිබුණු මෝටර් රථයක් අපහරණය කර නොතිබුණි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1 කාර්යයන් ඉටු නොකිරීම

(අ) සීමා නිර්ණය සඳහා පළමු අමාත්‍ය මණ්ඩල තීරණය ලබාදී වසර දෙකක් හා දෙවන අමාත්‍ය මණ්ඩල තීරණය ලබාදී වසරක් ගතවී තිබුණි. 2021 සහ 2022 වර්ෂවල ඒ වෙනුවෙන් රු.7,760,180 ක් වැය කර තිබුණද සම්බන්ධීකරණ කමිටු අනුමැතිය සහිත සවිස්තරාත්මක අවසන් වාර්තාව අමාත්‍ය මණ්ඩලය වෙත 2023 සැප්තැම්බර් 18 දිනටත් ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) 2021 සැප්තැම්බර් 14 දින අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සීමානිර්ණ කමිටු සාමාජිකයින් සඳහා ගෙවීමක් කිරීම සුදුසු බව දක්වා තිබුණු අතර සහාය කාර්ය මණ්ඩල සඳහා ගෙවීම් කිරීම රාජ්‍ය ආයතනවල වගකීමක් බව දක්වා තිබුණි. එසේ වුවද කමිටු රැස්වීම් වාර වියදම් තුළ සහය කාර්ය මණ්ඩලය සඳහා රු.914,500 ක් ගෙවා තිබුණි.

### 3.2 විදේශ ආධාර ව්‍යාපෘති

(අ) යාපනයේ ඉන්කියුබේටර් (Incubator) සඳහා ව්‍යාපාරික මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක කිරීමට මූලධන වැය විෂයයක් යටතේ විදේශ ප්‍රදාන මගින් රු.250,000,000ක් ද, විදේශ මූල්‍යකරණ වැය විෂයය යටතේ රු.50,000,000ක් ද වශයෙන් එකතුව රු.300,000,000ක් වූ ප්‍රතිපාදන සලසාගෙන තිබුණද, සමාලෝචිත වර්ෂයේදී රු.490,955ක් පමණක් වැය කර තිබුණි. ඉකුත් වර්ෂයේදීද මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා සලසාගෙන තිබුණු රු.240,000,000ක් වූ සමස්ථ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ඉන්දීය රජය හා ශ්‍රී ලංකා රජය අතර වසර 03කට පෙර එළඹ තිබූ අවබෝධතා ගිවිසුම 2022 පෙබරවාරි 21 දිනෙන් අවසන්ව තිබුණ ද ව්‍යාපෘතිය නිම කර නොතිබුණි.

(ආ) මහ කොළඹ ජලය සහ අපජලය කළමනාකරණ වැඩිදියුණු කිරීමේ වැඩසටහන අදියර 03 ක්‍රියාත්මක කිරීම සඳහා මූලධන වැය විෂයය යටතේ යුරෝපීය ආයෝජන බැංකු (යු.ආ.බැ.) ණය මගින් රු.947,034,807ක් හා විදේශ මූල්‍යකරණ වැය විෂයය යටතේ රු.383,000,000ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණද ඉකුත් වර්ෂයේදී මෙන්ම සමාලෝචිත වර්ෂයේදී ද කොන්ත්‍රාත් ප්‍රදානයේ ප්‍රමාද හේතුවෙන් සලසාගෙන තිබුණු ප්‍රතිපාදන ඉතිරිව තිබුණි.

(ඇ) ග්‍රාමීය පාලම් ඉදිකිරීම් ව්‍යාපෘතියෙහි යටිතල පහසුකම් සංවර්ධනය සඳහා එක්සත් රාජධානියේ ණය යටතේ සලසාගෙන තිබුණු රු.200,000,000ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන් ඉතිරිව තිබුණි. කොන්ත්‍රාත්තුවේ පැවැති ගැටළු හේතුවෙන් කොන්ත්‍රාත්කරු වෙත රඳවුම් මුදල් නිදහස් නොකිරීම ඉතිරිවීමට හේතු වී තිබුණි.

(ඈ) අපද්‍රව්‍යවලට වටිනාකමක් එකතු කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ජර්මානු රජයේ ප්‍රදාන යටතේ රු.260,000,000ක්ද, විදේශ මූල්‍යකරණ වැය විෂයය යටතේ රු.15,000,000ක්ද වශයෙන් සලසාගෙන තිබූ රු.275,000,000ක් වූ සමස්ථ ප්‍රතිපාදනයම ඉතිරිව තිබුණ අතර අදාළ ඉදිකිරීම් සඳහා කොන්ත්‍රාත් ආයතන තෝරාගැනීමේ ක්‍රියාවලිය අවසන් කර නොතිබුණි.

**3.3 දේශීය අරමුදල් යෙදවූ ව්‍යාපෘති**

**(අ) ඉ-ග්‍රාම නිලධාරී ව්‍යාපෘතිය**

(i) ඉ-ග්‍රාම නිලධාරී ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේ සලසාගෙන තිබූ රු.1,500,000,000ක ප්‍රතිපාදනයෙන් රු.1,462,605,112ක් ඉතිරිව පැවතුන අතර සැලැසුම් කළ පරිදි ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් 2017 වර්ෂයේ සිටම දිගින් දිගට ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

(ii) ව්‍යාපෘතියට අදාළව ප්‍රචාරණ හා සන්නිවේදන අවශ්‍යතා සපුරා ගැනීමේ කාර්යය වැට් රහිතව රු.25,762,474කට සැලසිනේ ආයතනයට පවරා තිබුණද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 වගන්තිය ප්‍රකාරව ගිවිසුමකට එළඹ නොතිබුණි.

තවද, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 (1) වගන්තිය ප්‍රකාරව පිළිගත හැකි අත්තිකාරම් ගෙවීමේ සුරක්ෂිතයක් මත කොන්ත්‍රාත් මුදලින් සියයට 20ක උපරිමයක් දක්වා අත්තිකාරම් ගෙවිය හැකි වුවත්, ගෙවීමේ සුරක්ෂිතතාවයක් ඉදිරිපත් නොකර තිබියදීත් ගිවිසුම් මුදලින් සියයට 50 ක අත්තිකාරම් මුදලක් වැට් සහිතව රු.13,911,736ක් සැලසිනේ ආයතනයට ගෙවා තිබුණි.

(ආ) ගාල්ල දිස්ත්‍රික්කයේ ආසන 2000ක ශ්‍රවනාගාරයක් ඉදිකිරීම සඳහා 2019 – 2020 කාලපරිච්ඡේදය තුළ රු. 2,700,000,000 ප්‍රතිපාදන ලබා දී තිබුණ මෙම ව්‍යාපෘතිය සඳහා 2023 ජුනි 14 දින වන විට රු.718,599,241 ක් වැයකර ඉදිකිරීම් කටයුතු අතහැර දමා තිබුණි.

2022 පෙබරවාරි 15 දින කල් ඉකුත්වී තිබුණු රු.132,843,884 ක් වූ කාර්යසාධන බැඳුම්කරය දින දීර්ඝ කර ගැනීමට හෝ මුදල් කරගැනීමට කටයුතු කර නොතිබුණි. තවද කොන්ත්‍රාත්කරු

විසින් ලබාදුන් අත්තිකාරම් බැදුම්කරයෙහි 2022 ජනවාරි 29 දිනෙන් පසු දින දීර්ඝ කර නොතිබූ අතර මේ වනවිට ආපසු අයකර නොගත් අත්තිකාරම් මුදල රු. 475,358,225ක් විය.

### 3.4 වත්කම් කළමනාකරණය

(අ) රාජ්‍ය පරිපාලන අංශයේ සහ ස්වදේශ කටයුතු අංශය යටතේ පවතින සංචාරක බංගලා 46කට අයත් ඉඩම් පවරා ගැනීම සිදු කර නොතිබුණි.

(ආ) පළාත් සභා සහ පළාත් අංශය යටතේ ලියාපදිංචි කර තිබූ එහෙත් වාහන ලැයිස්තුවට ඇතුළත්ව නැති හා භෞතිකව නොපවතින වාහන 04ක වර්තමානයේ කවුරුන් භාරයේ පවතීද යන්න නිශ්චය කර ගැනීමට නොහැකිවී ඇති අතර, තංගල්ල ප්‍රාදේශීය සභාව පරිහරණය කරන කැබ් රථය එම සභාව වෙත විධිමත්ව පවරා දීමට හෝ නැවත ගෙන්වා ගැනීමට හෝ වසර 05ක පමණ කාලයක් පුරා කටයුතු කර නොතිබුණි.

### 3.5 කළමනාකරණ දුර්වලතා

(අ) 2022 දෙසැම්බර් 14 දිනැති අංක 2310/29 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ කාර්ය පටිපාටික රීතිවල XVIII පරිච්ඡේදයේ 247 ඡේදයේ සඳහන් අරමුණු ඉටුවන ආකාරයෙන් ඒකාබද්ධ හා දීපව්‍යාප්ත සේවාවල නිලධාරින්ගේ ස්ථානමාරු ක්‍රියාත්මක කර නොතිබුණි.

(i) අනිවාර්යය ස්ථාන මාරුවීම්වලට යටත් නිලධාරින් සඳහා ස්ථානමාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක නොකර ශ්‍රී ලංකා පරිපාලන සේවයේ අයදුම්පත් යොමුකර තිබූ නිලධාරින් 278කින් නිලධාරින් 78ක්, ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ අයදුම්පත් යොමුකර තිබූ නිලධාරින් 281කින් නිලධාරින් 92 ක් හා ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ අයදුම්පත් ඉදිරිපත් කළ නිලධාරින් 43 දෙනෙකුගෙන් 27 ක් පමණක් ස්ථාන මාරු කර තිබුණි.

(ii) 2022 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ සේවයට අයත් සේවා 07ක නිලධාරීන් 133,963කින් ස්ථාන මාරුවීම්වලට යටත් වන එකම සේවා ස්ථානයක වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කළ නිලධාරින් 14,323කගෙන් 2023 වර්ෂයේ ස්ථානමාරු සඳහා අයදුම්පත් ලැබී තිබුණ ද ස්ථාන මාරු 3,916ක් සඳහා පමණක් ස්ථානමාරු නියෝග ලබාදී තිබුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම්වරු පත් කිරීමේදී සළකා බලනු ලබන නිර්ණායක සම්බන්ධයෙන් 2022 නොවැම්බර් 29 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී දිසාපති තනතුරු සඳහා තෝරා ගැනීමේ නිර්ණායක නැවත සකස් කර ඉදිරිපත් කිරීමට කමිටුවක් පත් කළ යුතු බවට වූ තීරණය අනුව 2022 දෙසැම්බර් 02 දින නිලධාරින් තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත් කර තිබුණද නව නිර්ණායක සකස් කර අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) වර්ෂ 05ක් ඉක්ම වූ ස්ථානමාරු වී ගිය නිලධාරින්ගෙන් රු.526,658 ක් ද සේවය හැරගිය නිලධාරින්ගෙන් රු.702,464 ක් ද ණය ශේෂ අයවිය යුතුව පැවතුණි.

කේ.ආර්.ටී. මැණිකේ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත: අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව